
# දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 ඇසළ මස 12 වන ශනි දින ■ 2014 ජූලි මස 12 වැනි සෙනසුරාදා



2014



# ඇසළ පෙරහර මංගල්‍යය පැවැත්වෙන දින වකවානු

රාජ්‍ය වර්ෂ 2014 වැන්නේ ජූලි මස 27 වන ඉරු දින පෙරවරු 8.06ට වැනි දියකිඹුලට නියමිත පරිදි පේකොට තබන ලද "කප" රුක්ෂයේ කොටසක් ගෙන මහනුවර සිවු මහා දේවාලයන් ප්‍රධාන කොට ඇති සියලු දේවාලයන්හි ප්‍රාංගණයේ ඇසළ කප් සිටුවීමෙන් පෙරහර මංගල්‍යය ආරම්භ කිරීමට නියමිතය. අනතුරුව දේවාල අභ්‍යන්තර පෙරහර පහක් පැවැත්වේ. රාජ්‍ය වර්ෂ 2014ක්වූ අගෝස්තු මස 1 වෙනි දින සිට අගෝස්තු මස 5 වන දින දක්වා කුඹල් පෙරහරද, අගෝස්තු මස 6 වෙනි බදා දින සිට අගෝස්තු මස 10 වෙනි ඉරුදින දක්වා රන්දෝලි පෙරහරද පැවැත්වේ. රාජ්‍ය වර්ෂ 2014 අගෝස්තු මස 11 වන සඳු දින දහවල් පෙරහර පැවැත්වීමට නියමිතය. මෙවර ඇසළ පෙරහර මංගල්‍යය අලි ඇතුන්ගෙන් හා සාම්ප්‍රදායික උඩරට නර්තනාංග රැසකින් විචිත්‍රවත් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.





"මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."

# සැබෑ බෞද්ධයකු වීමට නම්....!

**ප**රම ආදරය, පරම හතුරා, පරම සුන්දර ආදී වචන දෙස බලන විට 'පරම' යලින් බෙදිය නොහැකි, උපරිම, අන්තිම යන අරුත් ගැබ්ව ඇති බව පැහැදිලිය. නවීන විද්‍යාවට අනුව පරමාණුව (පරම...අණුව) හඳුන්වා තම කළේද එසේමය.

එද නවීන විද්‍යාඥයන් තවදුරටත් නොබෙදිය හැකි කුඩාම අංශුව ලෙස හඳුනාගෙන සිටි 'ඇටම්' හෙවත් පරමාණුව විළඟ පරපුරේ විද්‍යාඥයන් විසින් තනි ඒකකයක් නොව ඉලෙක්ට්‍රෝන - ප්‍රෝටෝන - නියුට්‍රෝන යන පදාර්ථ සංයුත වී හට ගත් එකක් බව අනාවරණය කරන්නට යෙදුණි. ඊටත් සියවස් විසි පනකටත් පෙර පහළ වූ බුදුරජාණන් වහන්සේ මිනැම කුඩා සෙලයක් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා යන ක්ෂුද්‍රාණ්ඩකයන්ගෙන් සංයුත වී ඇති බව භෞතික උපකරණ භාවිත නොකොට දියුණු කළ නුවණින්ම දක ලෝකයාට අනාවරණය කොට තිබුණි.

එසේම බුදුරජාණන් වහන්සේට පෙර සිටි ශාස්තෘවරුන්, බුද්ධිමතුන් 'ආත්මය' නමින් හඳුන්වා දී තිබුණු තනි ඒකකයක් ලෙස පිළිගෙන තිබුණු 'පුද්ගල අනාත්මතාව' පිළිබඳ බුදු දහමට අනුව විස්තර වන ආකාරය කෙසේදැයි සියම් මහා නිකායේ කෝට්ටේ පාර්ශ්වයේ මහානායක රාජකීය පණ්ඩිත ආචාර්ය බෙල්ලන ශ්‍රී ඤාණවිමල නා හිමිපාණන් වහන්සේගෙන් විමසා බලමු.

''මේ ආත්මය නමින් හඳුන්වන ඒකකය තනි පදාර්ථයක් නොව රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන උපාදානස්කන්ධ පහ එකට මිශ්‍ර වී සංයුත වී උපන් දෙයක් බව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළා. ශක්ති පහක සංයුතියක්. මේ ආත්මය නමින් හඳුන්වන පුද්ගල අනාත්මතාව හේතු ප්‍රත්‍යයන් නිසා ඉපිද හේතු ප්‍රත්‍ය සිඳී යාම නිසා නැසී වන බවද පැහැදිලි කළා.

''මේ සසර ගමනේ දිගටම ගලා යන පුද්ගල අනාත්මතාව 'පඤ්ච උපාදාන ස්කන්ධ' නමින් හඳුන්වා එය හට ගන්නා ආකාරයත් නැසී වන ආකාරයත් උන්වහන්සේ ශ්‍රාවකයන්ට ඉගැන්නුවා. ඒ ඉගැන්වීමට අනුව සැරියුත් මහ රහතන් වහන්සේ මෙය තවදුරටත් විස්තර කළ අවස්ථාවක් දහමෙහි සඳහන් වෙනවා. 'මහන ලී කණු වරිච සිටුවා සිහින් කෝටු ඒවාට තබා වැල්වලින් බැඳ මැටි ගසා, එම බිත්ති මත කොළ සෙවිලි කළ පසු එම බිත්තිවලින් හා සෙවිල්ලෙන් වට කරන ලද අවකාශය 'ගෙය' නමින් හඳුන්වයි. ඇටැන්නි, මෙලෙසින්ම ඇට, නහර, මස් හා සම යන දෙයින් වට කැරුණු අවකාශය ශරීරයේ 'රූපය' යන නාමයෙන් ව්‍යවහාර කරයි.


''මේ ශරීරය දරන්නාගේ දෙඇස් හොඳින් පෙනුනත් පිටතින් යම්කිසි රූපයක් ඇසට ගෝචර නොවී නම් ඉලක්ක නොවී නම් ඔහුගේ සිතට යොමු වීමකුත් නොවී නම් එයින් ඇතිවිය හැකිව තිබූ චක්ඛු විඤ්ඤාණය ඇති නොවෙයි. දෙඇස් හොඳට පෙනීමත්, රූපයක් ඒ ඇසට යොමුවීමත් යන කාරණා දෙකම සම්පූර්ණ වුවත් සිත ඊට යොමු නුණොත් ඒ සිතේ විඤ්ඤාණය හට නොගනී. දෙඇස් හොඳට පෙනේ නම්, ඊට රූපයක් හමුවී නම්, සිතෙහි යොමු වීමත් සිදුවී නම් එයින් ඉපදිය හැකි විඤ්ඤාණය හෙවත් චක්ඛු විඤ්ඤාණය උපදී.

''එසේම කන හොඳට ඇසේ නම්, නාසය නිෂ්ක්‍රිය නොවී නම්, දිවට රස දනේ නම් මේ ඉන්ද්‍රිය තුනට ශබ්දයක්, ගන්ධයක්, රසයක් යොමු වුවහොත් ඊට සිතද යොමු නුණොත් ඉන් සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ උපදින්.

''ශරීරය පුරා පවතින, මොළයට සම්බන්ධව ගෙන යන ස්නායු ක්‍රියාත්මකව තිබේ නම් ඒවාට යමක් ස්පර්ශ වී නම් සිතද ඊට යොමුවී නම් එයින් ඉපදිය හැකි කාය විඤ්ඤාණය උපදී. මේ ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රිය පහ හෝ ඒවායෙන් මනසට පිවිසුණා වූ හා එයින් සිතේ ඇඳී ඇත්තා වූ සූක්ෂ්ම රූප හෝ සිතේ කලින් පහළ වූ සිතුවිල්ලක් හෝ භාවනාවෙන් උපදවා ගත් විමුක්තිය හෝ ලොව පුරා පැතිර පවතින විවිධ සම්මතයන් හෝ යන මේවායින් එකක් සිතට යොමු වීමෙන් මනෝ විඤ්ඤාණය උපදී. චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය හා මනෝ විඤ්ඤාණය උපදින හැටි දැන් පැහැදිලියි. මේ ඉන්ද්‍රිය හයෙන්ම ලැබුණු අරමුණු 'රූප' වශයෙන් සලකන බව මතක තබාගන්න ඕනෑ.

''විඤ්ඤාණය යනු මානසික ශක්ති විශේෂයක්. මේ කවර ඉන්ද්‍රියකට හෝ අරමුණු ගැටීම, ස්පර්ශ වීම නිසා උපදින විඤ්ඤාණය නමැති ශක්ති විශේෂයට තණ්හාව මිශ්‍ර වූ විට එය සිතින් තදින් අල්ලා ගැනීමක් සිදු වෙනවා.

26 පිටුවට ▶



''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



# පිරිතකින් පසු නිවසේ අමුතුම සිරියාවක් ඉස්මතු වන්නේ කොහොමද?



බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙන් ෂඩ් වර්ණ රශ්මි ධාරාවන් විහිදුනා බව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන්ය. මේ අතර මනුෂ්‍ය ශරීරයකින් මෙලෙස රශ්මි ධාරාවන් විහිදිය හැකිද? යන්න පවසමින් පසුගිය කාලවල ඇතැම්හු බුදු දහම කෙරෙහි අපහාස උපහාස එල්ල කිරීමට පවා ක්‍රියා කළ අන්දම රහසක් නොවේ. එහෙත් සැම මිනිසකුගේම ශරීරයෙන් ප්‍රභාවී ඇසට නොපෙනෙන රශ්මියක් විහිදෙන බව මේ වන විට විද්‍යාත්මකව සනාථ වී තිබේ. එමෙන්ම එම රශ්මි ධාරා ඡායාරූප ගත කළ හැකි සූක්ෂම කැමරා (Kirlian Camera) ද දැන් නිපදවා තිබේ. නමුත් සාමාන්‍ය අයකුගේ සිරුරින් නික්මෙන කිරණවලට වඩා බුද්ධ රශ්මියෙන් නික්මෙන රශ්මි ධාරාවේ සුවිශේෂත්වයක් ඇත.

බුදුරජාණන් වහන්සේගේ සිතිවිලි ඉතා පවිත්‍ර නිසා එම රශ්මි මාලාවද ප්‍රභාස්වරය. මේ රශ්මිය හිරු රැස් මෙන් පෙනු අයගේ සිරුරෙහි ස්පර්ශ වනු ඇත.


පිරිත් දේශනා කරන සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාගේ සිත් ද කරුණා මෛත්‍රියෙන් පිරී පවතින නිසා ඒ අවස්ථාවෙහි උන් වහන්සේලාගේ සිරුරින් නිකුත් වන රශ්මි ධාරාව ද පවිත්‍රය. ශාන්තිය ළඟ කරවන සුළුය. පිරිත් අසා සිටින අය ද ශ්‍රද්ධාවෙන් යුක්තව පිරිත් අසන විට ඔවුන්ගේ සිරුරින් ද එබඳු සන්සුන් රශ්මියක් නිකුත් වෙයි. මේ අයුරින් නිකුත් වන රශ්මි ධාරා අවට සැම තැනම පැතිර යනු ඇත.

තමන් තුළ ඇතිවන පිරිසිදු සිතුවිලි නිසාත් බැහැරින් සිරුරට විදින පිරිසුදු රශ්මි ධාරාවන් නිසාත් පිරිත් අසන්නට පැමිණි අය තුළ අපමණ සතුටක් ඇතිවෙයි. පිරිත් අවසාන වී එම උපකරණ ආදිය ඉවත් කර නිවස සාමාන්‍ය තත්ත්වයට පත් වූ පසුවත් දින කීපයකින් ඒ නිවසට පැමිණි පිටස්තර කෙනෙකුට වුවත් අමුතු හැඟීමක් ඇති වෙයි. ඒ අවට පරිසරයේ පැතිරුණු ශාන්ති රශ්මිය බහුලව දැනීම නිසාය. මෙය කාට වුව ප්‍රායෝගිකව අත්දැකිය හැකි දෙයකි. බොහෝ දෙනකු එය ප්‍රායෝගිකව හඳුන්වන්නේ අමුතුම සිරියාවන්න බවක් ලෙසිනි.

සැම පිරිතකදීම අනිවාර්ය වශයෙන් පැන් හා නූල් යොදා ගැනේ. පිරිසිදු නැවුම් බඳුනකට පෙරා ගත් සිසිල් ජලය දමා පිරිත් පැන් සඳහා සූදානම් කෙරේ. පිරිත් නූල, පිරිත් පොත මෙන්ම ගෞරවයෙන් භාවිතා කරන අනෙක් ද්‍රව්‍යය වේ.

පිරිත් දේශනාව අවසානයේ දී සූවාසූ දහසක් ධර්මස්කන්ධයෙහි ඇති බලයෙන් අප ලබන සුව සැනසුම සංකේතවත් කරමින් පිරිත් පැන් සහ පිරිත් නූල් භික්ෂූන් වහන්සේ ගිහියන් අතට පත් කරති. උන්වහන්සේලාගේ ආශිර්වාදය යටතේ ඒවා පැළඳ ගැනීමෙන් ජීවිතයේදී අත්විඳින්නට ලැබෙන සකල විධ දුක් ගැහැටවලින් මිදී ඉතා සංතෝෂීමත් . සැනසිලිදායක දිවි පෙවෙතකට නුසුතිරිමේ පැහැදිලි අවකාශයක් සියල්ලන් වෙතම නිසැක ලෙසම උදාවනු ඇත.

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''



# පිරිතෙන් නියම ඵල ලබන හැටි



අධුනම ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් පිරිත් විසුරුවා හැරීම බොහෝ විහාරස්ථානවල මෙන්ම නගරවල ද සිදු වන්නකි. ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන ආරම්භ වන්නේ සහ අවසන් වන්නේ ද පිරිත් දේශනාවලිනි. පිරිත මඟින් සැබෑවටම සෙතක් ශාන්තියක් සලසා ගන්නේ කෙසේද යන්න ගැන විමසා බලමු.

පිරිත් යනු 'පරිත්ත' යන පාලි වචනයේ සිංහල අරුතයි. මෙය සංස්කෘත භාෂාවෙන් හඳුන්වන්නේ 'පරිත්‍රාණ' ලෙසිනි. පරිත්ත යන මෙම පාලි වචනයෙන් විවරණය වන්නේ 'හාත්පසින්ම ආරක්ෂාව ගෙන දෙන සූත්‍ර' (පරි සමන්තතෝ තායති රක්ඛන්ති පරිත්තං) යන්නය.

අපේ බෞද්ධ සම්ප්‍රදාය තුළ ධර්ම දේශනා පැවැත්වීම සහ පිරිත් දේශනා පැවැත්වීම වශයෙන් සම්ප්‍රදායන් දෙකක් පවතී. බෞද්ධයන් ධර්ම ශ්‍රවණය තුළින් ධර්මාවබෝධය ලැබීමට බලාපොරොත්තු වන අතර පිරිත් ශ්‍රවණය තුළින් ඔවුන් අපේක්ෂා කරන්නේ ආරක්ෂාව, රැකවරණය සහ ශාන්තියයි.

[illegible] බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කිරීමේ දී 'මේවා පිරිත් සූත්‍ර' ලෙසින් හා 'මේවා අවබෝධය පිණිස වන සූත්‍ර' වශයෙන් වෙන්කොට දේශනා කළේ නැත. පසුකාලීනව සිදුවූ ධර්ම සංගායනාවලදී එයට සම්බන්ධ වූ භික්ෂූන් වහන්සේලා විසින් එම සූත්‍ර දේශනාවල අන්තර්ගතය සලකා බලා සෙත ශාන්තිය සැලසෙන හැකි යැයි උපකල්පනය කරන ලද සූත්‍ර වෙනම පොතකට ගොනු කරනු ලැබිණි. සතර බණවර සහිත පිරුවාණ පොත් වහන්සේ (චතුභාණවාර පාලි) නොහොත් කවුරුත් දන්නා පරිදි 'පිරිත් පොත' වශයෙන් හඳුන්වන්නේ එයයි.

පිරිත් දේශනාවන් මඟින් සාමාන්‍ය ජනතාව අපේක්ෂා කරන කාරණා දෙකක් තිබේ.

1 විපත්ති දුරු කර ගැනීම (විපත්තිපටිබාහාය)

2 සම්පත් උදා කර ගැනීම (සබ්බසම්පත්ති සිද්ධියා)

බුදු දහමේ දක්වෙන පරිදි සාමාන්‍ය ජනයා විපත්ති තුනකින් පෙළෙති. ඒවා නම් දුක්ඛ, රෝග සහ භයයි. යමකුට ඇතිවන කායික හා මානසික පීඩාවන් දුක්ඛය. රෝග යනු කායිකව හා මානසිකව හට ගන්නා ආබාධයි.

සිතේ ඇතිවන සැලෙන ස්වභාවය භය වශයෙන් දක්වේ.

යම් කෙනෙකුට මේ කියූ කාරණා තුනට මුහුණ දෙන්නට සිදු වුවහොත් එය එම පුද්ගලයාට වන විපතකි. මේ කාරණා තුනෙන් තොරව ජීවත් වන්නට හැකියාව ලැබෙන්නේ නම් එය සැපතකි.

විපතින් මිදී සැපත උදාකර ගැනීම පිණිස බෞද්ධයන් අනුගමනය කරන ප්‍රධාන ශාන්තිකර ප්‍රතිපදාවක් වන්නේ පිරිත් දේශනා කරවා ගැනීමයි.

නමුත් මෙකල බොහෝ බෞද්ධයන් පිරිත් දේශනාවන් පවත්වන ආකාරය තුළින් හා පිරිත් ශ්‍රවණය කිරීම තුළින් අපේක්ෂිත බලාපොරොත්තු ඉෂ්ට කර ගත හැකි දැයි විමසා බැලීම වටී.



අතීතයේ බෞද්ධ ජනතාව පිරිත් ශ්‍රවණය කළේ ඒ සඳහාම පේවීම තුළිනි. පේවෙනවා යනු කායිකව හා මානසිකව ඒ සඳහා සූදානම් වීම හා කැපවීමය. පිරිත කෙරෙහි තදබල විශ්වාසයෙන් ගත ද පිරිසිදු කරගෙන පන්සිල් හා පිහිටා ප්‍රතිපත්තිමය රාමුවක හිඳ එම පිරිත් ආශිර්වාදය ලබා ගන්නට ඔවුහු කැපවූහ. සැබවින්ම පිරිතකින් ආශිර්වාද ලැබෙන්නේ ශ්‍රාවකයා ධර්මානුධර්ම ප්‍රතිපන්න වූ තරමටය. එනම් දහමට අනුවම ජීවත් වන තරමටය.

මෙකල බොහෝ දෙනා පිරිත් දේශනා කරවා ගන්නේ තමන්ට ශාන්තියක් උදාකර ගන්නාවාට වඩා ගේ දොර ආරක්ෂා කර ගන්නට බව පෙනේ. අලුතින් නිවසක් තනවා ගත් සැනින් පිරිත් දේශනා කරවා ගැනීමට බොහෝ දෙනා උත්සුක වන්නේ මේ නිසාය. එහෙත් මධ්‍යම රාත්‍රිය ඉකුත් වූ පසු ස්වාමීන් වහන්සේලාට පිරිත් කියන්නට සිදුවන්නේ , බොහෝ විටම නිවසේ බිත්තිවලට හා දොර ජනෙල් ආදියටය. හේතුව පිරිත් ගෙදර නිවැසියන් මෙන්ම පිරිත් අහන්නට ආ අමුත්තන්ද තැන්තැන්වල වැටී නිදි කිරා වැටෙන නිසාය. මෙසේ පිරිත් සජ්ඣායනා කරවා ගැනීම තුළ ශ්‍රාවකයාට ලැබෙන ආශිර්වාදයක් නැත. පිරිතකින් ගුණ ලැබෙන්නේ පිරිත හොඳින් ශ්‍රවණය කරන තරමටය.

මෙකල බොහෝ දෙනා පිරිත් දේශනා පැවැත්වීම කෙරෙහි යොමු වන්නේ තමන්ට අසන්නට නොව අනුන්ට අසවන්නටය. හන්දියක් හන්දියක් ගානේ ශබ්ද විකාශන යන්ත්‍රවලින් මහ හඬින් පිරිත් දේශනා විසුරු හරින්නේ මේ නිසාය. මේ අනුව බොහෝ දෙනා කරන්නේ තමන් වුවමනාවෙන් පිරිත් ඇසීම නොව. වෙන වැඩක යෙදෙන අතරේ ඉබේම තමාට සහ අනුන්ට පිරිත් ඇසෙන්නට සැලැස්වීමය. නිවසේ තිබෙන ගුවන් විදුලි යන්ත්‍රයේ හෝ රූපවාහිනී යන්ත්‍රයේ පිරිත් දේශනා ක්‍රියාත්මක කොට සමහරු කුස්සියේ කෑම පිසිති. මස් මාළු කපති. ගේ දොර අස්පස් කරති. මේ අතර පිරිතුත් ඔහේ විකාශය වෙයි.

පිරිත තුළින් තමන්ගේ ආර්ථික දියුණුව සලසා ගත හැකි වේදැයි ඇතැම් ගුවන් විදුලි මාධ්‍ය ජනතාවට කා වද්දනු පෙනේ. එනිසාම වෙළෙඳ ව්‍යාපාරික ආයතන සිය දවසේ කටයුතු ආරම්භ කරන්නේ ගුවන් විදුලි පිරිත් දේශනා වාදනය වන්නට සැලැස්වීමෙනි. තැබෑරුම් හිමිකරු , මස් කඩ මුදලාලි වැනි අයත් මෙසේ පිරිත් දේශනා මගින් සිය ව්‍යාපාරයේ වැඩ ආරම්භ කරන්නේ තමන්ගේ ව්‍යාපාරයෙහි වැඩිදියුණුව මුල් කරගෙනය. ඒ අනුව වැඩි මිනිසුන් ප්‍රමාණයක් මත්පැන් බීමට පෙළඹුණහොත් තැබෑරුම්කරුට වාසිය. වැඩි සතුන් ප්‍රමාණයක් ඝාතනය වූ විට සහ ඒ මස් අලෙවි වූ විට මස් කඩ මුදලාලිට වාසිය. ධර්මානුකූලව බලන කල සැබවින්ම ඔවුන්ගේ එම අපේක්ෂාවන් ධාර්මික නොවන බව වැටහෙනු ඇත. එවැනි අයට පිරිත් දේශනාවක් මගින් තමන් අපේක්ෂා කරන කාර්යයන් ඉටුවේ යැයි විශ්වාස කළ නොහැකිය. නමුත් එක මොහොතකට හෝ බුදු බණ පදයක් ශ්‍රවණය කරන්නට ලැබීම එබඳු තැනැත්තන්ගේ වුව සිත් සැනසීමට උපකාරී වනු ඇත.

පිරිතකින් මුලිකවම අපේක්ෂා කරනුයේ සිත සුවපත් කිරීමය. පිරිත් දේශනාවන් මගින් ශ්‍රද්ධාවකින් ශ්‍රවණය කරන තැනැත්තාගේ සිතිවිලි පිරිසිදු වේ. පිරිසිදු සිතිවිලි සහිත සිත නිරෝගී සිතකි. ඒ නිරෝගී සිත ශරීරගත ලේ ධාතුව පිරිසිදු කරන්නට බෙහෙවින්ම උපකාරී වෙයි. ලේ ධාතුව පිරිසිදු වන්නට වන්නට ප්‍රතිශක්තිකරණය වැඩිවේ. ප්‍රතිශක්තිකරණය වැඩිවීම තුළ කායිකව වැළඳී ඇති රෝගාබාධ සුවවේ. බුදු රදුන් මහා කාශ්‍යප මහ තෙරුන් , මුගලන් මහ තෙරුන් වැනි උතුමන් ගිලන් වූ අවස්ථාවල බොජ්ඣංග සූත්‍රය දේශනා කරවා ගෙන කායිකව සුවය ලැබූ අයුරු 'පිරිත් පොත' තුළම සඳහන් වේ. ඒ අනුව පිරිත් දේශනාවන් සිහි කිරීමේ දී එයින් නිසි ඵල ලබන්නට නම් ඒවා සීලයෙහි පිහිටා මහත් සැදැහැයෙන් ඇසිය යුතුම බව අවධාරණය කරවමු. පිරිත් දේශනාවක් වාදනය තුළ තම නිවස පුරා යහපත් ශබ්ද තරංග නිතර වෙනවා යැයි විශ්වාසයක් ද පවතියි. එය සැබෑවකි. එහෙත් ඒවායෙන් ප්‍රතිලාභ ලබන්නේ ඒවා ශ්‍රවණය කරන අයයි. බොහෝ දෙනා එසේ පිරිත් වාදනය කිරීම තුළින් සිදු කරන්නේ, අනුන්ගේ හරස් බැලීමය. එබැවින් අප උත්සාහ කළ යුත්තේ අවම තරමින් දිනකට එක් වතාවක් හෝ පිරිත් පොතෙන් සූත්‍රයක් මුවින් වදින විට සජ්ඣායනා කර ආශිර්වාදය ලබාගැනීමටය. එනිසා සෑම බෞද්ධ නිවසකම පිරිත් පොතක් තිබිය යුතු වන අතර එමගින් අලුත් සූත්‍රයක් ඉගෙනීමටත් සජ්ඣායනා කිරීමටත් එතුළින් ආශිර්වාදය සලසා ගැනීමටත් අවස්ථාව උදාකර ගත හැකිය.

**පූජ්‍ය තලල්ලේ චන්ද්‍රකිත්ති හිමි**

අභිධර්මයේ පරමාර්ථ සතර විස්තර වන තැන, චිත්තය, චෛතසිකය, රූපය, නිර්වාණය යන සතරෙහි මුලට යෙදී ඇති චිත්තය, දැනීම, සිත, මනස, මන වශයෙන්ද බොහෝ තන්හි විස්තර වේ. මේ එකිනෙකෙහි සමානාර්ථයක් මෙන්ම, සමාන නොවන බවක්ද දක්නා ලැබෙයි. සිත යනු එකක් වුවද අභිධර්මයෙහි එය එක් ක්‍රමයකින් අසූ නවයකටද, තවත් ක්‍රමයකින් එකසිය විසි එකකටද බෙද දක්වයි. සිත, කාමාවචර සිත, රූපාවචර සිත, අරූපාවචර සිත, ලෝකෝත්තර සිත කියා භූමි වශයෙන්ද සතරෙකි. ඉන් කාමාවචර සිත් පනස් හතරෙකි. ඒ අකුසල් සිත් දොළසක්ද, අහේතුක සිත් දහ අටක්ද, කාමාවචර ශෝභන සිත් විසි හතරක්ද වශයෙනි.

චිත්තය යනු දැනීමය. ඇස, කන, නාසය, දිව, කය යන පසිඳුරන් සහ සිත නිසා ඒ දැනීම ඇති වේ. ඒවාට දැනෙන දේ ආරම්මණ වශයෙන් සැලකේ.

"පභස්සරමිදං භික්ඛවේ චිත්තං තංචඛො ආගන්තුකේහි උපක්කිලේසේහි උපක්කිලිට්ඨං."

ප්‍රභාස්වර වූ පැහැදිලි වූ සිත ආගන්තුක කෙලෙස්වලින් කිලිටි වෙයි. සිතේ ඇති කෙලෙස් ක්‍රම ක්‍රමයෙන් දුරු කොට ප්‍රහීණ කිරීම ධ්‍යාන ආදියෙන් සිදු කළ හැකිය. එමගින් සිත සන්සුන් කරගෙන සැහැල්ලු කරගැනීමට හැකිවේ. භාවනාවෙන් තොරවූ සිත රාගයෙන් රත් වෙයි. ධම්ම පදයේ චිත්ත වග්ගයේ විස්තර වන ආකාරයට නුවණැති තැනැත්තා, චපල, සැලෙන සිත, රැක ගැනීම නොහැකි සිත, වැළැක්වීම අපහසු සිත, ඊතලය ඇද හැර කෙලින් කොට සාදන්නාක් මෙන් ඇද හැර සෘජු කරයි. එමගින් රූපයක් නැති ගුහාවක් ඇසුරු කළ දුරගම, අපහසු කැමැති කැමැති අරමුණුවල යොමු වන සිත රැක ගත යුත්තේය. එසේ රැක ගත් සිත සැපත, සතුට ළඟා කර දෙයි.


රාගයෙන් තෙත් නොවූ, ද්වේශයෙන් දූෂ්‍ය නොවූ, කෙලෙසුන්ගෙන් මිදුණු තැනැත්තාට සතර බියක් නැත. වැරදි ලෙස පිහිටුවා ගත් සිතින් තමාට දරුණු අනර්ථයක්ම සිදුවෙයි. මනා ලෙස පිහිටුවා ගත් සිත තමා උසස් තත්වයට පමුණුවයි. මනසට තරම් බලවත් ශක්තියක් වෙනත් කිසිවකට නැත. ලොව නරක පිරුණු ගතිවලට සිතම මුල් වෙයි. චිත්තය හෙවත් සිත නොමැතිව ලෝකය නොපවතී. සිත මුල් කොට උපදින අයහපත්, වැරදි සිතිවිලිවලින් තමාට මෙන්ම, අනුන්ටද අයහපතම සිදුවෙයි. යහපත් සිතිවිලි ඇති තැනැත්තාගෙන් තමාටත්, අනුන්ටත් යහපතක්ම සිදුවෙයි. නොනැවතී ගලා යන දිය දහරක් සේ සිත තුළ හටගත් සිතිවිලි ධාරා ගලා යයි. සිතට නොනැවතී ගලා එන සිතිවිලි ධාරා ඔස්සේ දිගින් දිගට නොගොස් සිත රැක ගැනීමට යත්න දරීම, තම සිත සුරක්ෂිත කළ යුතුව ඇත. ගලා එන අරමුණු නවත්වා සිත එකඟතාවට පත්කර ගත් විට නුවණ දියුණු වී ජීවිතයේ ඇති අනිත්‍යතාවය මැනවින් අවබෝධ කර ගැනීමට හැකි වේ. සිත දියුණු වූ විට, පිරිසිදු වූ විට ලෝභ, ද්වේශ, මෝහ ආදී පාපී සිතිවිලිවලින් මිදී කෙලෙස් දුරුකොට කුසල් වශී කරගෙන නිවන් මග විවර කර ගත හැකිය.

චිත්ත ඒකාග්‍රතාවය ඇතිකර ගැනීම තුළින් සත්‍යය හඳුනා ගැනීම පහසුය. එවිට සිතේ ගැටලු පහගත බව දුරු වී යයි. කුෂ්ඨයෙන්, තණ්හාවෙන් ඉවත් වීමට එය මහත් රුකුලක් වෙයි. සිත නිවැරදි සමාධියට පත්කර ගැනීමෙන් හරි දක්ම, නිවැරදි සිතිවිලි, නිවැරදි වචන, නිවැරදි ක්‍රියාවන්, නිවැරදි ජීවනෝපාය, නිවැරදි වෑයම, නිවැරදි සිහිය ඇති කර ගැනීම පහසු වෙයි. මානසික සාමය, විශ්වාසය ඉන් අත්කර ගත හැකිය. මනස ශක්තිමත් කරගත හැකිය. වර්තමාන සමාජයෙහි බාල, තරුණ, මහලු සැමදෙනාම සිතේ නොසන්සුන් ගතියෙන්, අවිවේකයෙන්, පීඩාවෙන් ගමනකින් යුතුව ජීවත් වන බැවින් ඒ කාට වුවද චිත්තානුපස්සනාව වැනි භාවනාවක යෙදී සිත නිශ්චල කර ගැනීම අනිවාර්යෙන්ම වැදගත් වන්නේය. මිනිස් සිත නිශ්චල කර ගැනීමට එය ඉතා සුභ ප්‍රතිකර්මයක් වන්නේය.


දීඝ නිකායේ දෙවිසිවැනි සූත්‍රය වන මහා සතිපට්ඨාන සූත්‍රයේ වේදනානුපස්සනාවට පසුව සිතුම් නොකිලිටි සිතින් දකින නම් වූ චිත්තානුපස්සනාව වැඩීම නිවනට ඇති මගක් වශයෙන් දක්වේ. සතර සතිපට්ඨානයෙහි එන මෙම චිත්තානුපස්සනාව වැඩීමෙන් සතර බිය දුරු කර ගත හැකිය. සතර බිය දක්නා තැනැත්තා රාගය සහිත සිත, රාග සහිත ඇලීම් සහිත සිතකැයි මනාව දැන ගනී. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතකැයිද මනාව දන ගනී. මෝහ සහිත සිත මෝහ සහිත සිතකැයිද නොමුලා සිත මෝහ රහිත සිතකැයිද මනාව දනගනී. සංක්ෂිප්ත සිත (හැකිළුණු සිත) සංක්ෂිප්ත සිතකැයිද දන්නේය. උද්දච්ච සහගත සිත හෙවත් වික්ෂිප්ත සිත, වික්ෂිප්ත සිතකැයි දන්නේය. රූපාවචර, අරූපාවචර කුසල් සිත අති උතුම් සිතකැයි දන්නේය. කාමාවචර උතුම් නොවූ සිත (කාමාවචර) උතුම් නොවූ සිතකැයි මනාව දනී. අනුත්තර සිත අනුත්තර සිතකැයි දනී. සමාධි ගත සිත, සමාහිත සිතකැයි දනී. අසමාහිත සිත අසමාහිත සිතකැයි දන්නේය. මෙසේ තමාගේ සහ පෙර තැනැත්තන්ගේ සිතෙහි චිත්තානුපස්සී වෙමින, සිතුම්හි ඇතිවීම හා නැතිවීම නැවත නැවත හේතුඵල වශයෙන් අනිත්‍ය අවබෝධ ලක්ෂණ වශයෙන් සිතුම්හි ඇතිවීම හා නැතිවීම විදර්ශනා සිතින් භාවනානුයෝගීව දකිමින් සතර බිය දුරුකර ගැනීමට හේතු වන්නේය. වරෙන සිත් හැලෙන්නේත්, වරෙන සිත් හැලෙන්නේත් හේතුවන කරුණු නොයෙක් අයුරින් නැවත නැවත බලමින් චිත්තානුපස්සීව වෙසෙසම සිතුම් පමණක් ඇතැයිද, පුද්ගලයකු නැතැයිද යන හොඳ අවබෝධ සිහි පහළ වෙයි.

තණ්හා දිට්ඨීයෙන් තොරව මිථ්‍යා දෘෂ්ටි ආශාවෙන් ඇල්ලා නොගෙන, චිත්තානුපස්සනාවෙහි වෙසෙසමින්, භාවනා වඩන සිතක් ඇත්තෙකුට සතර බිය ඇති නොවේ. නිතර බණ දහම්, භාවනාවෙහි යෙදෙමින්, පින් හා කුසල කර්මයන් රැස්කර ගන්නා පුද්ගලයාට මරණයේදී ලබා ගතහොත් විඳින භවය ගැන බියක් ඇතිකර ගත යුතු නොවේ.

ශාන්ති කළුවිටිගොඩ



# ඔබේ සිත සැලෙන සුලුද?




# මේ වස්සාන සමයයි

ශාසනික වශයෙන් වැදගත් වන සිදුවීම් බොහොමයක් සිදුවී ඇති උතුම් පොහෝ දිනයක් වශයෙන් ඇසළ පුර පසළොස්වක පොහෝ දිනය හඳුන්වා දිය හැකිය. බුදුරජාණන් වහන්සේගේ නියමය පරිදි භික්ෂූන් වහන්සේලා වස්සූපනායික සික්ඛා පදයට අනුව වස් විසීම ආරම්භ කරනු ලබන්නේද ඇසළ පුර පසළොස්වක පොහෝ දිනය මුල්කරගෙනය. එම නිසා එවන් දිනයක වස් විසීමේ මූලාරම්භය සිදුවූයේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය. සෑම අවුරුද්දක්ම මාස හතර බැගින් සෘතු වශයෙන් තුනකි. හේමන්ත සෘතුව, ගිම්හාන සෘතුව, වස්සාන සෘතුව වශයෙනි. හේමන්ත සෘතුවේ අධික සීතලත්, ගිම්හාන සෘතුවේ අධික උෂ්ණත්වයත්, වස්සාන සෘතුවේ අධික වර්ෂාවත්ද පැවතීම ස්වභාවිකව සිදුවන්නකි. ඇසළ මාසයෙන් වස්සාන සෘතුව ආරම්භ වෙයි. මේ කාලය දඹදිවට අධික වර්ෂාපතනයක් පවතියි. දින හතක් නොනවත්වා වැසි පැවැත්මත් (සත්තාහ වද්දලිකා), සීත සුළඟ හා අඳුරු කාලගුණයක් පැවැත්මත් (සීතවාත දුද්දිනි) එහි විශේෂ ලක්ෂණ වෙයි. මේ කාලයෙහි අනාගමික ශ්‍රමණ පිරිස් චාරිකා කිරීමෙන් වැළකී එක් තැනකට වී වාසය කළහ. කුරුලු, සිවුපා ආදී සතුන් පවා තම ගුහාවලට හෝ කූඩුවලට වී සිටීම සිරිතකි. එහෙත් ශාක්‍යපුත්‍ර ශ්‍රමණ පිරිස **"මහණෙනි බොහෝ දෙනාගේ හිතසුව පිණිස, සැපය පිණිස ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ධර්ම චාරිකාවේ යෙදෙන්න"** යැයි බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද අවවාදය අනුව යමින් අධික වර්ෂාව පවා නොතකා දියඹත් වූ සිවුරුද සහිතව මෙම වර්ෂා කාලයෙහිද ධර්ම චාරිකාවේ නිරත වූහ. මෙලෙස චාරිකා කිරීම බොහෝ දෙනාගේ නොසතුටට හේතු විය. "මේ ශාක්‍යපුත්‍ර ශ්‍රමණයෝ හේමන්තයෙහිද, ගිම්හානයෙහිද, වස්සානයෙහිද, නිල් තණකොළ මඩිමින්, එකින්ද්‍රිය ජීවිත පෙළමින්, බොහෝ කුඩා සතුන් ජීවිතක්ෂයට පත් කරවමින් කවර කරුණක් නිසා මෙලෙස චාරිකාවේ හැසිරෙන්නාහුදැයි" ජනතාව භික්ෂූන් වහන්සේලාට අවමන් කෙරෙති, නින්දා කෙරෙති, දොස් කියති. එපමණක්ද නොව භික්ෂූන් වහන්සේලාගේ මේ ක්‍රියාකලාපයට එරෙහිව, එට විරෝධය දක්වමින්, විදි බැස මවුලු උද්ඝෝෂණය කරන්නටද වූහ.



භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියා කලාපයට එරෙහිව මෙලෙස ජනතා විරෝධය සිදුවන අවස්ථාව වන විට බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ විසූහ. චාරිකාවේ නිරත භික්ෂූන් වහන්සේලාට මුහුණ දීමට සිදුව ඇති තත්ත්වය පිළිබඳව භික්ෂූන් වහන්සේලා වෙතින්ම කරුණු දැනගත් බුදුපියාණන් වහන්සේ සාවධානව ජනතා හඬට කන් යොමු කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ, **"අනුජානාමි භික්ඛවේ වස්සානේ වස්සං උපගන්තුං"** යනුවෙන් මහණෙනි, මම වස්සාන සෘතුවෙහි වස් එළඹෙන්නට අනුදනිමි යි, භික්ෂූන් ඇමතූ සේක. මෙලෙස වස්සූපනායික සික්ඛාපදය පැනවීමත් සමග භික්ෂූන් වහන්සේලාගේ වස්විසීම ආරම්භ විය.

වස්සූපනායික සික්ඛාපදය අනුව උපසපන් සෑම භික්ෂුවක්ම වස් එළඹිය යුතුය. **"පෙරවස් එළඹීම හා පසුවස් එළඹීම"** යනුවෙන් වස් විසීම් දෙකකි. ඇසළ පුන් පොහෝ දිනයෙහි උපෝසථාගාරයකට රැස්වන උපසපන් භික්ෂූහු පාරිශුද්ධිය ප්‍රකාශ කොට, ප්‍රාතිමෝක්ෂය දේශනා කරති. පසු දින සිට වහන්සේලා වස් වසන ස්ථානවලට වැඩම කොට, තෙරුවන් හැමදීම් ආදී කාර්යයන් සිදු කිරීමෙන් පසුව මේ ස්ථානයෙහිම මේ තෙමස වස් එළඹෙමියි. **(ඉමස්මිං විහාරේ ඉමං තේමාසං වස්සං උපේමි. ඉධ වස්සං උපේමි)** යනුවෙන් තනි තනිවම ප්‍රකාශ කොට වස් සමාදන් වෙති.

මෙලෙස ඇසළ පොහෝ දිනට පසුදින එනම් ඇසළ අව පෑළවිය දිනයෙහි වස් සමාදන් වීම පෙරවස් එළඹීමයි. කිසියම් හේතුවක් නිසා යම්කිසි භික්ෂුවකට පෙර වස් සමාදන් වීමට නොහැකි වූයේ නම් ඇසළ පුන් පොහෝ දිනයෙන් මසක් ඉක්ම ගිය නිකිණි පුර පසළොස්වක පොහෝ දින උපෝසථාගාරයට වැඩමවා, පොහොය කොට එදිනට පසු දින එනම් නිකිණි අව පෑළවියද වස් එළඹිය යුතුය. මෙය පසුවස් එළඹීමයි. වස් එළඹීම සඳහා කිසිවෙක් ආරාධනා කළත් නොකළත් බුද්ධ නියමයට අනුව සෑම උපසපන් භික්ෂුවක්ම ඉහත දක්වන ලද වස් එළඹීම්වලට අදාළව වස්සාන සෘතුවෙහි වස් සමාදන් විය යුතුය.

පොල්පිතිගම, වේරිහාසික
හාගොල්ල රජමහා විහාරාධිපති,
කොළඹ නාලන්ද විද්‍යාලයේ ධර්මාචාර්ය,
**පූජ්‍ය ලැගුම්දෙණියේ සුනන්ද හිමි**

"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් නොහොඹිනු විසින් කරන ලද පව් වහා නොමේරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් බාලයා දවමින් පසුපස ලුහු බඳී."





# ජාතික ගීය ගායනා කරන විටත්, ජාතික කොඩිය ඔසවන විටත් බෞද්ධ භික්ෂුව හැසිරිය යුත්තේ කොයි විදියටද?

ජාතික කොඩියක් හා ජාතික ගීයක් මගින් සංකේතවත් කරන්නේ ඒවා අයත් රටේ ජනතාවයි. කුමන රටක වුවද ජාතික ගීයට හා ජාතික කොඩියට ගරු බුහුමන් කළයුතුය යන්න ලෝකයේ පවතින සම්මතයකි. පාසල්, ආයතන, කුලගොත්‍ර, සංවිධාන ආදියටද වෙන්වුණු කොඩි හා ගීත තිබේ. තමන් අයත් නොවන ජාතියක හෝ ආයතනයක කොඩියට හා ගීතයට ගෞරව දැක්වීමෙන් පෙන්වන්නේ එමගින් නියෝජනය වන ජන කණ්ඩායමේ ජාතිකාභිමානය පිළිගන්නා බව සහ සුහදත්වය පළකිරීමයි. ජාතික කොඩියකට අපහාස කිරීම ජාතියකට සිදුකරන කදිමල විරෝධයකි. සිංහලේ රාජ්‍යය යටත් කරගත් බව පෙන්වීමට ඉංග්‍රීසීන් ඔවුන්ගේ කොඩිය එසවූ විට වාරියපොල සුමංගල අස්ගිරි අනුනාහිමියන් එය සිඳ දැමූ බව ප්‍රකට පුවතකි. ජාතික කොඩියෙන් භූමියක අයිතිය පෙන්නුම් කෙරේ. අනුන්ගේ දේශ සීමාවක ජාත්‍යන්තර නීතිය අනුව තමන්ගේ රටේ ජාතික කොඩිය එසවීමේ අයිතිය තිබෙන්නේ තානාපති කාර්යාලවලට පමණි. විදේශීය පන්සල්වල බෞද්ධ කොඩියක් එසවිය යුත්තේ එරට ජාතික කොඩියට ප්‍රමුඛත්වය ලබාදෙමිනි. ජාතික කොඩිය සම්බන්ධයෙන් බොහෝ රටවල නීති රීති තිබේ. අපේ ජාතික කොඩිය රිය අනුන්වල හිස තබනයට යෙදීම ගැන ගංගොඩවිල සෝම හිමි විරෝධය දැක්විය.

ජාතික කොඩිය ඔසවන විට හා ජාතික ගීය ගයන විට ආසනවලින් නැගිට සිරුවෙන් සිටීම ඒවාට ගෞරවය පළකරන සාමාන්‍ය ස්වරූපයයි. ඇතැම් විට පපුවට දකුණත තබාගෙන ජාතික ගීය ගැයීම සිදුවෙයි. එයින් ප්‍රකාශයට වන්නේ හදවතින්ම තම ජාතියට අවනතව බැඳී සිටින බවයි. කිසියම් රටක ජාතික ගීයක් ගයන විට නැගිටීමේ පුරුද්දට ලක්වැසියන් මුලින්ම පුරුදු කෙරුණේ යටත් විජිත සමයේ සිනමාශාලාවලිනි. චිත්‍රපටයක් ප්‍රදර්ශනයට පෙර හෝ පසුව "දෙවියන් වහන්සේ රජතුමා රකිත්වා" යන එංගලන්ත ජාතික ගීය ගයද්දී ප්‍රේක්ෂකයෝ නැගී සිටියහ. එසේ කළේ රජුට ගෞරව පිණිසයි. නමුත් වර්තමානයේ ජාතික කොඩියට හා ගීයට ගරු කරමින් නැගී සිටීම ලෝක සම්මතයකි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 6 වගන්තියෙන් සිංහ ලාංඡනය සහිත ජාතික ධජයද, අංක 7 යටතේ "ශ්‍රී ලංකා මාතා" යන ජාතික ගීය ව්‍යවස්ථාපිත වේ. රජයේ ආයතන සහ පාසල් වැඩ ඇරඹීමේදී දිනපතා ජාතික ගීතය ගායනා කිරීම සිරිතකි. අපේ රටේ ඇතැම් ආගම්වාදී ජන කණ්ඩායම් අපේ ජාතික කොඩියට හා ගීයට අවමන් කරති. පෙළා දක්වති. එයින් අවධාරණය වන්නේ ජාතියක් වශයෙන් එකමුතු වීමට ඔවුන් තුළ පවත්නා අකමැත්තයි.

විදේශයක ජීවත් වන හෝ සම්මන්ත්‍රණවලට සහභාගි වන භික්ෂූන් වුවද ජාතික කොඩිවලට හා ජාතික ගීවලට ගරු බුහුමන් කිරීම සිරිතකි. එය එම රටේ නීතියට අවනත වීමකි. එසේ නොකළහොත් එය සදාචාරයට පටහැනි නොහික්මුණු ක්‍රියාවක් ලෙස එරට ජනතාවට හැඟෙයි. බෞද්ධ රටකදී භික්ෂුවට හිමිවන සමාජ තත්ත්වය ගැන දැනුමක් අබෞද්ධ රටවල වැසියනට නොමැත. එවැනි රටවලදී භික්ෂුවක වුවද සැලකෙන්නේ සාමාන්‍ය රටවැසියකු වශයෙනි. ශ්‍රී ලාංකික භික්ෂුවට සමාජයෙන් විශේෂ ගරුත්වයක් උරුම වී තිබේ. නෛතික වශයෙන් රාජ්‍ය පාලකයා රටේ ප්‍රධානියා වෙයි. එහෙත් චිරාගත සංස්කෘතික සම්ප්‍රදාය අනුව භික්ෂූන් වහන්සේ අපේ රටේ පාලකයාටත් ඉහළින් සිටින කෙනෙකි. රජකු එම තනතුරට පත්වන්නේ පා සිවුරු රකින්නට බව සිව්වන මිහිඳු රජු පැවසීය. එයින් කියැවෙන්නේ සම්බුද්ධ ශාසනය, භික්ෂුව රකින්නට රාජ්‍ය පාලකයා බැඳී සිටින බවයි. වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන වගන්තියේ නෛතික බලය මගින් එය අවධාරණය කෙරේ.



අපේ රටේ ජාතික කොඩිය ඔසවන අවස්ථාවල හා ජාතික ගීය ගයන විට භික්ෂූන් වහන්සේලා කටයුතු කළයුත්තේ කෙසේද? අසුන්වල වැඩ සිටිනවාද? ගිහියන් මෙන් අසුනෙන් නැගිට එයට ගරු බුහුමන් දක්වනවාද? යන්න මතභේදයට ලක්ව තිබෙන කරුණකි. ශ්‍රී ලාංකික ජාතියට, මාතෘභූමියට ගෞරව කිරීම, එහි අභිමානය පිළිගැනීම හා තමන් තුළ පවතින දේශප්‍රේමය පළකිරීම එමගින් සිදුවන නිසා අනෙකුත් රටවැසියන් මෙන් භික්ෂූන්ද ආසනවලින් නැගිට සිට ආචාර කළයුතුය යන්න එක් පිරිසක් දරන මතයයි. එය අනුමත නොකරන පිරිස පැහැදිලි කරන්නේ භික්ෂුව යනු සමාජයේ උසස්ම තැනැත්තායි. ලක්වැසි ජනතාවගේ බහුතරයක් දෙපා හිස නමා ගරු බුහුමන් දක්වන, තෙරුවන් අතර ජීවමාන සංකේතය වන්නේ භික්ෂුවයි. දේශපාලන වශයෙන් නොව සමාජීය වශයෙන් භික්ෂුව සියල්ලන්ටම ඉහළින් සිටින කෙනෙකි. රජුන් විසින් පවා හිස නමා ආචාර කරනු ලබන්නෙකි. භික්ෂුව ඉදිරියේ රාජ්‍ය නායකයාද නැගී සිටිය යුතුයැයි පවසන පිරිසක් සිටිති. මෙම ගැටලුව විසඳා ගත යුත්තේ ශ්‍රී ලාංකික රාජ්‍ය පාලන තන්ත්‍රයට ප්‍රාථමික ලක්ෂණ, ශාසනික ප්‍රතිපත්ති හා සමාජ සිරිත් විරිත් අධ්‍යයනය කිරීමෙනි. ඒ අනුව නෛතිකාධිකාරීත මහානායකහිමිවරුන් 2008.02.25 දින නිකුත් කළ සංඝ සම්මුතියක් ඇත. ඒ පිළිබඳව නවක භික්ෂූන් දැනුවත් කිරීම සඳහා පිරිවෙන් ආයතනවලට චක්‍රලේඛනයක් යවා ඇත. එය පැහැදිලි කෙරෙන්නේ ජාතික ගීය පිළිබඳ ශාසනික වත සිරිත් කළයුතු යටතේය.


"ජාතික ගීය ගායනා කෙරෙන හෝ වාදනය කෙරෙන අවස්ථාවලදී නැගී සිටීමෙන් හෝ විශේෂ ඉරියව් ප්‍රකාශ කිරීමෙන් වැළකී භික්ෂූන් වහන්සේ තමන් වහන්සේගේ වැඩ සිටි ආකාරයෙන්ම වැඩ සිටීමෙන්, ශාසනික ප්‍රතිපත්ති හා භික්ෂු ආචාර ධර්මවලට අනුකූලව නිහඬතාව පළකොට ජාතික ගීය විෂයෙහි පවත්නා තම ගෞරවය ප්‍රකාශ කළ යුතුය."

ඉහත සඳහන් දැනුම් දීම ජාතික කොඩිය සම්බන්ධයෙන්ද අදාළ වේ. එය එම ලිපියෙන්ම පැහැදිලි වේ.


"බෞද්ධ ජන සංසදයේ මුදුන් මල්කඩ වන බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයට අයත් වන ගෞරවනීය සංඝරත්නය මේ ත්‍රිවිධ රත්නය විෂයෙහි හැර කිසිම පුද්ගලයකු හෝ වස්තුවක් හෝ ධර්මතාවක් හෝ කෙරෙහි ගෞරවාදරයක් දැක්වීම සඳහා යොමු කරවීම නුසුදුසුය. එය උත්තරීතර ත්‍රිවිධ රත්නය හෑල්ලුවට ලක්කිරීමක් වන්නේය."

**පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි**
**අස්ගිරි මහා විහාරය කාරක සංඝ සභික**
**ගරු අනුශාසක - සමස්ත ලංකා**
**ශාසනාරක්ෂක මණ්ඩලය**

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."



# මරණය මෙන්ම ඉපදීමද දුකකි



දේශනාකරණ : කොළොන්නාවේ

පූජ්‍ය කිඹිඹටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ මේධංකර
නායක
ස්වාමින්වහන්සේ

"ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛ දෝමනස්සුපායාසා දුක්ඛා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"

"ඉපදීම, ජරාව, ව්‍යාධිය, මරණය, ශෝකය, වැළපීම, කයෙහි හටගන්නා දුක, සිතෙහි හටගන්නා දොම්නස, දැඩි ආයාසය යන මේවා දුක්ඛයෝය. කැමති දෙයක් නොලැබීම ද දුකෙකි. කෙටියෙන් කියතොත් රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන ස්කන්ධ පස්දෙනාම දුක් සහගතය."


සිත්වතුනි,

අද ඇසළ පුන් පොහෝ දිනයයි. අප මහබෝසතාණන්වහන්සේ සුද්ධෝදන මහරජුගේ අගමෙහෙසිය වූ මහාමායා දේවියගේ කුස පිළිසිඳගත්තේත්, සිදුහත් කුමරුව ඉපිද විසිනව වන වියේදී ගිහිගෙයි සැලසිරි රජසැප හැරදා අභිනිෂ්ක්‍රමණය කළේත්, බුදු බව ලබා පස්වග මහණුන්ට ප්‍රථම ධර්මදේශනාව වූ ධම්මචක්කප්පවත්තන සූත්‍රදේශනාව සිදුකළේත් අද වැනි පුන් පොහෝ දිනයක. තීර්ථකයන්ගේ මානය මර්ධනය කොට යමාමහපෙළහර

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

දැක්වූයේය. මාතෘදිව්‍යරාජයාට තව්තිසා දිව්‍ය ලෝකයේ දී විජම්භක ධර්ම දේශනා කොට වදාළේත් උතුම් ඇසළ පුන් පොහෝ දිනයකදීමය. ලක්දිව අරිට්ඨ කුමරු ඇතුළු පිරිසගේ මහණ උපසම්පදාව හා පළමු වස් එළඹීම සිදුවූයේ ද, දුටුගැමුණු රජු රුවන්වැලිසෑය තැනීම සඳහා මුල්ගල් තැබීම සිදුවූයේ ද ඇසළ පුන් පොහෝ දිනයකදීය. එනයින් බලන විට ඇසළ පුන් පොහෝ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධයන්ටම සුවිශේෂී පුන් පොහෝ දිනයක් වන්නේය.

මෙම උතුම් පොහෝ දිනයේ දී සිදුවූ සුවිශේෂීම කරුණ වන්නේ, බරණැස ඉසිපතන මිගදායේ දී පස්වග මහණුන් ප්‍රමුඛ දෙවි මිනිසුන් විශාල පිරිසකට ප්‍රථම ධර්ම දේශනාව වූ ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාව සිදුකිරීමයි. එකී දේශනාව තුළින් හීන වූ, ගැමි වූ, පුහුදුන් ගතියෙන් යුක්ත වූ, උතුම් නොවූ, අවැඩට හේතු වන කාමසුඛල්ලිකානුයෝගයෙහි යෙදීම ද, කයට අධික දුක් පමුණුවන, උතුම් නොවූ, අවැඩ පිණිස පවතින අත්තකිලමථානුයෝගයෙහි යෙදීම ද යන අන්ත දෙකම ලාමක බැවින් පැවිද්දෙකු විසින් නොසෙවිය යුතු බවත්, මෙම අන්ත දෙකටම නොපැමිණ මධ්‍යමප්‍රතිපදාවෙහි යෙදීම වඩාත් මැනවැයි ද බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ සේක. ඉන් ප්‍රඥාව ඇතිවෙයි. නුවණ ඇතිවෙයි. කෙලෙස් සංසිඳෙයි. සත්‍ය දැනගැනීම පිණිස ද, සම්බෝධිය පිණිස ද, නිර්වාණය පිණිස ද හේතුවෙයි.



චතුරාර්ය සත්‍යය වනාහි දුක (දුක්ඛ), දුක ඉපදීම (දුක්ඛ සමුදය), දුක ඉපදීමට හේතුව නැතිකිරීම (දුක්ඛ නිරෝධය), දුක් නැතිකිරීමේ මග (දුක්ඛනිරෝධගාමිණීපටිපදා) යන සතරයි. ඉපදීම, ජරාව, ව්‍යාධිය, මරණය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දේ නොලැබීම, දුක්ඛ ආර්ය සත්‍යයයි. කෙටියෙන් කියතොත් රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ස්කන්ධ නාමී දුක් සමූහය, දුක්ඛ සමුදය ආර්යය සත්‍යය නම් කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා යන තුනයි. මේ තුනම දුක ඉපදීමට හේතුවේ. තණ්හාවෙහි නොඇලීමෙන් එම දුක් වැළැක්වීමෙන් ලැබෙන ශාන්තිය දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි. දුක වැළැක්වීමෙන් ශාන්තිය ලැබීමට යන සම්මාදිට්ඨි, සම්මාසංකප්ප ආදී ආර්යඅෂ්ටාංගික මාර්ගය දුක්ඛනිරෝධගාමිණීපටිපදාව නම් ආර්යය සත්‍යයයි.

දුක්ඛනිරෝධගාමිණීපටිපදාව යනු ආර්යඅෂ්ටාංගික මාර්ගයයි. ආර්යඅෂ්ටාංගික මාර්ගයේ එන, සම්මාදිට්ඨිය නම් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍යය පිළිබඳ දැනීමයි. ආත්මභාවය මනාකොට ප්‍රඥාවෙන් දැකීමයි. සම්මාසංකප්ප නම් සිත්සතන් නිවැරදිව තබා නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා යන යහපත් කල්පනාවෙහි යෙදීමයි. සම්මාවාචා යනු මුසාවාද, පරුෂවාචා, පිසුණාවාචා, සම්ඵප්පලාප යන සතරින් වැළකීමයි. සම්මාකම්මන්ත නම් ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය ආදී කායදුශ්චරිතයෙන් වැළකීම හෙවත් යහපත් ක්‍රියාවයි. සම්මාආජීව යනු වැරදි දිවිපෙවෙතින් වැළකී යහපත් දිවි පැවැත්මයි. සම්මාවායාම නම් නූපන් අකුසල ධර්මයන් නොඉපදීමටත්, උපන් අකුසල ධර්මයන් දුරු කිරීමටත්, නූපන් කුසල ධර්ම ඉපදවීමටත්, උපන් කුසල ධර්ම වැඩීමටත් වෑයම් කිරීමේ යහපත් උත්සාහයි. සම්මාසතිය නම් කය, සිත, වේදනාව, ධර්මය යන සතර අනුව බැලීමයි. සම්මාසමාධිය යනු කාමයෙන්, අකුසල ධර්මයන්ගෙන් වෙන්ව ධ්‍යානයන්ට පැමිණ වාසය කිරීමයි. මෙම ආර්යඅෂ්ටාංගික මාර්ගය නම් වූ මැදුම් පිළිවෙතින් ප්‍රඥාව ඇතිකරයි. නුවණ ඇතිකරයි. කෙලෙස් සංසිඳවයි. සත්‍යයන් දැකීමටත්, සම්බෝධිය පිණිසත්, නිර්වාණය පිණිසත් හේතු වේ.

ධම්මචක්කපවත්තන සූත්‍රදේශනාව පවත්වා ටික කලක් ඉක්මයාමෙන් අනතුරුව බරණැස ඉසිපතනාරාමයේ වැඩසිටි භාග්‍යවතුන්වහන්සේ, එක් දිනක් භික්ෂූන් වහන්සේ අමතා, මෙසේ වදාළ සේක. මහණෙනි, සම්යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ අන් කිසිවෙකුටත් පැවැත්විය නොහැකි චතුරාර්ය සත්‍යය නම් වූ නිරුත්තර වූ ධර්මචක්‍රය පවත්වන ලදී. මහණෙනි, සැරියුත්, මුගලන් දෙනම සේවනය කරවු. සැරියුත් තෙරුන් වහන්සේ වැදූ මව හා සමානය. උන්වහන්සේ මා සංක්ෂේපයෙන් දේශනා කළ දහම, විස්තර වශයෙන් දේශනා කිරීමට සමර්ථ වේ යැයි වදාරා විහාරයට වැඩි සේක.

සැරියුත් තෙරුන්වහන්සේ බුදුරජාණන්වහන්සේ විහාරයට වැඩම කොට සුළු වේලාවකට පසු භික්ෂූන් වහන්සේ අමතා, තථාගතයන්වහන්සේ දේශනා කොට වදාළ, දුක්ඛ ආර්ය සත්‍යය නම් ඉපදීම, දිරීම, මරණය, ශෝක, වැළපීම, කායික දුක, මානසික දොම්නස, දැඩි වෙහෙස, කැමති දේ නොලැබීම ඇතුළු සියලු ආකාර උපාදානස්කන්ධ බව විස්තර වශයෙන් දක්වා වදාළ සේක.

ඒ ඒ භවයෙහි ඉපදීමක් ඇත්ද, හටගැනීමක් ඇත්ද, ස්කන්ධයාගේ පහළවීමක් ඇත්ද එය ජාතිය වශයෙන් හැඳින්වේ. නැවත නැවත ඉපදීම දුකකි. උපන්නා වූ සත්වයන්ගේ යම් දිරීමක්, ජරාවට පත්වීමක්, ඇටකටු කැඩීමක්, කෙස් ලොම් පැසීමක්, රැලි නැගීමක්, ආයුෂයන්ගේ ගෙවීමක්, ඇස, කන, නාසාදි ඉන්ද්‍රියයන්ගේ මුහුකුරායාමක් වේ ද, එය ජරාවයි. දුකකි. ඒ ඒ සතුන් ජීවිතයෙන් ගැලවුණු බවක් ඇත්තේ ද, ඉක්මයාමක් ඇත්ද, බිඳීමක් ඇත්ද, රූපස්කන්ධයන්ගෙහි අතුරුදහන් වීමක්, මියයාමක්, කාලක්‍රියාවක් ඇත් ද එය මරණයයි. මේ මරණය ද දුකකි. කිසියම් ව්‍යසනයකින් ශෝක කරන බවය, ශෝක කළ බවය යනු ද දුකකි. නෑසියන් ආදී නානාප්‍රකාර ව්‍යසනයන්ගෙන් යුක්ත සත්වයාගේ ගුණ වර්ණනා කොට හැඬීම ද, අඳෝනා කියා හැඬීම ද දුකකි. කයෙහි හටගන්නා දුකක් ඇත් ද, කයෙහි හටගන්නා යම් අපහසු කාරණයක් වේත් ද, කයෙහි උපන් යම් දුකක් වේත් ද එය ද දුකකි. සිතෙහි හටගන්නා වූ යම් දුකක් වේත් ද, ස්පර්ශයෙන් හටගත් වූ යම් විඳීමක් වේත් ද එය දොම්නසයි. එය ද දුකකි. යම් ව්‍යසනයකින් හටගන්නා දුක් ස්වභාවයෙන් එයින් ඇතිවන යම්කිසි ආයාසයක් ඇත්ද, තදාසන්න වූ ස්වභාවයක් ඇත්ද, එය උපායාසයයි. යම් කැමති දෙයක් නොලබයි ද, නොකැමති දෙයක් ලබයි ද එය ද දුකකි. මේ ආදී වූ නොයෙක් ආකාරයෙන් පිළිබඳ ගැනීමේ තණ්හාවෙන් නැවත භවයක් හටගැනේ. භවයක් හට නොගන්නේ නම් එය ඉතා යහපත්ය.

දුක්ඛ සමුදය නම් නැවත භවය ඇතිකරන්නා වූ ඒ ඒ භවයන්හි ඇලීමක් ඇති කරන කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුයි. තණ්හාවේ නොඇලීමත්, නිරෝධයත්, මිදීමත් වෙනම එය දුක්ඛ නිරෝධයයි. දුක්ඛනිරෝධගාමිණීපටිපදාව නම් සම්මාදිට්ඨි, සම්මාසමාධි ආදී ආර්යඅෂ්ටාංගික මාර්ගයයි.

දුක හටගන්නේ තණ්හාව නිසාය. ඒ දුක නැතිකිරීම සඳහා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිවිධ ලක්ෂණය තෙරෙන බැවින් සිත උපදවාගෙන කාම, භව, විභව යන තුන්ආකාර තණ්හාවෙන් ඈත් විය යුතු වේ. භවය නැතිකිරීම සඳහා, දුක නැති කිරීම සඳහා දුක්ඛ නිරෝධ සත්‍යය වටහාගත යුතුය. ඒ සඳහා දුක්ඛනිරෝධගාමිණීපටිපදාව අනුගමනය කළ යුතුය. මෙසේ දුක්ඛ නිරෝධය සඳහා ඇති එකම මග මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා ආර්යඅෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමයි.


මෙසේ ආර්යඅෂ්ටාංගික මාර්ගය වටා ගැනීමෙන්, මැනවින් සපුරාගැනීමෙන් නිවන් මග සාක්ෂාත් කරගත හැකිය. ඒ සඳහා මෙම උතුම් ඇසළ පුන් පොහෝ දිනයේ දී සිතේ සතිය මැනවින් පිහිටුවාගැනීමට යත්න දැරිය යුතුය.

තෙරුවන් සරණයි.

"යම් තැනක සිට පව් විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුදු මැදත් නැත. පර්වත අතරෙහිවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."

සිද්ධාර්ථ කුමරා බුද්ධත්වයට පත්ව සත්වැනි සතියේදී උන්වහන්සේ හමුවූ තපස්සු භල්ලුක නම් වෙළෙඳ දෙබෑයෝ ධර්මය අසා සෝවාන්ව බුදුන් සිහිවනු පිණිස පූජා වස්තුවක් ඉල්වූ කල්හි බුදුරජාණන් වහන්සේ හිස අතගා කේශ ධාතු කිහිපයක් එම වෙළෙඳ දෙබෑයන්ට දුන්හේලු. ඒ කේශ ධාතූද රැගෙන වෙළෙඳ කටයුතු කරන කල්හි හෙළදිවට පැමිණෙන ඔවුන් මෙරටදී කේශ ධාතු නිදන් කොට දාගැබක් කරවූ බව වංශකතාවන්හි දක්වේ.

ඒ දාගැබ අද තිරියායේ පිහිටි ගිරිහඬු සෑය ලෙස හඳුනාගෙන තිබේ. ඒ බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව ගතවමින් තිබූ පළමු වර්ෂයේ හෝ ඒ ආසන්න වර්ෂයක ඉදිවූවක් විය යුතුය. ඉන් අනතුරුව බුදුන් වහන්සේ මහියංගණයටත්, නාගදීපයටත්, කැලණියටත්, ශ්‍රී පාදස්ථානයටත් වැඩම කර අනතුරුව සොළොස්මස්ථාන සිය පාද ස්පර්ශයෙන් පූජනීයත්වයට පත්කළ බවත් වංශකතාවන්හි දක්වේ.



බුදුන් වහන්සේ පෙරටත්ම වැඩම කළ හෙළදිව බුදු දහම ව්‍යාප්තව තිබෙන්නට ඇතැයි යන්න බැහැර කළ නොහැකි කරුණකි. ගිරිහඬු සෑය ඉදිවන්නේත්, මැණික් පුටුවක් හැන්පත් කර කැලණියේ චෛත්‍යයක් ඉදි කරන්නේත්, කතරගම කිහිරි වනයේදී බුදුන්ගෙන් බණ අසා සෝවාන් වූ මහසෙන් රජු කිරිවෙහෙර සාදවන්නේත්, දේව වංශික ප්‍රධාන සමන් බුදුන්ට සමනොළ හිසට ආරාධනා කරන්නේත් බුදු දහම මෙරට ව්‍යාප්තව තිබූ බැවින් යැයි වංශකතා සාධක අනුව පැහැදිලි වේ.

අනුරාධපුරයේ ඇතුළු නුවර කරන ලද කැණීමේදී හමුවූ බ්‍රාහ්මීය අක්ෂර සහිත පෙළ් ලිපියක් ක්‍රිස්තු පූර්ව 450දී ලියන ලද්දක් බව තහවුරු වී තිබේ. ඒ අනුව පැහැදිලි වූයේද මිහිඳු හිමියන් පැමිණීමට වසර 200කට තරම් පෙරාතුව පටන් ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මීය අක්ෂර භාවිත කළ දියුණු සංස්කෘතියක් පැවති බවයි.

තවද විජය රජුගෙන් පසු මෙරට රාජ්‍යත්වයට පත් පඬුවස්දෙව් රජුගේ මෙහෙසිය වූ භද්දකච්චානා කුමරිය සිද්ධාර්ථ ගෞතමයන්ගේ පියාණන් වූ සුද්ධෝදන රජුගේ සොහොයුරු අමිතෝදන රජුගේ පුත් පණ්ඩුශාක්‍ය රජුගේ දියණියයි. මේ පරපුර බෞද්ධයන් වූවාට සැකයක් නැත. භද්දකච්චානා කුමරියගේ පැමිණීමත් සමඟ බුදු දහම මෙරට වඩාත් ව්‍යාප්ත වන්නට ඇත. මෙවන් පසුබිමක ගොඩනැගුණු



# මහින්දාගමනයටත් පෙර ලංකාවේ බුදු දහම තිබූ බවට සාධක කූරගලින් හමුවේ

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

පෙළඳිව පැරණි උරුමය ගැන වඩාත් විශ්වස්ත වූ පර්යේෂණ ගණනාවක් කරන මහාචාර්ය රාජ් සෝමදේව මහතා පවසන්නේ කුරගල ප්‍රදේශයේ කරන ලද ගවේෂණයකින් මිහිඳු හිමියන් පැමිණීමට පෙර බුදු දහම තිබූ බව සනාථ කරගත හැකි සාධක සොයාගත හැකිවූ බවයි.

මේ ගවේෂණය කර ඇත්තේ කුරගල, කල්තොට බෝහාර ප්‍රදේශයට අයත් කිරිමකුල්ලගොල්ල, වැම්බැටිය, වැලිපොතේයාය, දියවින්න වැනි ස්ථානයන්හිය. මහාචාර්ය සෝමදේව පවසන්නේ මේ ගවේෂණයේදී හමුවූ පැරණි ගුහා විහාර පිහිටීම, ඒවායේ ඇති කටාරම් හා බ්‍රාහ්මී අක්ෂර සහිත සෙල්ලිපි සැලකීමේදී මිහිඳු හිමියන් මෙරටට පැමිණීමට පෙර පටන් බුදු දහම සිරිලක පුරා ව්‍යාප්තව තිබූ බවට සාක්ෂි ලැබෙන බවයි. එය පෙර මතය සනාථ කරන්නකි.

මහාචාර්ය රාජ් සෝමදේව වසර හතක පමණ කාලයක පටන් මේ පර්යේෂණය කරයි. මෙරට වංශකතා සාධකවලින් පැහැදිලි වන ඉතිහාසය හා පුරාවිද්‍යාඥයන් විසින් පර්යේෂණ මගින් තහවුරු කරගන්නා ලද ප්‍රාග් ඓතිහාසික යුගය අතර වසර 1200ක පමණ පරතරයක් ඇති බව මහාචාර්ය සෝමදේවගේ අදහසයි. ඔහු කියන්නේ වංශකථා සහිත ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 600න් ආරම්භ වන අතර ප්‍රාග් ඓතිහාසික යුගය ක්‍රිස්තු පූර්ව 1800 ඈතට විහිදී යන බවයි. මේ පරතරය සහිත කාලයේ මෙරට පැවති තත්ත්වය විස්තර කිරීමට කිසිදු පිළිගත හැකි මූලාශ්‍රයක් නොමැතිවීම ගැටලුවක් බවද ඒ මහතා පෙන්වා දෙයි.

"ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මෙහි වාසය කළ මානවයා එකවරටම අතුරුදහන් වෙලා ඓතිහාසික යුගයේ ඉන්දියාවෙන් සංක්‍රමණය වූ ආර්යයන් විසින් මෙරට ජනාවාස ඇතිකරමින් දියුණු සංස්කෘතියක් ඇතිකරනු ලැබුවා යැයි විශ්වාස කළ නොහැකියි. අපේ මතයක් තිබෙනවා මෙරට සිටි ජන කොටස් ක්‍රමිකව විකාශය වෙමින් දියුණු සංස්කෘතියක් වෙත ගමන් ගත් බව. මෙන්න මේ සංස්කෘතික වශයෙන් පරිණාමය වූ හැකිහම් දියුණු සංස්කෘතියක් වෙත ගමන් ගත් කාලයේ මෙරට පුරාවිද්‍යා සාධක සෙවීම අපේ ගවේෂණයේ එක් අරමුණක්."

මහාචාර්ය සෝමදේව මහතා කරන ලද ගවේෂණයේදී මෙතෙක් සොයා නොගත් සෙල් ලිපි රැසක් සොයාගෙන තිබේ. එම ලිපි අතර යක්ෂ, නාග හා දේව නම් සහිත පුද්ගලයන්ගේ තොරතුරු ඇති බවද හෙතෙම කීය. එවැනි සෙල්ලිපි අතර අභයදේවගේ පුත් සීතදේව යන නමද නාග යනුවෙන් සඳහන් නමද හමුවන බව මහාචාර්යවරයා පවසයි.

"අප මේ සෙල්ලිපි පිටපත් කළා. ඒ සෙල්ලිපි ක්‍රිස්තු පූර්ව 250ට වඩා පැරණියි. මිහිඳු හිමියන්ගේ පැමිණීමෙන් පසු මිහින්තලේ සහ රිටිගල වැනි ප්‍රදේශයන්හි දක්නට ලැබෙන සෙල්ලිපිවල ඇති බ්‍රාහ්මී අක්ෂරවලට වඩා මේ සෙල්ලිපිවල අක්ෂර වෙනස්. ඒ වගේම වෙනස් සංකේත දක්නට ලැබෙනවා. මේ අක්ෂර රූප අනුව පැහැදිලියි මේවා මිහිඳු හිමියන් පැමිණීමට පෙර ලියන ලද සෙල්ලිපි බව. මේ අනුව පැහැදිලි වෙනවා බෞද්ධ සම්ප්‍රදායන් මේ ප්‍රදේශවල මුල්බැසගෙන තිබුණේ මිහිඳු හිමියන් පැමිණීමට පෙර කාලයක සිට බව."

මේ ප්‍රදේශයේ ඇති ඇතැම් ලෙන් විහාරයන්හි සෙල්ලිපි දක්නට නැත. ඇතැම් කටාරම් කඩා වැටී තිබේ. මේ කඩා වැටීම්වලින් පෙනී යන්නේද ඒ ලෙන් ඉතා පැරණි බව යයි මහාචාර්යවරයා කියයි. මහාචාර්ය සෝමදේව මහතා පවසන්නේ මේ බව තහවුරු කිරීමට වඩාත් ගැඹුරු පරීක්ෂණ අවශ්‍ය බවයි. විකිරණශීලී ක්‍රම මගින් කාල නිර්ණය කිරීම අත්‍යවශ්‍ය බවද

උදාහරණයක්. එසේ වුවත් අපේ ඉතිහාස කතාන්තරයේ දක්වෙනවා මිහිඳු හිමියන් පැමිණීමෙන් මෙරටට බුදු දහම පැමිණි බව. ඒ නිසා අර සනාථ අනුව අපට හිතන්න ලැබෙන්නේ නැහැ."

වංශකතාවල ඒ තොරතුරු විවිධ අවස්ථාවලදී දක්නට ලැබෙන බවද මහාචාර්යවරයා වැඩිදුරටත් පැවසීය.

"කෙසේ වෙතත් කල්තොට ප්‍රදේශයෙන් හමුවූ සෙල්ලිපිවල දක්නට ලැබෙන යක්ෂ සහ නාග කියන නම්වලින් විජයාවතරණයට පෙර මෙහි සිටි ස්වදේශික ජනතාව ගැන සඳහන් වෙනවා. ඔවුන් තමන්ගේ අනන්‍යතාව එහි මනාව දක්වා තිබෙනවා. සාමාන්‍යයෙන්




බවද වැඩිදුරටත් කීය.

මහාචාර්ය සෝමදේව මහතා පවසන්නේ මිහිඳු හිමියන් මෙහි පැමිණීමට කලකට පෙර මුහුදු යාත්‍රා මගින් වෙළෙඳුන් ඇතුළු විශාල පිරිසක් මෙහි පැමිණෙන්නට ඇති බවයි.


"ක්‍රිස්තු පූර්ව තුන්වැනි සියවසේ ලියූ සෙල්ලිපිවල දක්නට ලැබෙනවා ඉන්දියාවේ භාරුකච්ඡ තොටුපොළට යාත්‍රා කළ නාවිකයන් සම්බන්ධයෙන්. මේ තොටුපොළ වර්තමාන ගුජරාට් ප්‍රදේශයේ පිහිටා තිබූ ස්ථානයක් බව විශ්වාස කරනවා. මේ නැව් ගමන්වලදී මෙහි පැමිණෙන නාවිකයන්ගේ හා එහි යන මෙරට නාවිකයන්ගෙන් බුදු දහම මෙරටට පැමිණෙන්නට ඇති. තපස්සු භල්ලුක වෙළෙඳුන් එයට හොඳම

ගල් ලෙනක කටාරම් කපන්නේ ගල දිගේ පහළට එන වතුර ඇතුළට එම වැළැක්වීමට. එසේ කරන්නේ සංඝයා වහන්සේලාට මේ ලෙන් පූජා කරන අවස්ථාවලදී. මෙයින් පැහැදිලි වෙනවා යක්ෂ, නාග හා දේව වංශික ස්වදේශිකයන් සංඝයා වහන්සේලා වෙනුවෙන් මේ ලෙන් සාද පූජා කළ බව."

මහාචාර්ය රාජ් සෝමදේව මහතා පවසන්නේ මේ ගවේෂණයෙන් සොයාගත් පුරාවිද්‍යාත්මක සාධක තවදුරටත් පුළුල්ව පර්යේෂණයට බඳුන් කළ යුතු බවයි. ඒ සඳහා ඉදිරි කාලයේදී කටයුතු කරන බවද හෙතෙම කීවේය.

**වේරගොඩගේ සජීව විජේවීර**

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



## ලංකාවේ සියලු උත්සව අභිබවා

# ඇසළ පෙරහර මංගල්‍යය මුල්තැනට එන්නේ මේ නිසයි

### මෙවර මහ පෙරහර වීදි සරන්නේ අගෝස්තු 10 වැනිදා



සිරිසර සිරිලක කන්ද උඩරට සෙන්කඩගල පුරවර සිරි දළදා මන්දිරයෙන් දසත පැතිරී යන සුමිහිරි පසතුරු ඝෝෂයින් සිත් සතන් තෙරුවන් ගුණයෙන් ප්‍රබෝධමත් වන විට සම්බුදු දහමේ විද්‍යමාන වන නිර්මාණාත්මක කුසලතාව සනිටුහන් වන්නේය. දෛනිකව බුද්ධාදී තෙරුවන් උදෙසා පවත්වන ආවතේව, පුද පූජා, වන්දනාමාන දකින, අසන, සම්බන්ධ වන ජනතාවට බුදු දහමේ දක්වන සංවර්ධනවලින් ජීවන මග නිරවුල් කරගැනීමටද නිරාමිස ප්‍රීතියක් ඇතිකර ගැනීමටද හේතු වාසනා වන්නේය.

ලොව සැම ආගමිකම ජීවාත්මක ගුණය රඳා පවත්නේ සාමූහික ප්‍රයත්නයෙන් බැවින් පාරම්පරිකව සම්මත කරගත් සන්නිවේදන ක්‍රම භාවිත කරමින් ජනතා සිත්සතන් ආකර්ෂණය කෙරෙන්නේය. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ශ්‍රී සද්ධර්මය ශ්‍රාවකයන්ගේ සිත්සතන් තුළ ස්ථාපිත කිරීම සඳහා දේශනා, වාදවිවාද, සාකච්ඡා මෙන්ම ප්‍රායෝගික උපයෝගීතාවන්ද භාවිත කළ සේක. එමෙන්ම ශ්‍රාවකයන් වහන්සේලා මෙන්ම බෞද්ධ අනුගාමිකයෝද පුද්ගලාන්තරව ධර්මය ව්‍යාප්ත කිරීමේදී සංකීර්ණ සමාජයේ සම්මත උපයෝගීතාවන් භාවිත කළ වග ශාසන ඉතිහාසයෙන් ප්‍රත්‍යක්ෂ වන්නේය.

මිහිඳු මහරහතන් වහන්සේ විසින් ස්ථාපිත කළ ලංකා සම්බුද්ධ ශාසනය පරපුරෙන් පරපුරට පවත්වාගෙන ඒම සඳහා ජනතාව ඉතා රුචිකත්වයෙන් භාවිත කරන සන්නිවේදන ක්‍රම උපයෝගී කරගෙන ප්‍රථමයෙන් සිත්සතන් ආකර්ෂණය කොට ධර්මය අවබෝධ

කරවා ඇත. බුද්ධාගමේ පරමාර්ථය වන නිවන පසක් කරගැනීම පෘථුල ලෞකික අපේක්ෂාවන්ගෙන් සංකීර්ණ වූ සමාජයට ජීවනාධාර වශයෙන් බුදුදහමේ කලාත්මක අංශය ප්‍රථමයෙන් ජීවිතයට සම්බන්ධ කළ යුතු වන අතර අනුක්‍රමයෙන් නිවන් මගට යොමු කළ යුතු වන්නේය. එසේ නොවන්නේ නම් පරමාර්ථ ධර්ම ඉතාමත් සුළු පිරිසකට සීමාවී ශීඝ්‍රයෙන් සම්බුද්ධ ශාසනය අභාවයට යන්නේය.

ශ්‍රී දළදා පෙරහර නිසා ලෞකික ලෝකෝත්තර වශයෙන් ලැබෙන ප්‍රයෝජන අපමණ වන අතර එම පෙරහර සම්බන්ධ සෑම අංශයක්ම පාරම්පරික අත්දැකීම් අනුව බුද්ධිමත්ව, ක්‍රමවත්ව සකස් වූ ඒවා බව ප්‍රත්‍යක්ෂ වන්නේ පෙරහර වීදිවල සංචාරය කරන විටය.

සත්වයාගේ පෞද්ගලික ක්‍රියාකාරිත්වය රඳා පවතින්නේ පංචේන්ද්‍රියන් ගෝචර කරගන්නා අරමුණු අනුගතවය. මේ නිසා පෙරහර නරඹා එම අංගෝපාංග සමග එක්වීමෙන් පංචේන්ද්‍රියන් පිනවා ලෞකික වින්දනයක් ලබා එයම විමුක්ති මාර්ගයට යොමු කිරීමට පුළුවන.


අප බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාවෙන් "පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි" ආදී වශයෙන් පෙන්වා වදළ පරිදි පෙරහර ආරම්භයේ පටන් අවසානය දක්වා විවිධාකාර ආලෝක ධාරාවන් බුදුදහම් පිළිපැදීමෙන් ලබන අවිද්‍යාන්ධකාරය දුරු කොට විද්‍යාලෝකය පිළිබිඹු කෙරෙන්නේය. ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින විසිතුරු කරඬුව තුළ වඩා හිඳුවා හස්ති රාජයාගේ ඉසමතින් වැඩම වන විට අපගේ අරමුණ වන්නේ ජීවමාන බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිරූපයයි.

කෙළ ලක්ෂ ගණන් දෙවියන් මිනිසුන් පිරිවරා ගෙන සහනා පියවරෙන් පියවර ගාන්න දන්තව වැඩිය බුදුරජාණන් වහන්සේ දකීමට තරම් වාසනා මහිමය නැති වුවද ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින රන් කරඬුව දකින විට ඇතිවන බුද්ධාලම්බන ප්‍රීතිය, ප්‍රසාදය නිර්වාණගාමී සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් ජනිත වීමට මූලාධාර වන්නේය.

බෝධිසත්වයන් වහන්සේ මව්කුසින් බිහිවන විට එමෙන්ම බුදුවීම, දම්සක් පැවතුම් සූත්‍රයෙන් ප්‍රථම ධර්ම දේශනා පැවැත්වීම යන ප්‍රධාන අවස්ථාවල දෙවියන් විසින් පංචතූර්ය නාද, ජය නාද, සාධු නාද පැවැත්වූවා සේම ශ්‍රී දළදා පෙරහර අප හඳුනා ගන්නා ප්‍රධාන අංගය වන්නේ සුබිගිරි, ගැඹුරු ආතත, විතත, විතතාතත, ඝන, සුසිර යන පංචතූර්ය නාදයයි. මෙම වාද්‍ය භාණ්ඩ පිළිබඳව මෙන්ම වාදන රටාව පිළිබඳවද ඉතා ගැඹුරු ඥානයක් අවශ්‍ය වන්නේය.







නැටුම්, ගැයුම්, වැයුම් සම්බන්ධයෙන් ලබන ඥානය බෞද්ධ දර්ශනය සමානව ගැඹුරුය. එහෙත් ලෞකික වශයෙන් එයින් ලබන වින්දනය කියා ලියා නිම කළ නොහැක්කේය. ඇස්, කන්, නාසාදී පංචේන්ද්‍රියන්වම එම පංචතූර්ය නාදයෙන් රසවිඳීමේ වාසනා මහිමය ලැබෙන අතර වාදන ස්වරයේ අනිත්‍යතාව මෙනෙහි කිරීමෙන් බෞද්ධ දර්ශනයේ ත්‍රිලක්ෂණය මතක් වන්නේය.


ලංකාවේ ඈත අතීතයේ පටන් පවතින පොදුජන සන්නිවේදනය බෙර, දවුල්, තම්මැට්ටම් වාදනයයි. පන්සල්, වෙහෙර විහාර, ධාතු මන්දිර, බෝධි ප්‍රාකාර ඉදිකිරීම, පූජා පැවැත්වීම, මහා සංඝරත්නය වැඩමවීම, දානය, පිරිත, පින්කම් ආදී සුදුමහත් කටයුතුවලදී ජනතාවගේ අවධානය යොමු කෙරෙන්නේත් ප්‍රධාන වශයෙන් බෙර වාදනයෙනි. එසේ වාදනයෙන් ජනතාවත්, ආගම දහමත් අතර සම්බන්ධය තහවුරු වන අතර එයින් ශිෂ්ටාචාරයේ මූලධර්මයන් ආරක්ෂා වන්නේය.

ශ්‍රී දළදා පෙරහර පවත්වන දිනවල රාත්‍රී භාගයේ වාදනය වන බෙර, දවුල්, තම්මැට, බුම්මැට, තාලම්, උඩැක්කි, පන්තේරු ආදී දහස් ගණනින් වාදන ගායන නාද නින්නාද වන විට ජාති, ආගම්, කුලමල, ධන, නිර්ධන ආදී වශයෙන් කිසිම භේදයක් නොමැතිව දසලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ එකමුතු බව සමස්ත ලෝකයාටම ප්‍රකාශ කෙරෙන්නේය. දීප්තිමත්, විචිත්‍ර බෞද්ධ කලාවේ මහිමය දේශ දේශාන්තරව ප්‍රචලිත වන්නේය.

දළදා පෙරහර සම්බන්ධයෙන් කෙරෙන සෑම කාර්යයක්ම, පුද්ගලයෙක්ම, එමෙන්ම සෑම භාණ්ඩයක්ම ලාංකිකයන්ගේ අභිනවත්වය, නිර්මාණ කුසලතාවය ප්‍රකට කෙරෙන අතර අවිහිංසාවාදී එහෙත් ප්‍රෞඪ, එමෙන්ම අන්‍ය ජාතීන් සමග සහනශීලී, කාර්යශූර, ධීර වීර භාවය සනිටුහන් කරන්නේය.

සිංහල ජාතිය ආරම්භයේ පටන් සෞන්දර්ය විෂයයන් පිළිබඳ මනා අවබෝධයකින් නිර්මාණාත්මක කුසලතාවකින් සම්පූර්ණව, වර්ෂ දහස් ගණනක් අඛණ්ඩව පවත්වාගෙන ආ හෙයින් දෛනික ජීවන ගමන සරලව සැහැල්ලුවෙන්

"ආශාව නිසා ශෝකය හටගනී, බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවහට ශෝකයක් නැත. බියකුත් නැත."



මෙන්ම ප්‍රසන්නතාවෙන් දෙලොව අභිවෘද්ධියකට පැවැති අනුරූප ප්‍රකට වන්නේය.

අද, නකාඩි, සෙසත්, මුරායුධ සිය දහස් ගණනින් නියමිත නිලධරයන් පිළිවෙලින් ගමනයන විට ආගමික, ජාතික හැඟීම් පෝෂණය වන්නේය. ශ්‍රී දළදා වහන්සේ වැඩමවන උදාර පෙරහර මූර්තිමත් කරන්නේ දිවමන් බුදුරදුන් මගමන වඩින විට දෙවියන්, මිනිසුන්, බඹුන් දෙපස හා පසුපස තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් පුද පූජා පවත්වමින් ආනන්දනන්දයට පත්වී ගමන් කළ වගයි.

මහනුවර ශ්‍රී දළදා පෙරහර ලාංකික ජනතාවගේ සියලු කලා මාධ්‍ය සංයුක්ත කරන සොබාදහමින් පුදන ලද මහා සම්පතකි. නර්තනය, වාදනය, චිත්‍ර කලාව, මූර්ති කලාව, ඇඳුම් පැළඳුම් ආදී විෂයයන් මෙන්ම සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, තාක්ෂණ විද්‍යාව යන විෂයයන් පිළිබඳවද නිපුණ බුද්ධියක් පෙරහර කරන්න, කරවන අයට අවශ්‍ය වන්නේය.

අප බුදුරජාණන් වහන්සේ දැක්වූ ශ්‍රී සද්ධර්ම මාර්ගය අලෞකික වින්දනාත්මක හැඟීම් මාර්ගයෙන් හඳුන්වා දීමට උපයෝගී කරගත් ඉතා ලෙහෙසි මාර්ගය පෙරහර මංගල්‍යයයි. පෙර කළ රජ දරුවන් හා ජනතාව තෙරුවන් උදෙසා ආමිස ප්‍රතිපත්ති පූජාවලින් වින්දනාමින, ගරුසරු දැක්වූ ආකාරය ඉතා පැහැදිලිව දකින්නට ශ්‍රී දළදා පෙරහර බැලීම සුදුසු වන්නේය. විශේෂයෙන් අතීතයේ උදාර අවස්ථාවකට යොමා පරිදි අදින, පළඳින, ආයින්නම් සාධික කරන, පූජා භාණ්ඩ, කසා කරන භාණ්ඩ, ගමන මිනින, චලනය ආදී මිශ්‍රණ අදාළ ගේයනාන්තර, කෝටි සංඛ්‍යාත ජනතාවගේ අවධානය උතුම් බුදුදහමේ අභිසිලුන් බව මූර්තිමත්ව ඉදිරිපත් කරන්නට හැකිවීම පෙරහර මංගල්‍යයේ පරමාර්ථයයි.

මිනිස් චින්තනය ප්‍රඥමයෙන් පවතින සම්පර්ශය පරිසරය අනුගතව හැඩගැසී ජීවිතාවය වන්නේය. එය සංසිඳීකිරීමට ඉඩ නොදී උදාර, ප්‍රසන්න හැඟීම් ජනිත කරවන සන්නිවේදන මාර්ගවලින් ජීවන දර්ශනයට මෙන්ම විමුක්ති මාර්ගයට යොමු කරන්නේ නම් එය මහඟු කුසලයකි. මහනුවර ශ්‍රී දළදා පෙරහර තරම් උත්කෘෂ්ට අසහාය උත්සවයක් මිනිලොව කිසිම රටක ඇත්තේම නැත. එයට ප්‍රධාන හේතු කීපයකි.


1. අප බුදුරජාණන් වහන්සේගේ උත්තම තම ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් පැවැත්වීම.
2. අසහාය සන්නිවේදනයට භාජනය වූ අනුහාර දනයක් දම් කඳින් පසස ලැබීම.
3. සිය ගණන් කලාවන් සංයුක්ත වීම.
4. වසර දෙදහස් ගණනක ඉතිහාසයක් ප්‍රකාශනයට පත්වීම.
5. ජීවාත්මක උතුම් ශාසාව ධර්මයක් මූර්තිමත් කිරීම.
6. ජාති, ආගම් භේදයකින් තොරව විවෘත මනසින් රස වින්දනය.

මෙන්නවමලු ප්‍රධාන පවත්වන ඇසළ පෙරහර මංගල්‍යය සිදුකරන සන්නිවේදනයෙන් අපගේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය නමැති අසහාය පහනින් තමන්ගේ මිනිස්ලොවෙහි අවිද්‍යා අන්ධකාරය දුරුවේවා... ප්‍රඥාලෝකය පහළ වේවා...!

දළඹට උදෙව් අප සියලු දෙනාගේ ප්‍රාර්ථනය විය යුත්තේද එයයි.

**පූජ්‍ය අඹුළුපුරේ පියරතන හිමි**

"අත්ත සිව් දුකය. අප්‍රිය නොවිරිය දුකය. අනිත්‍ය ගතින් [illegible] වීටින් දීම දුකය. මේ තුන් සරණයන් නොසැලී දෙවියන් වෙත [illegible]."



# මළවුන් වෙනුවෙන් සිදුකෙරෙන හත් දවසේ පින්කම් පිළිබඳ දුර්මත දුරලමු

කෙනෙකු මිය ගිය පසු සිදුකරන අවමඟුල් චාරිත්‍ර දානමානාදී කටයුතු සම්බන්ධයෙන් පවතින මිථ්‍යා විශ්වාස අපමණය. බුදුරජාණන් වහන්සේ කොතැනකදී හෝ දේශනාකොට වදාරා නැති එවන් මිථ්‍යාවන්හි දැඩි සේ එල්බගෙන සිටිමින් අනවශ්‍ය පීඩාවක් ඇතිකරගන්නා බොහෝදෙනෙක් වෙති. ඒ අතර තමන්ගේ ඥාතියෙකු මිය පරලොව ගිය පසුව සත් දිනක් ඇවෑමෙන් සිදුකරන පුණ්‍ය කටයුතු සම්බන්ධයෙන් පවතින්නේද එවන් මිථ්‍යා ආකල්පයන්ය.

ඒ අනුව කෙනෙකු මිය ගිය පසු සත්වන දිනයේ සංඝයා වහන්සේ නමක් වඩමවා ධර්මය දේශනා කරවීම හා පසුදින සංඝයා දන්ඇනුවත් පැවැත්වීම බොහෝදෙනා අතින් නොපිරිහෙලා සිදුවෙයි.

මෙම ධර්ම දේශනාව පැවැත්වීමේ හා දානය පිළිගැන්වීමේ දිනය බොහෝ අය උත්කර්ෂවත් පූජාවක් කරගන්නා එක් අවස්ථාවකි.

ඒ අනුව ධර්ම දේශනාව මිය ගිය අය ජීවත්ව සිටි දිනයෙන් සංඝයාට දක්ෂිණාව ජීවතුන් අතර නැති දිනයෙන් අනිවාර්යයෙන්ම සිදුවිය යුතුය යන මතයක් දරන පිරිස් බොහෝය. කෙනෙකු මිය ගිය පසු සිදුකරන පුණ්‍ය කටයුතු සම්බන්ධයෙන් එවැනි ගැටලුකාරී තත්ත්වයක් ඇති කර ගැනීම සිදුවිය යුත්තක් නොවේ.

බුදුරජාණන් වහන්සේ කිසිවිටෙක පින්කම් කිරීමට දින වකවානු දේශනාකොට ඇත. නමුත් කෙනෙකු මිය ගිය ආසන්නයේ ජීවත්ව සිටින ඥාතීන්ගේ දුක නැති කර ගැනීමට යථාර්ථය අවබෝධ කරගැනීමට ඒ ආසන්නයේ ධර්ම දේශනාවක් දානමය කටයුත්තක් සිදුකිරීමට යහපත්ය. එය මිය ගිය අයට වඩා ජීවත්ව සිටින්නන්ගේ ජීවිත සනසා කරගැනීමට මහෝපකාරී වන පුණ්‍ය කටයුත්තකි. කෙනෙකු මිය ගිය ආසන්නයේම දුකෙන දැඩි දුක තුනී කර ගැනීමට බොහෝ පිරිසක් එකට එක් රැස් වී සිදුකරන මෙම සත් දින පින්කම උපකාරී වන නිසා එවැනි පින්කම් සිදුකිරීම ඉතා යහපත්ය. නමුත් එය බොහෝ කරදර විඳගනිමින් ඥාතියා මිය ගිය සත් වන දිනයේම සිදුකළ යුතු යැයි නියමයක් නැත.

තමන්ට හැකියාව ඇත්නම් විවේකය ඇත්නම් ඥාතියා මිය ගිය හතර වන හෝ පස්වන දිනයේ වුව ද අපහසුතාවයක් ඇත්නම් දින පටන් දහයක් ඇවෑමෙන් වුවද මෙම පුණ්‍ය කටයුතු කිරීමේ වරදක් නැත.

යම් අයෙකු මිය ගිය පසු හයවන දින ධර්ම දේශනාවක් සිදුකොට සත්වන දින දානය පිළිගැන්විය යුතුය යන්න බුද්ධ දේශනාවක් නොවේ.

බුද්ධ පරිනිර්වාණයෙන් පෝරාණ භාරතයට පමණ පසු යුගයක ඇති වූ මහායාන බුදුදහමට අනුව පැවසෙන එක් මතයක් පදනම් කොටගෙන පෙර කී සත් දින පුනර්භවයක් ඇතිවන තුරු ගත වන කාලය තුළ ඒ මිය ගිය අය අන්තර් භවිකයකු හැටියෙන් ගන්ධබ්බයෙකු ලෙස ගැවසෙන දින හතක කාලයක් පවතින බව පැවසේ. එම අන්තර්භවිකයා දින සතක් යනතුරු පිළිසිඳ ගැනීමට මවුකුසක් සොයමින් සැරිසරන බවත් සත්වන දින අන්තර්භවය හැර ප්‍රතිසන්ධිය ලබන බවත් පවතින විශ්වාසය මත මෙම සත්දිනක් ඇවෑමෙන් සිදුකරන පුණ්‍යකර්මය ආරම්භ වී තිබේ.

චුති සිතට අනතුරුව ඒ සමගම ප්‍රතිසන්ධියක් සිදුවන නිසා චුති හා ප්‍රතිසන්ධිය අතර වෙනත් සිතක් පහළ වීමට කාලයක් නැත. එහෙත් වසුබන්ධු හිමියන්ගේ අභිධර්ම කෘතියෙහි ගන්ධබ්බයකු පිළිබඳව සඳහන් වීම හා සත් දිනක් යනතුරු ගන්ධබ්බ අවධිය පවතිනවා යැයි සඳහන් වීම එලෙස පින්කම් කිරීමට සත්වෙනි දින යොදා ගැනීම කෙරෙහි මුල් වී ඇතැයි සිතිය හැකිය. බුද්ධ ශාසනය පිහිටීමට ලක්ව සිදු ඉන්දියාවේ අවමඟුල් චාරිත්‍ර හා බැඳුණු අනුව දේ ද ඒ අතර සිදුව තිබේ. ඒ වකවානුවේ ජීවත් වූ ගණින්වහන්සේලා නමින් හැඳින් වූ ආගමික වර්ගයක් ඒ පිරිසක් විසූහ.

විවාහකව ගිහි ජීවිත ගත කළද සුදු වස්ත්‍රයෙන් සැරසී ආගමික කටයුතු වල නියැලුණේ මෙම ගණින්වහන්සේලා නමින් හැඳින් වූ පිරිසය. කෙනෙකු මිය ගිය පසුව මෙම ගණින් වහන්සේලා එම මිය ගිය අයගේ නිවසට ගොස් ධර්මය දේශනා කොට එදින එම නිවසෙම ලැගුම් ගන්නා පිරිසක් විය.

ඒ අනුව එදින රාත්‍රියේ මිය ගිය අය නිදාගත් ස්ථානයේ හෝ එම යහනයේම ගණින් වහන්සේලා නිදාගැනීම සිදුවිය. ඒ අතර මිය ගිය අයගේ නිවසේ ජීවත් වූ ඥාතීන් මුලාකොට නිල ප්‍රයෝජන ගත් ගණින් වහන්සේලා පිළිබඳ පුවත්ද පවතී.

තමන් ලැගුම් ගන්නා රාත්‍රියේ මිය ගිය අය වෙනුවෙන පෙනීසිටින ගණින් වහන්සේලා ඒ සඳහා උපක්‍රමයක්ද කර තිබේ. විශාල භාජනයක් පිළියෙල කර එහි තෙල් ගල්වා භාජනයේ ස්ථාන තුනක ගල් ගැට ගසා රඳවා තබනු ලබයි. ඉන්පසු තම නැවීමක් මත දල්වන ලද භාජනය සිදුවා තමා සියල්ලෝම නින්දට යති. භාජනය වියෙන් වියෙන් ඇවිලෙන විට කලින් ගැට ගැසූ ගල් එකින් එක කඩා වැටීමෙන් වැටෙන විට නැගෙන හඬ මිය ගිය ඥාතියාගේ ඇවිදීමේ සද්දය ලෙස ඔවුන් සලකති.

ඒ අවස්ථාවේ මිය ගිය ප්‍රාණකරුගේ ඉල්ලීම් යැයි තමන්ට අවශ්‍ය දේ හඬ වෙනස් කොට ඉල්ලා සිටිමින් යම් යම් දේ ලබාගත් ගණින් වහන්සේලා පිළිබඳවද එද අතීතයට ලැබී තිබේ.

**පූජ්‍ය තෑගොඩ විපස්සි හිමි**



"යකඩයෙන් හැඟුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය පිළිබඳ විශේෂ ක‍ාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

## අප සිටින්නේ කොතැනද?








# බෝධි පූජා මගින් ලෙඩ රෝග සුව කරගත හැකිද?





"අසවලා මට බැන්නේය, මට ගැසුවේය, මා පැරදවූයේය, මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි ඇඩි කොට බැඳ ගනිද්ද ඔවුන්ගේ වෛරය නො සන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# අකීර්ති ජාතකයෙන් හෙළිවන දන්දීමෙහි අනුහස්

මො හඳුරට ගරත් සූර්යා බඳු වූ, තිලොවට ප්‍රදීපයක් වැනි වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩවසන කරන සමයෙහි, එක්තරා දනපති උපාසකයෙකු මුල්කොට මෙම ජාතක කථාව දේශනා කොට වදාළ සේක. ඒ දනපති උපාසක තෙමේ බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට සතියක් මුළුල්ලේ බුදුපාමොක් ආර්ය මහා සංඝරත්නයට මහදන් දී කෙළවර සියලු පිරිකර දන් දුන්නේය. දන් වැළඳීමෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ සිව්වනක් පිරිස මධ්‍යයේ අනුමෝදනා ධර්ම දේශනාව සිදුකළසේක. මෙම උපාසකයාගේ පරිත්‍යාගය ඉතාමහත්ය. මොහුගේ මෙම දන වංශය නම් පුරාතණයේ නුවණැත්තන්ගේ වංශයන්ම වන්නේය. දනය වනාහි ගිහියන් විසිනුත්, පැවිද්දන් විසිනුත් දිය යුතු වන්නේය. පුරාතන නුවණැත්තෝ තවුස් පැවිද්දෙන් පැවිදිව, වනගතව ලුණු නැති දිය පමණක් වත්කොට උයන ලද කරකොළ පමණක් අනුභව කරමින් සිටියහ. එහිදී තමන් වෙත පැමිණි යාචකයන්ට සැහෙන පමණ දී තමනුත් ප්‍රීතියෙන් හා සැපයෙන් දවස් ගෙවූ ආකාරය විස්තර කොට වදළසේක. එවිට උපාසක තැන ස්වාමීනි, මා විසින් දෙන ලද්ද වූ සර්වපරිෂ්කාර දනය මහජනයාට දත හැකි නමුත් ඔබ වහන්සේ විසින් වදරණ ලද මෙම දනය අප්‍රකාශිතය. ඒ අප්‍රකාශිත වූ දනය පිළිබඳව අපට වදළහොත් යෙහෙකැයි පැවසූහ.

එවිට බුදුරජාණන් වහන්සේ අතීත කථාව ගෙනහැර දක්වමින්, බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍ය කරන කාලයේ පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහා බෝධිසත්වයන් වහන්සේ අසූකෙලක් ධන සම්පත් ඇති ධනවත් බමුණු කුලයක උපන්නාහුය. ඔහු නමින් අකීර්ති කුමාරයා නම් විය. ඒ කුමාරයා පය ඔසවා ඇවිදින අවස්ථාවේ නැගණියක් උපන්නාහ. ඒ නැගණිය යසවතී නම් වූවාය. අකීර්ති නම් මහබෝසතාණන් සොළොස් හැවිරිදි වියට පත්වූ විට තක්සිලා නුවරට ගොස් සියලු ශිල්ප උගෙන නැවත ආවේය. ඊට පසු බෝධිසත්වයන්ගේ දෙමව්පියෝ කලුරිය කළාහුය. කලුරිය කළ මව්පියන්ට අවමඟුල් පෙරහර පවත්වා, ඔවුන් ඉතිරිකර ගිය රන් රුවන් මැණික් ආදිය දෙස බලා, මෙපමණ සම්පත් රැස් කළ මවුහු ඒ කිසිවක් රැගෙන නොගොස් මිය පරලොව ගියහ. මෙයින් කලකිරුණු සිත් ඇතිව රැස්කළ වස්තුව පෙනෙන නමුත්, ඒවා රැස්කළවුන් දක්නට නොලැබෙන බව සිතා, ඒ සියල්ලෝම මිය පරලොව ගිය බව සලකා, මම සම්පත් හැරයමි'යි සිතා, නැගණිය තමන් සමීපයට කැඳවා, ඔබ මේ වස්තුව පරිහරණය කරන්න යැයි කියා, තමන් මහණවෙනු කැමැත්තෙමැයි කීහ. එවිට නැගණිය කියන්නී, ඔබවහන්සේ විසින් දමන ලද කෙළ මම මුදුනෙන් පිළිගනිම් ද, මට මින් ප්‍රයෝජනයක් නැත, මමත් මහණ වෙමි'යි කීවාය. අනතුරුව බමුණා රජතුමාට දන්වා, මෙම සම්පත්තියෙන් ප්‍රයෝජන ඇති

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

කෙනෙක් මේ නම් අකිත්ති පණ්ඩිතයන්ගේ ගෙට එන්නැයි අණබෙර ගැසුවා, සතියක් පමණ මහදන් දී වස්තුව නොගෙවෙන නමුත් මගේ ආයුෂ ගෙවී යන්නේය. මේ සම්පත් විඳිමින් සිටීමේ ඇති ප්‍රයෝජනය කුමක්ද? කැමති කෙනෙක් අරගනිත්වා යි රන් රුවන් පිරුණු ගබඩාවල දොරවල් අරවා, මා විසින් දෙන ලෙම දානය කැමති සේ ගන්නැයි කීය. නෑයින් අඬ අඬා සිටියදීම නැගණිය කැඳවාගෙන බරණැස් නුවර වාසල් දොරින් නික්මුණේය.

ඒ අකිත්ති කුමාරයා පිටවූ දොරටුව අකිත්ති ද්වාරය නමින් ප්‍රසිද්ධ විය. එතුමා යම් තොටකින් ගඟට බැස්සේද එතන අකිත්ති තීර්ථය නම් විය. බෝධිසත්වයන් නුවරින් නික්ම තුන් යොදුනක් පමණ තැන් ගොස් සිත්කළු වූ තැනෙක පන්සලක් කරවා, නැගණියත් සමඟ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව විසූහ. බෝධිසත්වයන් මහණ වූ තැන් පටන්, බොහෝ ගම් නියම්ගම්වල, රාජධානිවල මනුෂ්‍යයෝද පැමිණි ප්‍රිය. මේ නිසා මහපිරිවරත්, ලාභසත්කාරත් වැඩි විය. බුද්ධෝත්පාද කාලයක් මෙන් පැවතියේය. ඉක්බිතිතෙන් මහ බෝසතාණන් මේ ලාභ සත්කාර ඉතා මහත් වන්නේය. පිරිවරක් ඉතා අධිකය. මා හුදෙකලාව විසීම වටින්නේ යැයි සිතා රාත්‍රී කාලයෙහි යටත් පිරිසෙන් නැගණියටවත් නොදන්වා ආරාමයෙන් නික්ම කොළී රට කාවීර නම් ගමෙහි උයනක සිට ධ්‍යානාභිඥා අෂ්ටසමාපත්තිය උපදවූහ. එතැන් පටන් මහත්වූ ලාභ සත්කාර ලැබීණ. ඒ ලාභ සත්කාරයන් පිළිකුල් කරමින්, අහසින් ගොස් කාරද්වයිනට පැමිණියහ. එකල කාරද්වයිනා අහිද්ප නම් විය. බෝධිසත්වයෝ එහි මහත් වූ කර ගසක් ඇසුරු කොට පන්සලක් කරවාගෙන වාසය කළහ. බෝධිසත්වයන් එහි වසන නියාව කිසි කෙනෙක් නොදන්නාහ. ඉක්බිතිතෙන් ඔහුගේ නැගණිය නම් සොහොයුරා කොයිදැයි කියා පරීක්ෂා කරමින් ක්‍රමයෙන් කොළී රටට ගොස්, බෝධිසත්වයන් නොදක ඔහු සිටි තැනටම පැමිණියාය. ඇය ධ්‍යාන උපදවන්නට අසමත් වූවාය.

මහබෝසතාණෝ වනාන්තයේ තමන් ලෝකෝත්තර බැවින් කිසි තැනකට නොගොස් එහිම සිට කර ගසේ දළුගත් කැලිති එළ අනුභව කරමින්, කොළ හටගත් විට ඇත් පමණක් වත්කොට උයා අනුභව කළහ. මෙසිද් බෝධිසත්වයන්ගේ සීල තේජසින් ශක්‍රයාගේ පඬුපුල්ආසනය උණු විය. ශක්‍රයා එම ස්ථානයෙන් මා චුතකිරීමට කැමැත්තේ කවුරුදැයි පරීක්ෂා කිරීමේදී අකිත්ති පණ්ඩිතයා දැක, එතුමන් කුමක් නිසා තපස් රකින්නේද බලා, ශක්‍ර සම්පත්ති නිසාද, නැතහොත් අන්‍යයක් නිසාදැයි පරීක්ෂා කරමින් සිතා, එහි පැමිණියේය. මෙම තාපසයා තමන්ම දුකසේ ජීවත වෙයි, දැන් පමණක් වත්කොට කර කොළ අනුභව කරයි. ඉදින් ශක්‍ර සම්පත් පතන්නේ නම් තමන් ඉවූ කර කොළ මට දෙයි, නැත්නම් නොදෙයියි සිතා, යාචක වේශයකින් බෝධිසත්වයන් සමීපයට ගියේය. බෝසතුන් කර කොළ උයා බිම තිබී ගිය පසු අනුභව කරමියි සිතා පන්සල් දොරකඩට වී උන්නේය. එවිට බෝධිසත්වයන් ශක්‍රයා දැක සතුටට පත්ව, ඒකාන්තයෙන්ම යාචකයෙක් දුටු බැවින් මට මහත් ලාභයක් සිදුවිය. අද මගේ මනදොළ සපුරාගෙන දන් දෙන්නෙමි සිතා, කර කොළ ඔවු බඳුන අරගෙන මගේ මේ දානය සර්වඥතඥානය ලබාගැනීම සඳහා හේතුවේවායි යාචකයෙන් පිරී පැමිණි ශක්‍ර දේවේන්ද්‍රයාගේ භාජනයට බෙදූහ. තමුන් දානය ප්‍රීතිය විඳිමින් සිට දුරක් ගොස් අතුරුදන් විය. බෝධිසත්වයෝ දන් දී නැවත කර කොළ නොයිසා නිරාහාරයෙන් ප්‍රීතියෙන් දවස ගෙවූහ. දෙවෙනි දවස ද එසේම කර කොළ උයා පන්සල් දොරකඩට වී උන් කල්හි ශක්‍ර දේවේන්ද්‍රයා යාචක වේශයෙන් අවුත් පෙනී සිටියේය. එදවසත් බෝධිසත්වයෝ දන් දී ප්‍රීති සැපයෙන්ම දවස් ගෙවූහ.

මෙසේ තුන් දවසක් තිස්සේ නිරාහාරව සිටීම නිසා දුර්වලවී නිරාහාරව මධ්‍යාහ්න වේලාවෙහි පන්සලෙන් බැහැරව තමන් දන් දුන් ආකාරය සිහිපත් කරමින් පන්සල් දොරකඩ සිටියේය. ශක්‍ර දේවේන්ද්‍රයා එවිට මේ තපස්වරයා නිරාහාරව තුන් දවසක්ම සතුටු සිතින්ම දන් දෙන්නේය. තාපසයාණෙනි, මෙවැනි ලවණ ජලයෙන් වියලු ආරණ්‍යයක සිට මනුෂ්‍ය සම්පත් ආදී කවර සම්පතක් ප්‍රාර්ථනා කොට හුදෙකලාව තපස් දහම් රකින්නේදැයි විමසීය. එවිට තාපසයා මේ ශක්‍ර දේවේන්ද්‍රයා බව දැන, මා මේ ශක්‍ර දිව්‍යශ්‍රී සම්පත් පතා දෙන දනක් නොවේ. සර්වඥතඥානයම ප්‍රාර්ථනා කොට දන් දුන්නෙමි. නැවත නැවත ඉපදීම ඒකාන්තයෙන්ම දුකක් බැවින්, ඉපදීම ද, පංචස්කන්ධයේ නැසීමද, මරණය ද යන මේ තුන ඒකාන්ත වශයෙන්ම දුක් ගෙන දෙන්නේය. ඒකාන්ත වශයෙන්ම මේ තුන නැති කිරීම සඳහා නිර්වාණය පිණිස තපස් රකිමියි කීය. ශක්‍රයා එවිට සතුටු සිත් ඇතිව සියලු භවයන්හි කළකිරී නිවන් පතා වනයෙහි තපස් රකින හෙයින් සුදුසු වරයක් දෙමියි සිතා, තාපසයෙනි ඔබ විසින් කියන ලද සුභාෂිතය නිසා වරයක් දෙනු කැමැත්තෙමැයි කීය.

එවිට බෝසතාණෝ ශක්‍රයෙනි, ඔබ මට වරයක් දෙනු කැමති නම්, ලෝභය උපදවන යහ මානය ආදී වස්තූන් අවසන් කැනී මගේ සන්තානයේ ලෝභය ඇතිවන කිසිවක් මට අවශ්‍ය නැතැයි කීය. එය ඇසූ සක්දෙව් රජු සතුටුව තමන් වරයක් දෙනු කැමැත්තෙමැයි පැවසීය. එසේ නම් මගේ සිතේ ඇස්, කන්, නාස් ආදිය නැසීමට ප්‍රාණ වදයෙන් හෝ, දණ්ඩනයට පැමිණවීම ආදියෙන් හෝ ඇත්, අස්, ගව, මහිෂාදීන් හෝ රන් රුවන් ආදී සෝ සියලු සම්පත් පිරිහෙන්නේ වෙයි. එබැවින් එවැනි දේ දකිමිට, ඇසීමට නොලැබෙන්නේ නම් මැනවැයි කීය. යළි ශක්‍රයා එවැනි වරයක් ඉල්ලීමට හේතුව විමසූ විට, අඥාන සත්වයන් ඇසින් දකින්නට අසවල් තැන වෙසෙතැයි කනින් අසන්නට නොලැබෙන එවැනි නුවණ නැති සත්වයන් සමඟ එකතුව නොවිසීමට නුවණ නැත්තා වූ අඥානයන් අකාරණය කාරණය යැයි ගන්නේය. ප්‍රාඥයානය නොට ජීවත් වෙති. අඥාන පුද්ගල කාරියය ලෙස සලකති. ශුද්ධව හා ප්‍රඥාවේ නොයොදා අකාර්යයෙහි යොදවන්නේය. ප්‍රාඥයානෝ දුශ්ශීල කර්ම යහපත් සේ ගනිතියි කියා, ශක්‍රයෙනි, ඔබ මට වරදීමට කැමති නම් නුවණැති සත්පුරුෂයන් නාමමවලෙම දකිමිට, අසවල් තැන සිටින්නේ යැයි ඇසීමට, මෙලොව පරලොව දන්නා නුවණැති සත්පුරුෂයන් හැමවේලෙම දකිමිට, ඔහුත් සමඟ හැමවේලෙම විසීමට වරයක් දෙන්න යැයි ඉල්ලීය. එවිට සක්දෙව් රජු සත්පුරුෂයන් දකිමට හේතුව කවරේදැයි විමසීය. එසේ නුවණැතියන් ඇසුරට හේතුව කුසල කර්මයන්හි යෙදෙන හෙයින් ද, කාරණයන් කී කල්හි නොකිපෙන බැවින් ද, අවවාද පිළිගන්නා බැවින් ද, සුවරිතයෙහි යෙදී කුසල කර්මයන්හි යෙදෙන බැවින් ද සත්පුරුෂයන් සමඟ එකතිව යහපතැයි කීය.

එයිනට සතුටට පත්වූ ශක්‍රයෝ නැවත වරයක් ගන්නැයි කීහ. එවිට බෝධිසත්වයෝ, ඔබ වරයක් දීමට කැමති නම් මේ රාත්‍රිය ඉක්ම ගොස් පෙරට ඉර නැගෙන වේලෙහි දිව්‍ය භෝජනය පහළ වේවායි, ඒ භෝජනය දෙන්නාට යාචකයෝ මා සමීපයට පැමිණේවායි දන්වූහ. එසේ දන්දෙන්නා වූ මගේ වස්තුව නොගෙවී, දන් දී පසුතැවිල්ලකට නොපැමිණෙම් වෙයිදැ එසේ සිත පහදවන වරයක් ලැබීමට කැමැත්තෙමැයි කීය.


එයද සතුටු වූ ශක්‍රයෝ නැවත වරයක් ගන්නැයි කීහ. ශක්‍රයෙනි, ඔබ නැවත වරක් මා සමීපයට නොඑන්නේ නම් පළමුක යළි වරයක් ගන්නෙමියි කීය. එවිට ශක්‍රයෝ අකිත්ති පණ්ඩිතයෙනි, දානය, සිල් රකිම ආදී වූ නොයෙක් පිළිවෙත් කොට බොහෝ ස්ත්‍රී පුරුෂයෝ මා දකින්නට කැමතිව මනුෂ්‍ය ලෝකයෙන් අවුත් මා සමීපයේ උපදිති. එසේ වූ මා දක්නෙහි ඔබට කුමන බියක් ඇතිවෙයිදැයි විචාළහ. ශක්‍රයෙනි, නොයෙක් ශ්‍රී සම්පත්ති දක, ශක්‍ර සම්පත් පතන්නට පෙළඹෙන්නේ නම් මා නිවන් ප්‍රාර්ථනා කිරීමෙහි ප්‍රමාද ශක්‍ර සම්පත්තිය සඳහා පෙළඹෙන්නේ යැයි බය ඇත්තෙමි. එවිට ශක්‍රයෝ සතුටුව, ස්වාමිනි, මෙතැන් පටන් ඔබ වහන්සේ සමීපයට නොඑන්නෙමියි ප්‍රතිඥා දී, බෝධිසත්වයන් වැඳ දිව්‍ය ලෝකයට ගියහ.

බෝසතාණන් වහන්සේ මෛත්‍රී කරුණාදි බ්‍රහ්ම විහරණ භාවනා කොට නොපිරිහෙනා වූ ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයේ උපන්නාහ. බුදුරජාණන් වහන්සේ ඒ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා අකිත්ති ජාතකය නිමවා වදාළසේක. එකල ශක්‍ර දේවේන්ද්‍රයෝ නම් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේය. අකිත්ති පණ්ඩිතයෝ නම් බුදු වූ මමම වෙමියි දේශනා කොට වදාළසේක. මෙම අකිත්ති ජාතකය තුළින් හෙළිවන, ඇතුරින් දන්දීමෙහි බැලී නොවීමට අධිෂ්ඨාන කර ගනිමු.

**කේ. මීගහකුඹුර**

# මෙලොව සැප ගෙන දෙන - සතුට ගෙන දී ඵල දෙන
# දෙළොස් කරුණකි දහ මෙන - අසා දැන ගත් සැම දෙන

ක්‍රිස්තු පූර්ව හයවන ශත වර්ෂයෙහි ලොව පහළ වූ ශාස්තෘවරයාණන් වහන්සේ බෞද්ධ දර්ශනයෙහි නිර්මාතෘත්වය මගින් ආගමික සංහිඳියාවකින් සමාජයීය ප්‍රගමනයෙහි පෙර ගමන්කරුවන් වශයෙන් ධර්මය පූර්වගාමීත්වයෙහිලා තබා කටයුතු සිද්ධ කිරීමට වග බලාගත්හ. එහි ප්‍රතිඵල වශයෙන් සියවස් ගණනක් වර්තමාන සමාජ සංදර්භය දක්වා විවිධ ආගමික උපලබ්ධීන්ගෙන් පරිග්‍රහණය වූ ලෝකය සුන්දරත්වය පරීක්ෂා කිරීමට හා මානව අයිතීන් සංරක්ෂණය කිරීමට වග බලා ගත්හ. මෙම ලිපිය මගින් අවධාරණය කරනු ලබන්නේ ධම්ම පදය නමැති බෞද්ධයාගේ අත්පොත ලෙස ප්‍රජාර්ඝත්වයට ලක් වූ ග්‍රන්ථයෙහි විසිතුන්වන නාග වග්ගයේ අවසන් ගාථාත්‍රයට අදාළ ධර්ම කරුණු පැහැදිලි කිරීමකි. භාග්‍යවතුන් වහන්සේ වසවර්ති මාරයාගේ උපායශීලීත්වය හමුවේ ඔහුට ප්‍රත්‍යුත්තර වශයෙන් දේශනා කරන්නට යෙදුන ධර්ම සාකච්ඡාව සවිස්තර කිරීම සමාජය බොදුනුවන්ගේ දැනුම් පිපාසය සන්සිඳුවන නිසාවෙනි. මෙම සිද්ධිය අරභයා වසවර්ති මාරයා හා භාග්‍යවතුන් වහන්සේ අතර ඇති වූ සංවාදාත්මක කථා ප්‍රවෘත පහතින් දක්වන්නෙමු.



● යටගිය දවස හිමාල වනයෙහි අරණ්‍ය කිලියක හෙවත් වනයේම සකස් කරන ලද කුටියක භාග්‍යවතුන් වහන්සේ වැඩ වාසය කරන සමයෙහි බොහෝ රජවරු අධාර්මික ක්‍රියා මගින් රට වැසියන්ට හිංසා පීඩා කරමින් අධාර්මික උපක්‍රම භාවිතා කරමින් අදැහැමින් පරිපාලනය කරන නිසාවෙන් වැසියන් බොහෝ සෙයින් චිත්ත පීඩාවට පත්ව සිටින අයුරු සකල මහා කරුණා ඥානයෙන් බුදුරජාණන් වහන්සේ දුන "අයහපත් වූ අයුරින් දඬු මුගුරු නොගෙන රට වැසියන් සතුටුවා යහපත් ලෙස රජය පාලනය කරන්නට රජවරුන්ට පිළිවන් වේත්" යන වග කරුණා මෛත්‍රී (පෙරදුරි) පූර්වංගම සිතින් වදළහ. මෙම සිතුවිල්ල එකෙණෙහිම වසවර්ති මාර පුත්‍රයාට සැලැස්විය. එහෙත් පිවිතුරු වූ මුදිතා ගුණෝපේත කල්‍යාණ ලක්ෂණෝපේත අසම්සම අනාථ නාථයන් වහන්සේ සිත නොදන මුලාවට පත් වූ මාර දිව්‍ය පුත්‍රයා මෙසේ සිතීය. "බුදුරජාණන් වහන්සේ මෙලෙසවෙහි මහණ දම් පසෙකලා රජකම් කිරීමට සිතයි, ජනයා පාලනය කිරීමට සිතයි, එයට අනුබල දීමට වාසියකි. එසේ එය කරවන්නෙමි" යනුවෙනි. බුදුරදුන් වෙත පැමිණි වසවර්ති මාරයා "භාග්‍යවතුන් වහන්ස, රජවරු අධාර්මිකව රාජ්‍යය විචාලන්නේය, දඬු මුගුරුගෙන බොහෝ වැසියන්ට හිංසා පීඩා කරමින් අකටයුතුකම් මගින් අධාර්මිෂ්ටව පාලනය කරන්නේය. එහෙයින් ඔබ වහන්සේ රාජ්‍යය භාරගෙන දැහැමින් රජකරවන සේක්වා, මම ද එයට සහායවන්නෙමි" මෙසේ පවසන ලද මාරයා වෙත භාග්‍යවතුන් වහන්සේ "මාර දිව්‍ය පුත්‍රය තුමක් නිසාවෙන් තුම මෙවැන්නක් කියන්නෙහිද....." වසයි බස් දෙඩවන මුවාවෙන් මාර දිව්‍ය පුත්‍රයා "ඔබ වහන්සේ සිතූ දෙයක් ඉටුවන්නේය, සිතූ දෙයක් යහපත්ය." එබැවිනි.

"මාර දිව්‍ය පුත්‍රය අපට රටක් පාලනය කිරීමට හැකිද?" යනුවෙන් බුදුරදුන් නැවත ප්‍රශ්න කළ විට "භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ හිමාලය වනය රත්තරන් බවට පත්වේවායි යන්න සිතුවොත් එය ඔබත් ආනුභාවයෙන් සිද්ධ වීම සත්‍යයකි." මාරයා මෙසේ දිගින් දිගටම කරුණු පැවසීම ඔහුගේ අදහසක් මස්තක ප්‍රාප්ත කිරීමේ පහත් මානසිකත්වය පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ නුවණින් දුන මාර දිව්‍යපුත්‍රයාගේ මෙම සිදුවීම ප්‍රධානකොටගෙන ඒ අරභයා කරුණු දොළහකින් සමන්විතව වූ පුද්ගලයාගේ මෙලොව දිවිය සැපසේ වාසය කරන බව දේශනා කරමින් කරුණු දොළහකින් සමන්විත ගාථාත්‍රයක් දේශනා කරන ලදි. මෙලොව ජීවත් වන්නා වූ පුද්ගලයාගේ හිතසුව පිණිස පවතින එම කරුණු තිහිපය මෙසේය.

1. **යම් කිසි කටයුත්තක් සිදු කිරීමේ දී කල්‍යාණ මිත්‍ර සහායකයන්ගේ සහභාගිත්වය සැප පිණිස වේ.**
**(අත්ථම්හි ජාතම්හි සඛායා සුඛා)**
2. **තමා පිළිබඳව මිහිරි හෝ අමිහිරි වූ බොහෝ වූ ද තමා පිළිබඳව කටයුත්තකින් සන්තෝෂ වීම සැප පිණිස වේ.**
**(ඉතිරීතරෙන යා තුට්ඨී සා සුඛා)**
3. **ජීවිතයට නියමිත ආයුෂ ගෙවී ගිය විට මරණයට සම්පව කරන කුසලය සැප පිණිස වේ.**
**(ජීවිත සංඛයම්හි පුඤ්ඤං සුඛං)**



4. සියලු දුක්ඛයන් ප්‍රහීණය කිරීම සැප පිණිස වේ. (සබ්බස්ස දුක්ඛස්ස පහාණං සුඛං)
5. මවට සැලකීම සැප පිණිස වේ. (ලොකෙ මත්තෙයතා සුඛා)
6. පියාට සැලකීම සැප පිණිස වේ. (ලොකෙ පෙත්තෙයතා සුඛා)
7. පැවිද්දන් කෙරෙහි මනා පිළිවෙත් ඇති බව සැප පිණිස වේ. (ලොකෙ සාමඤ්ඤතා සුඛා)
8. පව් බැහැර කළ බමුණන් කෙරෙහි මනා පිළිවෙත් කිරීම සැප පිණිස වේ. (අථො බ්‍රාහ්මඤ්ඤතා සුඛා)
9. ජරාවට පත්වන තෙක් සිල් රැකීම සැප පිණිස වේ. (යාව ජරා සීලං සුඛං)
10. ශ්‍රද්ධාවන්ත වීම සැප පිණිස වේ. (සද්ධා පතිට්ඨිතා සුඛා)
11. ප්‍රඥාව, නුවණ ලැබීම සැප පිණිස වේ. (පඤ්ඤාය පටිලාභො සුඛො)
12. පව් ක්‍රියා, අකුසල් ක්‍රියා නොකිරීම ඉන් වැළකීම සැප පිණිස වේ. (පාපානං අකරණං සුඛං)

මෙලොව පරලොව දිවිය සැපවත් කර ගැනීමට අවශ්‍ය කරන කරුණු කාරණා බොහෝමයක් බුදු දහම මගින් අවධාරණය කරන අතර එහිලා පහත කරුණු කිහිපයද අතිශය වැදගත් තත්හිලා සලකන්නෙමු. රටක, සමාජයක ගමක නගරයක මූලික සංවිධානය වන පවුල තුළ ජීවත් වන සමාජීය පුද්ගලයා නිවැරදි දිවියක් ගත කිරීමට ඔවුනොවුන්ගේ නිදහස් සිතුවිලි, චංචල සිතුවිලි පිළිවෙළකට සකසුරුවම් කොටගෙන අරුත් බර දිවියක් ගත කිරීමට අවශ්‍ය කරන කරුණු කිහිපයක් ඉන් අවබෝධ කරයි. වර්තමාන සමාජ වපසරිය තුළ මෙන්ම භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ අවධියෙහිද සමාජ සංදර්භය තුළ පැවති එම විෂමතා කලහකාරී ස්වරූපයන් උපසමනය කිරීමට පාලක හා පාලිත සමාජ ස්ථරයන් ඔවුන්ගේ වගකීම් ක්‍රමානුකූලව හා ධාර්මිකව සිදුකිරීම බුදු දහම අනුමත කරයි. (ධම්මිකො ධම්ම රාජා) රජතුමා ධාර්මිකව රාජ්‍ය පාලනය කරන විට කොහොඹ පතු පවා මිහිරි වන බව ජාතක කතාකරුවා පැහැදිලි කිරීමෙන් ප්‍රයත්නය දරන්නේ මානුෂීය සිතුවිලි දහරාව (චිත්තවීථි) ස්වභාවධර්මයා තුළටද සංවේදී වන්නා වූ බවයි. ඒ නිසාවෙන් ඒක පුද්ගල චර්යාව විෂම චර්යාවෙන් ව්‍යුක්තව සම චර්යාව, ධර්ම චර්යාව කෙරෙහි යොමු කිරීම සාමය, සමගිය ඇති කරලන රමණීය ප්‍රශාන්ත සමාජ වටපිටාවක් කෙරෙහි ධර්ම මාර්ගය මාර්ගෝපදේශකත්වය සනිටුහන් කරන වග මෙයින් සිහිපත් කර සිටින්නෙමු.

යහපත් වූ සමාජ සංහිඳියාවක් ඇති කිරීමෙහිලා මෙම කරුණු බොහෝ සෙයින් උපකාරී වුවද වර්තමාන සමාජය පිළිබඳවද මෙම ධර්මාන්වය ප්‍රතිශතයක් වශයෙන් ගෙන සංසන්දනය කළ යුතුය. එහිදී වැඩිපුර ප්‍රමාණයක් මෙම කරුණුවලට ප්‍රතිවිරුද්ධ පක්ෂයෙහිලා කටයුතු කරමින් සුඛ වින්දනය කරනවා යැයි මිථ්‍යා සංකල්පයක නිමග්න වීම අන්ධ වූ පුද්ගලයකු හස්ති රාජයකුගේ අග පසග කියන්නාක් වැනිය. ඒ නිසාවෙන් තමා නිවැරදි යැයි සිතනා දෙය ධර්මය නොවන බවත්, තමා වැරදි යැයි සිතන දෙය වරද නොවන බවත්, එය ස්වකීය අවබෝධය දනුම, ඥානය මත පදනම්ව පවතින බවත් ධර්මය ධර්මය ලෙස ලොව පවතින නිසාවෙන් එව අවබෝධ කර ගැනීමට ප්‍රයත්නය දැරිය යුතුය. සිත් සතන්හි ජනිත වන්නා වූ සිල බලය, කුල බලය, බල බලය, ධන බලය ආදී බලකාමය පසෙකලා මොහොතක් ධර්ම බලය චිත්තාභ්‍යන්තරයෙහි වර්ධනය වන බව නිතර නිතර සිහිපත් කළ මනාය.

යථෝක්ත සදුපදේශයන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ලද්දේ මිථ්‍යා දෘෂ්ටික සමාජය සම්‍යක් දෘෂ්ටික ස්ථරායණය කෙරෙහි යොමු කිරීමෙහිලා මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ඉතාමත් කරුණාවෙනි. අජීවී සජීවී සාධක අතර විශ්වීය සන්දර්භය තුළ මානව වර්ගයා ප්‍රධානවන්නේත් ඒ නිසාවෙනි. ඔවුන් ධර්මානුකූලව ස්වකීය සංහිඳියාව මපවත් කරගැනීම මෙහි ලෞකික පාර ලෞකික සුබාර්ථ අධිගමනය පිණිස පවතින්නේය.

රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පාලි විශේෂවේදී
තෙවන වසර, පේරාදෙණි විශ්ව විද්‍යාලය
කොටපොල සුමේධ හිමි



# ඉඳුරන් පිනවීමෙන් ලබන සතුටක් නැත

ලොව උපදෙන සත්වයන්ගේ වින්දනය විවිධාකාර වන්නේය. එකම පවුලේ සාමාජික සාමාජිකාවන් ගත්තත් ඒ අයගේද වින්දන ස්වභාවයන්, ගති පැවතුම්, ආකල්ප, ක්‍රියා පටිපාටිය, සසර වාසනා ගුණය, උගත්කම, වැටහීම් ආදිය එකිනෙකාට වෙනස් වන්නේය. ද්වාරයන්ගෙන් ලබන වින්දනය තුළින් සිතේ හටගන්නා ක්ලේශ ධර්ම නිසා විවේකය හා නිදහසද සීමා වන්නේය. එසේ විවේකය අහිමි කර ගනිමින් භෞතික ලෝකයේ සතුට සොයා ගියත් සිත් තැවුල් ශෝක පරිදේවයන්ගෙන් අඩුවක් නැත.

ඉපදී මැරී නැවත ඉපදී දුක් විඳිමින් යන මේ සසර ගමන ඉතා දීර්ඝය. එහි මුලක් නොපෙනේ. පෙර සසරේ පුණ්‍ය මහිමයෙන් මිනිසත් බව ලැබුවද එයින් අප සැබෑ ඵල ප්‍රයෝජනයක්, චිත්ත විවේකයක් ලබනවාද? භව ගතරින් එතෙර වීමට විවේකය සහ නිදහස නිවැරදිව භාවිත කරනවාද? ඒ සඳහා අවශ්‍ය උත්සාහයක යෙදී තිබෙනවාද?

මේ අප විමසා බැලිය යුතු කාරණය.

පස්කම් සැපතම සැනසිල්ල හා සතුට බවත් එයින් තොර සැපතක් නැති බවත් පුහුදුන් ජනයා සිතති. ඒ නිසා බොහෝ වෙහෙස වී ද්වාරයන්ම සතුටු කර ගැනීමට කටයුතු කරති. මෙහි තියකරු ස්වභාවය නොපෙනෙන නිසා එහි ඔත් වීමට පත් වෙති. භවය සකස් කරති. එයින් යළි යළිත් ජාති, ජරා, ව්‍යාධි මරණයම සකස් වෙයි.

ලොව උපදෙන සත්වයන්ගේ වින්දනය විවිධාකාර වන්නේය. එකම පවුලේ සාමාජික සාමාජිකාවන් ගත්තත් ඒ අයගේද වින්දන ස්වභාවයන්, ගති පැවතුම්, ආකල්ප, ක්‍රියා පටිපාටිය, සසර වාසනා ගතිය, උගත්කම, වැටහීම් ආදිය එකිනෙකාට වෙනස් වන්නේය. ද්වාරයන්ගෙන් ලබන වින්දනය තුළින් සිතේ හටගන්නා ක්ලේශ ධර්මනිසා විවේකය හා නිදහසද සීමා වන්නේය. එසේ විවේකය අහිමි කර ගනිමින් භෞතික ලෝකයේ සතුට සොයා ගියත් සිත් තැවුල් ශෝක පරිදේවයන්ගෙන් අඩුවක් නැත.

ඇස මුල් කරගෙන විවිධ දර්ශන නරඹා බොහෝ කොට වින්දනය සොයන අය ජන සමාජයේ ජීවත් වෙති. ඒ පිරිස් ඇස සතුටු කරවීමට මහත් උත්සාහයක් දරති. ධනයද වියපැහැදම් කරති. ලොව ඇස මුලාවට පත් කරවන, මත් කරවන, අකුසල ඇති කරවන දර්ශන පිළිබඳව නුවණින් විමසා බලා කටයුතු කිරීම ඇවැසිය. මේ පිළිබඳ උදාහරණයකින් වටහා ගනිමු. අලි ඇතුන් සහිත පෙරහරක් දෙස බලා සිටින කෙනාතුට ඇති වන චිත්ත සංස්කාර විමසුමට ගනිමු.

අලියාට අන්දවා ඇති විචිත්‍ර ඇඳුම් දෙස බලා සතුටු වෙයි. යහ ගමන් ලකාව, පා සටහන්, හොඬවැල, ඇත් දළ, විශාලත්වය, වටිනාකම සහ වෙනත් නැටුම්, ක්‍රීඩා බලා සතුටු වෙයි. අලි ඇතුන් ආදී සතුන් පත්ව සිටින ඉරණම, තිරිසන් ලෝකයේ දුක පිළිබඳ සිහිපත් කරන්නේ නැත. වැස්සෙන් පින්නෙන් අව්වෙන් වන පීඩාව, ව්‍යාධි රෝග මෙන්ම ආහාර පානාදිය සඳහා දරිය යුතු පිරිවැය ගැනද සිතන්නේ නැත. එම සතුන්ගෙන් දිවා රාත්‍රී ගන්නා වැඩ ප්‍රමාණය, සතුරු කරදර ඇතුළු දුක්ඛයන් හා වධ වේදනා, හිංසා ගැන සිතා "අහෝ! මාත් සසර අපායට වැටී මෙවන් දුක් වේදනාවට කොපමණ වාර ගණන් හසුවී දුක් විඳින්න ඇතිද? තවමත් සිත මේ රාගාදි ක්ලේශයන්ගෙන් පිඩා විඳිනවා. සසර කලකිරීම ඇති කරගෙන දුකින් මිදීමට වෑයම් කළ යුතුයි. ඒ සඳහා කුසල් දහම් වැඩිය යුතුයි" යනාදී වශයෙන් කල්පනා කරන පිරිස ස්වල්ප වන්නේය. මෙසේ මිසදිටු පිරිස වන උද්‍යානවල සිර කර සිටින වන සිවුපාවුන්, පක්ෂීන්, සිංහ හා ව්‍යාඝ්‍රයන් ආදී සතුන් දෙස බලා මහත් සතුටට පත් වෙති. එය පුහුදුන් සිතේ ස්වභාවය වන්නේය. සරාගී සිතිවිලි ගොඩනගන බොළඳ චිත්‍රපටද ද්වේශය වර්ධනය වන ත්‍රාසජනක චිත්‍රපටද නරඹා මහත් ලෙස සිත ලෙඩ කර ගන්නෝ බොහෝ වෙති. මෙසේ මත් වූවන්ගේ සිත මෙපරිදිය.

- හීන පැත්තටම ඇදී යන්නේය.
- ගැමි දහමටම ඇදී යන්නේය.
- උමතු භාවයට, විකාර භාවයට පත් වන්නේය.
- ජීවිතවලට අනර්ථයන්ම කරගන්නේය.
- නැවත නැවත ඉපදී මැරී සසරටම වැටෙන්නේය.
- සසර බියකරු බව දුක කාමයන්ගේ ආදීනව දුක කලකිරීමක් ඇති නොවන්නේය.
- කෙලෙස් සමනයක් නොවන්නේය.
- ලොව පරම සත්‍යය වන ත්‍රිලක්ෂණය (අනිච්ච, දුක්ඛ, අනාත්ම) අවබෝධ නොකරන්නේය.
- විරාගය පිණිස නොවැටෙන්නේය.
- ආර්ය සත්‍ය සතර අවබෝධ කර නොගන්නේය.
- නිවන් අවබෝධය නොකර ගන්නේය.
- ශෝක, පරිදේව, දුක්ඛ දෝමනස්සයන්ගෙන් නොමිදෙන්නේය.

මෙසේ පාණීය සුවය අග්‍ර සැපය ලෙස සිතන්නෝ සාරය සහ අසාරය තෝරා බේරා නොගනිති. තමාගේ අධ්‍යාත්මයේ පිරිසිදු අපිරිසිදු භාවය විනිවිද දකින්නේ නැත. කුසල අකුසල කර්මයන් හඳුනන්නේ නැත. විවේකය අවිවේකය කුමක්ද කියා තේරුම් කර ගැනීමට උත්සාහයක් දරන්නේම නැත. තුණුරුවන් කෙරෙහි විශ්වාසයක් නැතිව කටයුතු කරති. සරණ භාවයට පත් නොවෙති. මිථ්‍යාවට වැටී අවිද්‍යාවේම ගිලෙති.

ඔබ මේ සියල්ලෙන්ම මිදිය යුතුවේ.

පූජ්‍ය පොල්ගහවෙල බිතහානි හිමි

3 වැනි පිටුවෙන්


## සැබෑ බෞද්ධයෙකු වීමට නම්....!

එවිට එය රූප උපාදාන ස්කන්ධයක් බවට පත්වෙනවා. ඒ වාගේම එසේ සිතට අරමුණ වූ රූපයට සිත සතුටු කරවන සුව වේදනාවක් හෝ සිත රිදවන දුක්ඛ වේදනාවක් හෝ වේදනාමය ශක්ති විශේෂයක් තණ්හාව සමඟ මිශ්‍ර වූ විට වේදනා උපාදානස්කන්ධය උපදිනවා. සිතේ ඒ වේදනාව (විඳීම) තදින් ඇඳිනවායි ඉන් සිදු වන්නේ. එළඹුනට ඒ අරමුණු වූ රූපයන් නිසා උපදින සඤ්ඤා (දැනීම, හඳුනා ගැනීම) ශක්ති විශේෂය තණ්හාව සමඟ මිශ්‍ර වීම මත් සඤ්ඤා උපාදාන ස්කන්ධය උපදිනවා. අරමුණු වූ රූපයන් නිසා හටගන්නා චේතනා විශේෂයන්ගේ සාරය (බාර ගැනීම) තණ්හාව සමඟ මිශ්‍ර වී සංඛාර උපාදාන ස්කන්ධය ඇති වෙනවා. මේ අරමුණු දැනීම, විඳීම, දැනුම හා සාරය එකතු වීම නිසා සිතේ උපදින ශක්ති විශේෂය තණ්හාව සමඟ මිශ්‍ර වීමෙන් විඤ්ඤාණ උපාදානස්කන්ධය ඇති වෙනවා.

"ඇසට රූපයත්, කනට ශබ්දයත්, නාසයට ගඳ සුවඳත්, දිවට රසයත්, ශරීරයට ස්පර්ශයත්, මනසට සිතුවිලිත් ස්පර්ශ වූ විට, ගැටුණු විට, අරමුණු වූ විට තණ්හාව සමඟ මිශ්‍ර වීම නිසා එය සිතට අල්ලා ගැනීම හේතු කොට ගෙන මේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන උපාදානස්කන්ධ පහ උපදිනවා.

"බුදු දහමේ පටිච්ච සමුප්පාද ධර්මයන් යැයි හඳුන්වා ඇත්තේ මේ උපාදානස්කන්ධයන්මයි. 'යමකු පටිච්ච සමුප්පාදය දකී නම් හේ ධර්මය දකී. යමෙක් ධර්මය දකී නම් හේ පටිච්ච සමුප්පාදය දකී' යැයි බුදුරජාණන් වහන්සේ වදළ බව මජ්ඣිම නිකායේ මූල පන්නාසකයේ තුන්වෙනි වග්ගයේ මහා හත්ථි පදෝපම සූත්‍රයේ සඳහන් වෙනවා. ඒ නිසා සැබෑ බෞද්ධයකු වීමට නම් මේ උපාදානස්කන්ධ ශක්ති විශේෂය පිළිබඳ අවබෝධයක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා ඔබ දහම් පෙළ ගැසෙන්න.


**පූජ්‍ය බෙල්ලන ඥානවිමල හිමිගේ "අපට නොපෙනෙන ලෝකය" කෘතියෙන් උපුටා ගන්නා ලදී.**



# බුදු සසුනයි මහ මුහුදයි

බුදු සසුනේ ඇති ආශ්චර්යමත් කාරණා අටක්, මහ මුහුදේ ඇති ආශ්චර්යමත් කාරණා අටක් සමඟ උපමා කොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබුවේ අසුර නායකයකු වන පහාරාද යන අසුර දෙවියාටය. බුදුරජාණන් වහන්සේ විවේකීව වෙසෙන අවස්ථාවකදී බුදුරජාණන් වහන්සේගේ සුව දුක් විමසීමට පැමිණි පහාරාද දෙවියන් බුදුරජාණන් වහන්සේ සමඟ පැවැති සාකච්ඡාවකදී බුදුරජාණන් වහන්සේ විසින් මෙම සූත්‍රය වන පහාරාද සූත්‍රය දේශනා කරනු ලැබුවේය. පහාරාද දෙවියන්ගෙන් බුදුරජාණන් වහන්සේ විසින් මහ මුහුද ගැන විමසීමේදී මහ මුහුදට අසුරයන් ප්‍රියතාවයක් දක්වන්නේ කෙසේදැයි විමසීය. එහිදී පහාරාද දෙවියන් පහත සඳහන් ආශ්චර්යමත් කාරණා අට නිසා අසුරයන් මහ මුහුදට ප්‍රියත්වයක් දක්වතියි පැවසූහ. ඒ ආශ්චර්යමත් කාරණා අට මහ මුහුදේ තිබෙන්නේ මෙලෙසිනි.

1. මහ මුහුදේ පටන් ගැනීම ගැඹුර අඩුය. මහ මුහුදට පිවිසෙන්න පිවිසෙන්න එහි ගැඹුර ක්‍රමයෙන් වැඩිවන්නේය. මෙය මහ මුහුදේ ඇති පළමු ආශ්චර්යමත් කාරණයයි.
2. මහ මුහුද වෙරළ ඉක්මවා නොයයි. මෙය මහ මුහුදේ ඇති දෙවන ආශ්චර්යමත් කාරණයයි.



3. මහ මුහුදේ මලකුණු නොරැඳෙයි. මෙය මහ මුහුදේ තෙවන ආශ්චර්යමත් කාරණයයි.
4. මහ මුහුදට කුමන ගංගාවකින් ජලය ලැබුණත් මහ මුහුදට ආව පසු එහි පවතින්නේ එකම ජලයයි. ජලයේ වෙනසක් නොවෙයි. මෙය මහ මුහුදේ සිව්වන ආශ්චර්යමත් කාරණයයි.
5. මහ මුහුදේ කොතැනකින් දිය බිඳක් ගත්තත් එහි ඇත්තේ එකම රසයි. මෙය මහ මුහුදේ පස්වන ආශ්චර්යමත් කාරණයයි.
6. මහ මුහුදට කොපමණ ජලය ලැබුණත් එහි නියත තත්ත්වයෙහි වෙනසක් නොවෙයි. මෙය මහ මුහුදේ ඇති සයවන ආශ්චර්යමත් කාරණයයි.
7. මහ මුහුදේ වටිනා සම්පත් ඇත. මෙය මහ මුහුදේ සත්වන ආශ්චර්යමත් කාරණයයි.
8. මහ මුහුදේ මහ විශාල සතුන් ඇත. මෙය මහ මුහුදේ ඇති අටවන ආශ්චර්යමත් කාරණයයි.

බුදුරජාණන් වහන්සේට ඉහත ආකාරයෙන් පිළිතුරු දුන් පහාරාද අසුර දෙවියා බුදුරජාණන් වහන්සේගෙන්ද පැනයක් විචාළේය. එම පැනය වන්නේ බුදු දහමට, බුද්ධ ශාසනයට වෙනත් මිනිසුන් කැමති ඇයිද යන්නයි. බුදුරජාණන් වහන්සේ ඉතා සරලව දුන් පිළිතුර වූයේ ඉහත දක්වූ කාරණා අටම නිසා බවය. එවිට එය මනාව තේරුම් ගැනීමට නොහැකි වූ පහාරාද වැඳ නමස්කාර කර එය පහදන ලෙස ඉල්ලා සිටියේය. බුදුරජාණන් වහන්සේ පහත පරිදි එකිනෙක පහාරාද දෙවියන්ට පහදා දුන්නේය.

### මහ මුහුදේ ඈතට යාමේදී ගැඹුර වැඩිවන බව


මහ මුහුද පටන් ගන්නේ ඉතාම අඩු ගැඹුරකින්ය. මහ මුහුද ඇතුළට යන්නට යන්නට ගැඹුර ක්‍රම ක්‍රමයෙන් වැඩි වන්නේය. මේ ස්වභාවය ආශ්චර්යමත් කාරණයක් ලෙස දෙවියන් දකින්නේය, සිතන්නේය. එලෙසම බුදු දහමට ඇතුල් වන්නේ ඉතාම සරල ආකාරයෙනි. බුදු දහම තුළට පිවිසෙන්නට පිවිසෙන්නට ගැඹුර වැඩි වේ. කෙනෙක් ශ්‍රද්ධාව මුල් කරගෙන තෙරුවන් සරණ යයි. එවිට වීර්යය, සතිය, සමාධිය හා ප්‍රඥාව යන බලධර්මයන් වැඩීමට පටන් ගනී. එනම් ශ්‍රද්ධාව යනු මහ මුහුදේ අඩුම ගැඹුර ඇති පටන් ගන්නා තැන වැනිය. තුණුරුවන් සරණ යන බෞද්ධයා පසුව ක්‍රමානුකූලව ගැඹුරු දහම වෙත එයි. මහ මුහුද ගැඹුරට යනවා සේම බුදු දහමද ගැඹුරට යයි. බුදු දහමේ ගැඹුර වෙත යාමට ක්‍රමානුකූල ගතියක් තිබෙන නිසා (මුල සිට සරලව ඇතුළු වී ක්‍රමානුකූලව සංකීර්ණතාවයට යන ක්‍රමය) බුදු දහමට මිනිසුන් අසීමිත ලෙස කැමති වේ. මෙය බුද්ධ ශාසනය තුළ තිබෙන පළමුවන ආශ්චර්යමත් කාරණයයි. තවද මිනෑම කෙනෙකුට ලෙහෙසියෙන්ම ඇතුල් වීමද මෙහි ප්‍රධාන ලක්ෂණයකි. පැමිණීමට, ඇතුල් වීමට ලෙහෙසිවීම නිසා බුදු දහම තේරුම් ගැනීම සඳහා මිනිසුන් එය තම ජීවිතයට වැළඳ ගනී. ඇතුල් වීමෙන් පසු ක්‍රමානුකූල ගැඹුරු ධර්මතා සඳහා යාමට සිත් දෙන ලෙස බුදු දහමේ ධර්මය අඩංගු ප්‍රමුඛතා පිළිවෙළ මිනිසුන්ගේ සිත් ඇදගන්නා තවත් දෙයකි. තෙරුවන් සරණ යාමෙන් ශ්‍රද්ධානුසාරී වන බෞද්ධයා ක්‍රමානුකූලව බණ ධර්ම වඩයි. ඉන් පසුව එක් එ ් සංයෝජනය ප්‍රහාණය කිරීම සඳහා බුදු දහ ම වන්පිළිවෙත් පුරන විට සෝවාන්, සකෘදාගාමී , අනාගාමී හා අරහත් ඵලයන්ට ා පැමිණෙන ගැඹුරු ධර්මතාවලට පැමිණෙයි. තෙරුවන් සරණ ගෙ ාස් ශ්‍රද්ධානුසාරී වී ප්‍රථමයෙන් බුදු දහමට ඇතුල් වීම මහ මුහු ද් පටන් ගැන්ම වැනිය. ඉන්පසුව ක්‍රමානුකූලව අරහත්වයට යන ෙ තක් ධර්මතා හා පිළිවෙත් පුරමින් කාරණා අවබෝධ කරගැනීම යැ ු ගැඹුර තෙක් ගමන් කිරීමයි. අරහත්වයට පත්වී නිවන් අවබෝ ධ කරන ධර්මයන්ට එළඹීම මහ මුහුදේ ගැඹුරටම යනවා සේ දහ මේ ගැඹුරටම යාමය. මෙම පිළිවෙත ක්‍රමානුකූල භාවයක් ගන්නා නිසා බුදු දහමට ඇතුල්වන මිනෑම කෙනෙක් පිරිසිදු ධර්ම මාර්ගයේ ගැඹුරටම යන්න කැමැත්තක් දක්වනු ලබයි. එය සාක්ෂාත් කර ැනීම පිණිසම ධර්මය පෙළගැස්වා ඇති නිසා බුදු දහමේ මෙම ස්වභාවයට මිනිසුන් දැඩි සේ කැමැත්තක් දක්වයි.

### මහ මුහුද වෙරළ නොඉක්මවන බ ව

මහ මුහුද පවතින්නේ වෙරළ සී මා කරගෙනය. මහ මුහුද වෙරළ ඉක්මවා නොයයි. එයද මහ මුහුදේ ඇති ආශ්චර්යමත් කාරණයකි. මෙයද බුදු දහමට සළකා සංසන්දනය කරන විට කියනුයේ බෞද්ධයා කවදාවත් සීලය නොඉක්ම වයි යන වගය. සීලය බිඳ ගන්නේ නැති බවය. සීලයෙන්ම ආර ක්ෂා වන්නේ බෞද්ධයාය. මහ මුහුද වෙරළ නොඉක්මවා යන ලෙස බෞද්ධයා සීලය නොඉක්මවා යා යුතු වේ.

**ධම්මික මාද ම්පේ**





# නිවැරදිව පෙහෙවස් සමාදන් වෙන හැටි!

පෙහෙවස් සමාදන් වීම බුදුරදුන් අනුමත කරන ලද්දේ විශාඛාවගේ ඉල්ලීමකට අනුවය. පෙහෙවස් සමාදන් වීම හෙවත් පොහොය දිනයන්හි සිල් සමාදන් වීම බුදු සමයට ඇතුළත් කරගන්නා ලද්දේ ජෛන සමයෙනි. ජෛන දහම තුළ එය එතරම් සදාචාරාත්මකව ක්‍රියාත්මක නොවූ අතර බුදු සමය තුළ එය සදාචාරාත්මක හර පද්ධතියක් බවට පත්කරන ලදී. ජෛනයින් පෙහෙවස් සමාදන්වීම සිදුකළේ ව්‍රතයක් වශයෙනි. එන සඳෙහි අව පක්ෂය හා පුර පක්ෂය මුල්කරගෙනය. පුර පක්ෂය ආරම්භ වන දවසේ සිට ව්‍රතය ආරම්භ කරන ඔවුහු ටිකින් ටික ආහාර ගෙන සඳ පිරෙන දිනට හෙවත් පසළොස්වක දට උපරිම ලෙස ආහාර ගනිති. ඊළඟ අවපක්ෂය සඳ බසින පිළිවෙළ අනුව ටිකින් ටික ආහාර අඩු කොට සඳ නොපෙනෙන දිනට හෙවත් අමාවක දිනට ආහාරයෙන් වැළකී සිටිති. මෙය චන්ද්‍රායන ව්‍රතය ලෙස ස ජෛන සමාජයෙහි උගන්වයි.

මෙම් සදාචාරාත්මක හ ර්යක් නොවුණත් ජෛන ඉගැන්වීමට අනුව එය වැදගත් තපසකි. විශාඛාවගේ ඉල්ලීම අනුව මෙයට සදාචාරාත්මක අගයක් එකතු කළ බුදුරජාණන් වහන්සේ පොහොය දිනයන්හි සිල් සමාදන්ව ධාර්මිකව කටයුතු කිරීමේ අගය වටහා දුන්හ. මෙය බුදු දහමෙහි උගන්වන්නේ උපෝසථ යන වචනයෙනි. ගිහියන්ට පමණක් නොව භික්ෂූන්ටද උපෝසථ දිනයන්හි විශේෂ වූ විනය කර්ම සිදුකිරීමට ඇත.

එක් සමයෙක් හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර මිගාරමාතු ප්‍රාසාද නම් වූ පූර්වාරාමයෙහි වැඩ වසන කල මිගාර මාතාවෝ විශාඛාව එක් පොහෝ දිනක බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ තමා පෙහෙවස් සමාදන්ව සිටින බව සැලකර සිටියාය. එවිට බුදුරජාණන් වහන්සේ ඇයට උපෝසථ තුනක් පිළිබඳව දේශනා කළහ. එම උපෝසථ තුන.

**1. ගෝපාලක උපෝසථය, 2. නිගණ්ඨ උපෝසථය, 3. අරිය උපෝසථය යන මේ තුනය.**

බුදුරජාණන් වහන්සේ විශාඛා මහ උවැසියට දේශනා කළ මෙම උපෝසථයන් සඳහන්ව ඇත්තේ අංගුත්තර නිකායෙහිය. එම දම් දෙසුම හඳුන්වා ඇත්තේ විශාඛා උපෝසථ සූත්‍රය ලෙසිනි. අපි ඒවා එම සූත්‍රයෙහි සඳහන් අයුරින් විමසා බලමු.

**1. ගෝපාලක උපෝසථය**

විශාඛාවෙනි, ගෝපාලක උපෝසථ කුමක් ද යත්, යම් සේ ගොපළු තෙම සවස් කාලයෙහි ගවයන් ස්වාමියන්ට භාර දී මෙසේ සිතන්නේය. කෙසේද යත් අද ගවයෝ අසවල් අසවල් තැන්හි හැසිරුණහ. අසවල් අසවල් තැන්හි පැන් බීවාය. හෙට ගවයෝ අසවල් අසවල් තැන්හි හැසිරෙන්නාහ. අසවල් අසවල් තැන්හි පැන් බොන්නාහ කියයි. විශාඛාවෙනි, එපරිද්දෙන්ම මේ ලෝකයෙහි පෙහෙවස් සමාදන් වූ ඇතැමෙක් මෙසේ සිතයි. කෙසේද, අද මම මේ කෑ යුතු දේ කෑවෙමි. මේ මේ පානය කළ යුතු දේ පානය කළෙමි. මම හෙට මේ මේ කෑ යුතු දේ කන්නෙමි. මේ මේ පානය කළ යුතු දේ බොන්නෙමි කියායි. මෙසේ ඒ ලෝභයෙන් අභිධ්‍යා සහගත සිතින් දවස ඉක්මවයි. විශාඛාවෙනි, මේ ගෝපාලක උපෝසථයයි.

**2. නිගණ්ඨ උපෝසථය**

විශාඛාවෙනි, මේ ආර්යය ශ්‍රාවක තෙමේ බ්‍රහ්ම උපෝසථය වන්නේ වෙයි. විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙමේ, භාග්‍යවතුන් විසින් ධර්මය මනාව දේශනා කරන ලදී. ධර්මය සිහිකරයිද, ධර්මය සිහිකරන්නා වූ ඔහුගේ සිත පහදී, සතුට උපදයි, ඔහුගේ සිත ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්. විශාඛාවෙනි, මෙසේ කිලුටු වූ කය උපක්‍රමයෙන් පිරිසිදු කරන්නේ යම් සේද එපරිද්දෙන්ම කිලුටු වූ සිත ධර්මයේ ගුණ සිහිපත් කිරීම තුළින් පිරිසිදු කළ යුතුය. ධර්මය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදී, සතුට උපදී. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත්ද ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙමේ ධර්ම උපෝසථයෙහි වසයි. ධර්මය හා සමග වාසය කරයි.

විශාඛාවෙනි, කෙසේ නම් නිගණ්ඨ උපෝසථය වේද යත්. නිගණ්ඨ නම් වූ ශ්‍රමණ වර්ගයක් ඇත. ඔවුහු ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්. විශාඛාවෙනි, මෙසේ වසන ලද නිගණ්ඨ උපෝසථ මහත් ඵල ඇත්තේ නොවෙයි. මහත් ආනිශංස ඇත්තේ නොවෙයි. මහත් බැබලීම ඇත්තේ නොවෙයි. පැතුරුණු විපාක ඇත්තේ නොවෙයි.

**3. අරිය උපෝසථය (මෙහි ප්‍රභේද කිහිපයක් ඇත.)**

විශාඛාවෙනි, අරිය උපෝසථය යනු කුමක්ද යත් කෙලෙසුන්ගෙන් කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටු වූ සිත කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වේද යත්, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙම බුදු ගුණ සිහි කරන්නේය, එපරිද්දෙන්ම කිලුටු වූ සිත බුදු ගුණ සිහිපත් කිරීම තුළින් පිරිසිදු වෙයි. තථාගතයන් සිහිකරන්නා වූ ඔහුගේ සිත පහදී. සතුට උපදී. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත්ද, ඒ ක්ලේශයෝ පහව යත්.

ධර්මය අරභයා ඔහුගේ සිත පහදී. ප්‍රීති උපදී. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහවෙත්. විශාඛාවෙනි, මෙසේ වනාහී කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

විශාඛාවෙනි, යම් සේ අපිරිසිදු වස්ත්‍රය උණුසුම නිසාද අළුසාරම් නිසාද, ගොම නිසාද, ජලය නිසාද පුරුෂයාගේ ඊට සුදුසු වෑයම නිසාද උපක්‍රමයෙන් පිරිසිදු වේද, එපරිද්දෙන්ම කිලුටු වූ සිත සංඝරත්නයේ ගුණ සිහිපත් කිරීම තුළින් පිරිසිදු කළ යුතුය. මෙසේ සඟ ගුණ සිහිපත් කරන්නා වූ ඔහුගේ සිත පහදී. ප්‍රීතිය උපදී. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, ඒ ආර්යය ශ්‍රාවක තෙමේ සංඝ උපෝසථයෙහි වාසය කරයි. සංඝයා හා සමග වාසය කරයි. සංඝයා අරභයා ඔහුගේ සිත පහදී. ප්‍රීතිය උපදී. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්. විශාඛාවෙනි, මෙසේවනාහී කිලුටු සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.


විශාඛාවෙනි, සමාධිය පිණිස පවත්නා තමාගේ ශීලය සිහිකරයිද, ශීලය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදී, ප්‍රීතිය උපදී. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත්නම් ඒ ක්ලේශයෝ පහව යත්.

සමාධිය පවත්නා තමාගේ ශීලය සිහි කිරීම තුළින් පිරිසිදු කිරීම වෙයි. ශීලය සිහි කරන ඔහුගේ සිත පැහැදී ප්‍රීතිය උපදී. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යත්. විශාඛාවෙනි, මේ ආර්ය ශ්‍රාවක තෙමේ ශීල උපෝසථයෙහි වසන්නේය. ශීලය හා සමග වාසය කරයි. ඔහුගේ ශීලය අරභයා සිත පහදී. ප්‍රීතිය උපදී. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහවෙත්. විශාඛාවෙනි, මෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. මෙබඳු ආර්ය උපෝසථය සමාදන්ව වාසය කරන ආර්ය ශ්‍රාවක තෙම පොහෝ දින අර්ථවත් කරන්නේය. සඵල කරන්නේය. උපායාර්ථ සිද්ධිය ළඟා කරන්නේය. නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිපත් වන්නේය.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි - කැලණිය**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැක වරණය පිණිස වන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."

# එන්නේ කොහි සිටද? යන්නේ කොතැනටද?



එක් දිනක් අලව් නුවර වාසීහු දන් දී අනුමෝදනා බණ අසන බලාපොරොත්තුවෙන් බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සැදී පැහැදී සිටියහ.

එහෙත් බුදුහිමියෝ යම් කෙනකු හිමිති කරගෙන වැඩ හෙයින් ඒ අවස්ථාව එළඹෙන තෙක් නිශ්ශබ්දව වැඩ හුන් සේක.

තවත් තැනෙක එක්සරා පෙහෙර දුවක් පියාගේ අණ පරිදි එදිනම නිම කළ යුතු රෙද්දක් වියා නිමකොට ගන්නට දඩි ඇඹරුවාය. නිම කාර්ය අවසන් කළාට පසු ඇය සිය පියාණන් වෙතට ගොස් දෙපා වැන්දය. අනතුරුව බුදුහිමියන් දකින්ට යන්නට අවසර ඉල්ලුවාය. ඇයට පියාගෙන් අවසර ලැබිණි. පෙහෙර දුව බුදුහිමි වැඩ සිටි ස්ථානයට පිවිස පිරිස කෙළවර සිටියාය. එවිට භාග්‍යවතුන් වහන්සේ සිය බලාපොරොත්තුව ඉටුවී ඇති බැවින් පිරිස් කෙළවර සිටින තරුණ දියණිය දෙස නෙත් යොමු කළ සේක. ඇය බුදුහිමියන් ඉදිරියට ගියා. මෙසේ නිශ්ශබ්ද වීමත්, ඇය දෙස බැලීමත් මහජනයාට කුතුහලය දනවන්නක් විය.

මැය ස්වල්ප වේලාවක් පමණ වුවහොත් පෙර කළ අකුසල කර්මයකින් මැරෙන්නීය. එහෙට පෙර බණ ඇසුවහොත් ඕ සෝවාන් වන්නීය. මරණයෙන් පසු තුසිත් දෙව්ලොව උපත ලබන්නීය. මේ සියල්ල බුදු නැණට පසක් වී තිබිණ.

ඇය දෙස බලා ඉදිරියට පැමිණුනා බුදු හිමි මෙසේ සංවාදය ඇරඹූ සේක.

බුදුහිමි: තැනැත්තිය, නුඹ කොහි යන්නෙහිද?

පෙහෙර දුව: ස්වාමීනි, මම නොදනිමි.

බුදුහිමි: කොහි සිට එන්නෙහිද?

පෙහෙර දුව: ස්වාමීනි, එයත් මම නොදනිමි.

බුදුහිමි: නුඹ නොදන්නෙහිද?

පෙහෙර දුව: ස්වාමීනි, මම එය දනිමි.

බුදුහිමි: නුඹ දන්නෙහිද?

පෙහෙර දුව: මම එය නොදනිමි.

මෙයට පෙර දවසක බුදු බණ අසා සිටි ඇය බුදු වදනක් අනුව නිතරම 'මරණ සතිය' වඩන්නට පුරුදුව සිටියාය. ඒ අනුව ඕ ශාස්තෘන් වහන්සේගේ මනාපයට අනුව පිළිතුරු දුන්නාය.

මේ සංවාදය අසා සිටි පිරිස නිවුණොවුන් ප්‍රකෝපයෙන් මැය බුදුන් ඉදිරියෙහි හිඳුණු හිඳුණු දේ කියන්නී යයි දොස් නගන්නට වූහ.

මෙහිදී භාග්‍යවතුන් පිරිස සන්සුන් කළ බුදුන් වහන්සේ ඇය ලවාම එය විස්තර කරන්නට මඟ සැලසූ සේක.

තැනැත්තිය! නුඹ කොහි සිට එන්නෙහිදැයි ඇසූ කල්හි 'නොදනිමි' කීයේ කිනම් භවයක සිට මෙලොව උප්පත්තියට ආයේදැයි නොදන්නා බැවිනි.

'කොහි යන්නෙහිද' යන්නට 'නොදනිමි' යි කීයේ මෙලොවින් චුත වී ගොස් කොහි උපදී දැයි නොදන්නා බැවිනි. 'නොදන්නෙහිද' ඇසූ කල 'දන්නෙමි' යි කීයේ ඒකාන්තයෙන්ම මැරෙන බව දන්නා නිසාය. 'දන්නෙහිද' ඇසූ කල 'නොදනිමි' යනුවෙන් කීයේ මැරෙණ වග ස්ථිර වශයෙන් දැන සිටියත් එය කොයි වෙලාවේ සිදුවේදැයි නොදන්නා බැවිනි.


ඇසූ සියලු ප්‍රශ්නවලට උත්තර දුන් බැවින් බුදුහිමියෝ සාධුකාර දීමෙන් පිරිස අමතා,

'ප්‍රඥා ඇස නැත්තෝ අන්ධයෝය. ප්‍රඥා ඇස ඇත්තෝ සියල්ල තේරුම් ගනිති' යි ප්‍රශංසා කොට ධර්ම දේශනා කළ සේක.

'අන්ධභූතො අයං ලොකො
තනුකෙත්ථ විපස්සති
සකුන්තො ජාලමුත්තොව
අප්පො සග්ගාය ගච්ඡති'

මේ ලෞකික ලෝකයේ වෙසෙන්නවුන්ගෙන් යහපත් දැනුම නමැති ආලෝකය ලබන්නේ සුළු පිරිසකි. වැඩි දෙනා අන්ධකාර ලෝකයෙහි ගිලී සිටිති. ලිහිණි වැද්දාගේ දැලෙන් මිදී යන පක්ෂියකු මෙන් සුගති මොක් සැප ලබන්නේ ටික දෙනෙකි. සෙස්සෝ දැලට අසුවන්නාක් මෙන් අපායගාමී වන්නාහුය.

පෙහෙර දුව නැවත නිවසට යනවිට ඇගේ පියා රෙදි වියන යන්ත්‍රය ළඟ වාඩි වූ ගමන් නිදා සිටියේය. ඇය ඉදිරියට එන විට පය පැටලී යන්ත්‍රයේ දඬු කෙළවර වැදී ශබ්දයක් නිකුත් විය. හදිසියේ ඇහැරුණු පෙහෙරා නොහොත් ඇගේ පියා 'වෙම' පස්සට ඇද්දේය. ඒ සමඟම වෙම්ය ළයේ ඇනුණු පෙහෙර දුව මැරී වැටුණාය.



ලලිතකලා කීර්ති, චිත්‍රකලා ගුරු
ගොංගිතොට ප්‍රේමරත්න

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

දළදා වරුණ


30

# නිවැරදි ධර්ම ග්‍රන්ථ ලියා පළකිරීම සමාජයට කරන මහඟු මෙහෙවරක්

අස්ගිරි පාර්ශ්වයේ මහානායක අග්ගමහා පණ්ඩිත උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත හිමි

කේ. මීගහකුඹුර විසින් රචිත **"සිත නිවන ථෙර ථෙරී උදාන"** දහම් ග්‍රන්ථය දොරට වැඩීමේ උළෙල





කේ. මීගහකුඹුර මහතා විසින් තමන් ලියූ "සිත නිවන ථෙර ථෙරී උදාන" ග්‍රන්ථයේ මුල්ම පිටපත ධර්ම දානයක් ලෙසින් අස්ගිරි පාර්ශ්වයේ මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහා නාහිමිපාණන් වහන්සේ වෙත පිළිගැන්වූ අවස්ථාව



ගොංගිතොට ප්‍රේමරත්න මහතාගේ නිර්මාණ ජීවිතය අගයමින් සකස් කළ විශේෂ සමරු ඵලකය ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ නිලංග දෑල මහතා විසින් පිළිගැන්වූ අයුරු

මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ සේවය කරන කේ. මීගහකුඹුර මහතා විසින් රචිත "සිත නිවන ථෙර ථෙරී උදාන" නම් වූ ග්‍රන්ථය මහා සංඝරත්නයටත්, පාසල් දරුවන්ටත් සමාජයටත් ඉතා වැදගත් ග්‍රන්ථයක් බව අවිවාදයෙන් නම් කළ හැකි බව අස්ගිරි පාර්ශ්වයේ මහානායක අග්ගමහා පණ්ඩිත උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහානාහිමියෝ පැවැසූහ.

කේ. මීගහකුඹුර මහතා විසින් රචිත "සිත නිවන ථෙර ථෙරී උදාන" නම් වූ කෘතිය එළිදැක්වීම ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයේ රන් ආයුධ මණ්ඩප ඇස්විම් ශාලාවේදී පසුගියද සිදුකෙරිණ. එම අවස්ථාවට සහභාගී වූ අස්ගිරි පාර්ශ්වයේ මහානාහිමියන් මෙසේද සඳහන් කළහ.

'ශ්‍රී දළදා මාළිගාවේ දේශීය බෞද්ධ කාර්යංශයේ ලේකම් වශයෙන් කටයුතු කරන කේ. මීගහකුඹුර මහතා ගුරුවරයෙක්, විදුහල්පතිවරයෙක් හා අධ්‍යාපන අධ්‍යක්ෂ වරයෙක් ලෙස රටට විශාල සේවයක් සිදුකළ අයෙක්. විශ්‍රාම දිවියට ඇතුළු වීමෙන් අනතුරුව ඔහු කල්පනා කළේ තවත් යම් සේවයක් ශාසනය වෙනුවෙන් හා ආගම වෙනුවෙන් සිදුකිරීමටයි. ඒ අනුව මේ ශාසනය වෙනුවෙන් හා රටට ජනතාවට ප්‍රයෝජනවත් වන අයුරින් මේ මහා සංඝරත්නයට හා දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ඔහු මීට පෙරත් ග්‍රන්ථ කීපයක් එළිදක්වා තිබෙනවා. ඒ සියල්ලම සමාජයට වැඩදායක ඒවා. මිනිසුන් හරි වැරැද්ද තේරුම් ගන්නේ මෙබඳු උතුම් ධර්ම ග්‍රන්ථ කියවීමෙන්. එනිසා මෙබඳු පතපොත ලියා පළකිරීම සමාජයට කරන මහඟු සේවයක් ද වෙනවා.

මල්වතු පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි හිමියන්

'මෙම ග්‍රන්ථය සම්පාදනය කළ මීගහකුඹුර මහතා මල්වතු අස්ගිරි මහානාහිමිවරුන් ඇතුළු මහා සංඝරත්නය ඇසුරු කළ නිසා උභය මහා විහාර භාවිත කරන අද මාධ්‍ය භාවිත නොකරන ගැඹුරු භාෂාවෙන් යමක් රචනා කිරීමේ හැකියාව ලැබ තිබෙනවා. අද මේ තෝන්තුවේ සිටින අයගෙන් මීගහකුඹුර මහතාට පමණයි එම හැකියාව පවතින්නේ. මෙම කෘතියේ සඳහන් ථෙර ථෙරී උදාන ගාථා පිළිබඳව මුලින්ම අවධානය යොමුකළේ මහා ගත්කරු මාටින් වික්‍රමසිංහ මහතායි. අතීතයේ මෙම ගාථා පිළිබඳව බොහෝ දෙනා අවධානය යොමු කළා. මේ පිළිබඳව දෙස් විදෙස් රටවල බොහෝ පිරිස් අධ්‍යයනය කරනවා. මේ ග්‍රන්ථයට ථෙර ථෙරී කතා විසි හතරක් උපයෝගී කරගෙන තිබෙනවා. අද ජීවත් වන තරුණයන් මෙබඳු කතා

## ප්‍රවීණ චිත්‍ර ශිල්පී ගොංගිතොට ප්‍රේමරත්නට දළදා මාළිගාවෙන් උපහාර තිළිණයක්

ප්‍රවත් කියවා තම ජීවිතයට පාඩම් ඉගෙන ගත යුතුයි.

**සිත නිවන ථෙර ථෙරී උදාන ග්‍රන්ථය සම්පාදනය කළ කේ. මීගහකුඹුර මහතා**

බාල මහලු තරුණ කාටත් තේරෙන භාෂාවකින් ලියා මෙම ග්‍රන්ථය දළදා වහන්සේට පූජා කිරීමයි මගේ මූලික අරමුණ වුණේ. මෙම ග්‍රන්ථය පළ කිරීමේදී මම කරුණු දෙකක් ගැන සැලකිලිමත් වුණා. ඉන් එකක් වන්නේ ශ්‍රී දළදා වහන්සේගේ උත්තම චරිත දෙකක් වන ථෙර හා ථෙරී යන උච්චාරණ වාක්‍ය පිළිබඳව තේරෙන බසින් ලියා එය දළදා වහන්සේට පූජා කිරීමයි. දළදා වහන්සේට අපේ රජදරුවන් සිදුකළ පූජාවන් අතරේ රාජ්‍යත්වය පූජා කළ අවස්ථාවන් හා රන් රිදී මුතු මැණික් ආදිය පූජා කළ අවස්ථාවන් තිබෙනවා. අතීතයේ විවිධ වස්තූවෙන් දළදා වහන්සේ පුදා තිබෙනවා. ඒ වගේම බුදුන් වහන්සේ විසින් දේශනා කළ අනන්ත ගුණ ඇති ඒ ගැඹුරු ධර්මය කැටිකොට දළදා වහන්සේට පූජා කිරීමට ඇතිනම් කියන හැඟීම මා සිත තුළ තිබුණා.

අද අපේ දරු දැරියන්ට වීර කතා චරිත කතා ලෙස කියවන්න ලැබෙන්නේ නළු නිළියන්ගේ හා වෙනත් පුද්ගලයින්ගේ අරුත්සුන් කතන්දරයි. ඒ නිසා මම කල්පනා කළා දරුවන්ට තම ජීවිතය දැනමට අනුව හැඩගස්සවා ගැනීමට උත්තම, චරිත කතා කීපයක් ලියා ඉදිරිපත් කරන්නට. ඒ නිසා උත්තම රහතන් වහන්සේලාගේත්, මෙහෙණින් වහන්සේලාගේත් උදාන වාක්‍යයන් මුල් කරගෙන හා ඒනා සම්බන්ධව ගෙතුණු වාක්‍යයන් මුල් කරගෙන ඒ හා සම්බන්ධ චරිත කතාවන් අපේ දරුවන්ට ඉදිරිපත් කිරීම සුදුසුයි කියා මා කල්පනා කළා. ඒ සඳහා මට මහානාහිමිවරුන්ගෙන් හා මහා සංඝරත්නයෙන් ලැබුණු ආශිර්වාද අපමණයි. ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේතුමා මට දුන් සහයෝගය ද අපමණ යැයි මීගහකුඹුර මහතා සඳහන් කළේය.

**අස්ගිරි පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ශාස්ත්‍රපති නාරම්පනාවේ ආනන්ද හිමියන් විසින් "සිත නිවන ථෙර ථෙරී උදාන" ග්‍රන්ථය පිළිබඳ විවරණයක් මෙහිදී ඉදිරිපත් කළහ.**

මෙම අවස්ථාවේදී දශක හයකට අධික කාලයක් චිත්‍ර ශිල්පියෙක් ලෙස කටයුතු කරන ගොංගිතොට ප්‍රේමරත්න මහතාට ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ නිලංග දෑල මහතා අතින් සමරු තිළිණයක් ප්‍රදානය කිරීමද සිදුවිය. බෞද්ධ බැතිය දනවන ආකාරයෙන් සිතුවම් නිර්මාණය කිරීමේ යෙදෙන ගුරුවරයෙකු හා මාධ්‍යවේදියෙකු වන ගොංගිතොට ප්‍රේමරත්න මහතාගේ නිර්මාණ ජීවිතයට ශ්‍රී දළදා මාළිගාවේ උපහාරය පුද කිරීම මෙම සමරු ඵලකය ප්‍රදානය කිරීමේ අරමුණ විය. මහනුවර දළදා මාළිගාව සෑම පොහොය දිනකම ප්‍රකාශයට පත්කරන දළදා වරුණ පුවත්පතේ ප්‍රධාන චිත්‍ර ශිල්පියා ලෙස කටයුතු කරන්නේද ගොංගිතොට ප්‍රේමරත්න මහතාය. කේ. මීගහකුඹුර මහතාගේ සිත නිවන ථෙර ථෙරී උදාන කෘතියට අදාළ චිත්‍ර නිර්මාණයද ප්‍රේමරත්න මහතා විසින් සිදුකර තිබිණ.


මල්වතු පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම නාහිමි පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝසභික අදත්තම ධම්මානන්ද නාහිමි, අස්ගිරි පාර්ශ්වයේ කාරක සංඝ සභික වරකාගොඩ ඤාණරතන නාහිමි ඇතුළු මහා සංඝරත්නය හා ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ නිලංග දෑල, බස්නායක නිලමේ ජයම්පත් නිත්තෙන්ද ඇතුළු නිලමේවරුන්ද ගිහි සැදැහැවතුන් විශාල පිරිසක්ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

**ගයා වත්තිආරච්චි**

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇවණේද ඒ ගෞතම ශ්‍රාවකයෝ හැමදෙම සුවසේ නිදු පුබුදිත්."

# සදහම් ප්‍රහේලිකා අංක - 78

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් හිමිවෙයි... දුරකථනය - 011-2695773



### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා කැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 72, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. කැපැල්පත් භාරගන්නා අවසාන දිනය ජූලි මස 30 දය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ▶ හරහට

1. ත්‍රිවිධ දානවලින් එකකි.
3. සිව්වනක් පිරිසෙන් එක් කොටසකි.
5. තපස්සු භල්ලුක දෙදෙනාට බුදුන් පිරිනැමූ ධාතු.
6. බුදු පුදයට මේවාද රැගෙන යති.
9. මේවා දීමෙන් කුසල් වැඩිකර ගත හැකිය.
10. මෙය පරම ධනයක් ලෙසට බුදු දහමේ ඉගැන්වේ.
11. හස්තියන්ගේ වරිනාම දෙය.
12. බෝසතුන්ගේ පංච මහා පරිත්‍යාගවලින් එකකි.
13. මේවා දෙනෙතටද උපමා කෙරේ.
14. බුදුසසුනේ විනයධර භික්ෂූන් අතරේ අග තනතුර ලත් තෙරුණුවෝ.

### ▼ පහළට

2. අටලෝ දහමට අයත්ය.
3. ප්‍රාණඝාත කිරීම සඳහා සමහරු මේවා අටවති.
4. මෙය පාලනය කරගැනීම ඉතා අසීරුය.
5. මේවා කීමෙන්ද අකුසල් සිදුවේ.
7. සිදුහත් කුමරු ලොව පහළ වන විට මොහුද උපත ලබයි.
8. සිදුහත් අභිනිෂ්ක්‍රමණ කළ පොහොය.
11. මුඛ සෞඛ්‍යය සඳහා මේවා රැකගත යුතුය.

## ප්‍රහේලිකා අංක 76 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ

- වයි. පී. වයි. පොඩිමැණිකේ, උඩුපිහිල්ල අංග, මැදවල, හාරිස්පත්තුව
- තන්දු කුලසිංහ, 20, වැලිගල්ල, මාරුකොණ.
- යූ. නිලූමි චන්ද්‍රලතා, මිලන්දෙනිය, කහපත්වල.

## දළදා වරුණට ලියන්න ඔබටත් පුළුවන්

දළදා වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර තුනකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමගින් පුවත් ලේඛක මඩුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඔබතුමන් අයෙකු අප වෙත ලබා දෙන කාලීන කරුණු සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ ඒ කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ කෙටි ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම කෙටි තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

## දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න


1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ හැඳ සිටින ඇඳුම උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට වඩා ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොගැළපෙන බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

# මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූපයකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.

(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා සිත්තමක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන චාලට් මෙතරගම මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම පෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)



**පසුගිය කලාපයේ 'පුදබිම' නිවැරදිව නම්කොට ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා**


**ශීලා රාජකරුණා**
අංක : 93, වාරියපොල,
මාතලේ.

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළදා මාලිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

**පසුගිය කලාපයේ (පුදබිම) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර:**
**ජේතවනාරාමය**

බොදු පුවත්

## දැයට දරුවන් පුදන ගැබිනි මවුන් සැටදෙනකුට දනක් පිරිනැමෙයි



**පොල්ගහවෙල**

උඩපොළ ශ්‍රී සුනන්දාරාම රජමහා විහාරාධිපති මහදෙව මහපිරිවෙනේ පරිවේණාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය වැලිතර සුගතවංශ නාහිමිපාණන් වහන්සේගේ සනස් හයවන ජන්ම දිනය නිමිත්තෙන් පසුගියදා පොල්ගහවෙල කහටත්තේඅල මාතෘ සායනයට පැමිණෙන දැයට දරුවන් පුද උතුම් මෙහෙවරක යෙදෙන දැ හිතකාමී ගැබිනි මවුන් සැට දෙනෙකු සඳහා දිවා ආහාර වේලක් හා සියලු දේ අඩංගු විශාල ආහාර මල්ලක් පරිත්‍යාග කිරීමට පියවර ගෙන තිබිණ. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ හා සහෝදරයාගේ දායක පිරිසගේ නොමසුරු දායකත්වයෙන් සිදුකෙරුණු මෙම දානමය පින්කම සැමගේ ඇගයීමට ලක්විය. මෙම පින්කමේ සංවිධායකත්වය පොල්ගහවෙල සදුමල් පුණ්‍යවර්ධන එකමුතුව විසින් සිදුකරනු ලැබීය.

## මල්වතු අස්ගිරි උපසම්පදා පුණ්‍යෝත්සවයේදී දහනමක් අධිසිල් ලබති


**මහනුවර** මල්වතු අස්ගිරි උභය මහා විහාරයන්හි වාර්ෂික උපසම්පදා මංගල්‍ය පුණ්‍යෝත්සවය වෙසක් පුර පෝය දිනයෙන් ආරම්භ කර පොසොන් පෝය දිනයෙන් අවසන් විය. උපසම්පදා විනයකර්ම මාසය තුළදී උභය මහා විහාරයන්හි සාමණේර දහනමක් වැඩලාහක නාමයෙන් අධිසිල්හි පිහිටු වූහ.

## සංඝරාජ 68 වැනි පෙරහර ඇසළ පෝදා


**මහනුවර** මල්වතු මහා විහාරයීය ශ්‍රී සංඝරාජ ගුණානුස්මරණ සමිතියේ මෙහෙයවීමෙන් වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ ගුණානුස්මරණය කිරීම වස් වාර්ෂිකව මල්වතු මහා විහාරය මුල්කරගෙන පවත්වනු ලබන සංඝරාජ ගුණසමරු උත්සවය සහ සංඝරාජ පෙරහර 68 වැනි වතාවටත් ජූලි 12 වැනිදට යෙදෙන ඇසළ පුර පසළොස්වක පෝය දින විදි සංචාරය කෙරේ.

**කේ. බණ්ඩාරනායක**

## බුළුමුල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත නාහිමි පිළිගැනීමේ උත්සවයක්



**මහනුවර** මල්වතු මහා විහාරවාසී (ඇලෙබේගම පන්සල) යටිනුවර මැද පළාත දන්තුරේ පුරාණ රජමහා විහාරය, දන්තුරේ පොහොසිරිය බෝමළුව ආරාමය, කුරුණෑගල ඉබ්බාගමුව කඳුලව මැදිරිය රජමහා විහාරය, වාරියපොල මලාගනේ රජමහා විහාරය යන විහාරයන්හි අධිපති, ගෞරව ශාස්ත්‍රවේදී, පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා විශ්‍රාමලත් විදුහල්පති, සමස්ත ලංකා සාමවිනිසුරු, ජ්‍යොතිර්වේදී විචිත්‍ර ධර්මකථික ගරු බුළුමුල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත බුද්ධරක්ෂිතාභිධාන නායක ස්වාමීන් වහන්සේ වෙත, ශ්‍යාමෝපාලිවංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ කාරක මහා සංඝ සභාව මගින් එම උත්තරීතර සංඝ සභාවේ සංඝ සභික ධුරයට පත්කොට වදළ හැවින්, ඒ හා සම්බන්ධව පැවැත්වෙන චාරිත්‍රානුකූල ප්‍රසාද පූජා පැවැත්වීමේ මහා පුණ්‍යෝත්සවය පසුගියදා (7) මහනුවර මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී අති සම්භාවනීය ගිහි පැවිදි පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. එදින දහවල් ශ්‍රී දළදා මාලිගාවේදී උභය මහා විහාරයීය අනුනායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ පන්සීයනමක් වහන්සේට සාංඝික දානමය පින්කමක් පවත්වා තම ගුරු දෙමාපියාදීන්ට පින්දීමේ පින්කමක් පැවැත්වුණ අතර උන්වහන්සේ පිළිගැනීමේ පෙරහර සහ උත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අග්‍රාමාත්‍ය දි. මු. ජයරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ඇසළ පුන් පොහෝ දින එනම් අද (12) දන්තුරේ පුරාණ රජමහා විහාරස්ථානයේදී පැවැත්වේ.



# සදාකාලිකා නොවූ ලෝකෝ සදාකාලිකා ධර්මයක්....!

බුදුරජාණන් වහන්සේ සොයාගත් ශ්‍රී සද්ධර්මය ලොව පැවති දෙයක් නොව තිබෙන දෙයකි. එය නිර්මාණවාදී එකක් නොවූ [illegible] දෙයකි. බුදුරජාණන් වහන්සේ පහළ වන සමය වන විට [illegible] ශාස්තෘවරු සොයාගෙන ලොවට ඉදිරිපත් කළේ ආත්ම- [illegible] හාමැති, නොපෙනෙන, අපගේ ඉන්ද්‍රියයන්වලට ගෝචර [illegible] දර්ශනයන්ය. ඒවා කොටස් ද්‍රව්‍ය [illegible] කාලික විය. එනම් කාලයකට සීමා වූ [illegible].

බුදුරජාණන් වහන්සේ සොයාගත් උතුම් වූ ශ්‍රී සද්ධර්මය [illegible]කි. එනම් කාලයකට සීමා නොවූවක්ය. අතීත, වර්තමාන [illegible] යන තුන් කාලයටම අයත් යථාර්ථවාදී දර්ශනයක්ය. එය කවුරුන් හෝ විසින් මැවූ දෙයක් නොවන අතර හේතුඵලවාදී එකක්ය. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් ශ්‍රී සද්ධර්මය කවදත් ලොව පවතින්නකි. බුදු කෙනෙක් ලොව පහළ වුවද නොවුවද එය සදාතනිකය.

කාලයක් ගතවීමෙන් පසු සත්‍ය වුවද අසත්‍යයෙන් වැසී යනු ඇත. එවන් යුගයක බුදු කෙනෙකුගේ පහළ වීම ඉතා වැදගත්ය. ගෞතම බුදුරජාණන් වහන්සේ සිදු කළේද වැසී ගිය දර්ශනයක් ඉස්මතු කර පෙන්වීමකි. එය අමුතුවෙන් නිර්මාණය කිරීමක් නොවේ. ඒ අනුව බුදු හිමි සොයාගත් දර්ශනය අකාලික වූවක් ලෙස හඳුන්වා දීමට පුළුවන. ධර්මය පිළිබඳ වඳින පාලි වාක්‍ය තුළ "ස්වාක්ඛාතො භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ......" ආදී වශයෙන් ධර්මයෙහි ඇති වටිනාකම දේශනා කර ඇත. බුදු කෙනෙකුගේ ලොව පහළ වීම අවශ්‍ය වන්නේ එම මිත්‍යා දෘෂ්ටිවලින් වැසී ඇති උතුම් ශ්‍රී සද්ධර්මය ඉස්මතු කර පෙන්වීමට හා නිවන් මගට යන මාවත පසක්කර දීමටය.

බුදුරජාණන් වහන්සේ සොයා ගත් ශ්‍රී සද්ධර්මය පළමුව දේශනා කරන ලද්දේ පස්වග මහණුන් උදෙසාය. එම දේශනය වූයේ "සච්ච විභංග සූත්‍රයයි" සියලුම ගැඹුරු දර්ශනයන් සම්පිණ්ඩනය කොට බුදු හිමි පළමු සූත්‍ර දේශනාව සිදු කළහ.

උපමා ආශ්‍රයෙන් වුවද ශ්‍රී සද්ධර්මය දේශනා කිරීම හා සම්බන්ධ කිරීම විශේෂත්වයකි. "කුල්ලූපමං වො භික්ඛවේ නිස්සරණත්ථාය නොග හණත්ථාය" ධර්මය එතෙර වීම උදෙසා පහුරක් කර ගත යුතුය. එම උතුම් ශ්‍රී සද්ධර්මය ප්‍රඥාවන්තයින්ට මිස දුප්පඥයින්ට නොවේ. ඒ බව "පඤ්ඤවන්තස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස" යනුවෙන් දේශනා කරන ලදී. එයට හේතුව එම ශ්‍රී සද්ධර්මය ඉතා ගැඹුරුය. එය අකාලික වන්නේද එහි තිබෙන යථාර්ථවාදී බවත් ගැඹුරු බවත් හේතුවෙනි. අන්‍ය දර්ශන ඉක්මනින් ග්‍රහණය කොටගෙන ඉක්මනින් ක්ෂය වී හෝ එපා වී යන්නේ ඒ තුළ සාවද්‍ය බවක් අඩුකම හේතුවෙනි.

එම අකාලික ශ්‍රී සද්ධර්මය ගැඹුරු නිසාම බුදු හිමි පළමුව එය දේශනා නොකිරීමටද සිතූහ. පසුව සහම්පති බ්‍රහ්මයාගේ ආරාධනාව මත දේශනා කිරීමට සිතූහ. එම ශ්‍රී සද්ධර්මය තවත් තැනක මෙසේ දේශනා කර ඇත. "තුම්හේහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා" තමා විසින් උත්සාහයෙන් එතෙර විය යුතු අතර බුදුවරු ඒ සඳහා මග පෙන්වීම කරනවා හැර එතෙර කරවීමක් සිදු නොකරනු ඇත. "අත්තාහි අත්තනො නාථො - කොහි නාථො පරොසියා" තමාට පිහිට තමා විසින්ම සසා ගත යුතුය. වෙන කෙනෙකුන් කෙසේ නම් පිහිට වන්නේද? "අත්ත දීපා භික්ඛවේ විහරථ" තමා තමාට ප්‍රදීපයක් කොට ජීවත් විය යුතුය. මේ ආදී වශයෙන් දේශනා කළ දහම්පාඨ තුළින් ධර්මයේ ඇති අකාලික බව මනාව විද්‍යමාන වේ.

බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් දේශනා කළේ ධර්මය උපයෝගී කොට ගෙන සසරින් මිදීම තමා විසින්ම කළ යුතු බවයි. එහිදී බාහිර නිස්සාර දේවල් පිළිබඳ සිත නොයොදන ලෙසද දේශනා කළහ. ඒ බව "වක්කලී" කතා පුවතින් පැහැදිලි වේ. වක්කලී හිමිට දේශනා කළේ "කිං තෙ වක්කලී ඉමිනා පූතිකායෙන දිට්ඨෙන යො ධම්මං පස්සති සො මං පස්සති" වක්කලිය මේ කුණු ශරීරය දෙස බලා සිටීමෙන් ඵලක් නැත. ඔබට මා හැමදම දැක ගැනීමට අවශ්‍ය නම් ධර්මය දැකිය යුතු බවයි. එයින්ද පැහැදිලි වන්නේ සැමදම යනුවෙන් ධර්මය අකාලික වූවක් බවයි. ධර්මය හරිහැටි දැන ගැනීමට හැකිනම් එය සදාකාලික සැනසීම උදෙසා ඉවහල් කර ගැනීමට පුළුවන.

මුලින් සඳහන් කළ පරිදි එවකට පැවති අන්‍ය දර්ශනයන් සමඟ සසඳ බැලීමේ දී ශ්‍රී සද්ධර්මය අකාලික වන්නේ එය හේතුඵලවාදී දහමක් වූ බැවිනුත් නිර්මාණවාදී එකක් නොවන බැවිනුත්ය. අස්සජි හිමි හා උපතිස්ස පිරිවැජියාගේ හමුවීම ඊට කදිම නිදසුනකි.

"යේ ධම්මා හේතුප්පභවා - තේ හේතුං තථාගතෝ ආහ
තේසඤ්ච යො නිරොධො - එවං වාදී මහා සමණො"

යම් ධර්මයක් හේතූන් මුල්කොට ඇද්ද එහි හේතුව තථාගතයන් වහන්සේ වදාළහ. එහි නිරෝධය වදාළහ. මෙයින් හේතු ප්‍රත්‍ය සම්බන්ධය පිළිබඳවද මනාව පැහැදිලි වේ.

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"

බුදුරජාණන් වහන්සේ යනු මුළු ලෝකයටම අග්‍ර වූ ශ්‍රේෂ්ඨ උත්තමයාණන් වහන්සේයි. උන්වහන්සේට වඩා උසස් කෙනෙක් හෝ සමාන කෙනෙක් තුන්ලෝකයේම නොමැත. එසේ වුවද බුදුරජාණන් වහන්සේ ගුරුවරයා වශයෙන් තබා ගත්තේද අකාලික වූ උතුම් ශ්‍රී සද්ධර්මයයි.

"යෝ වෝ ආනන්ද මයා ධම්මො ච විනයො ච

දෙසිතො පඤ්ඤත්තෝ සො වො මමච්චයෙන සත්ථා"

ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ ගුරු මුෂ්ටියක් නොමැතිව ධර්මය විනය දේශනා කළ බවත්, බුදුරදුන්ගෙන් පසු ධර්මය විනය ගුරු තනතුරෙහි තබා ගන්නා ලෙසත් දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අසා ශ්‍රාවකයින් අසතුටට පත් වූයේ එක් අවස්ථාවක් පමණි. එනම් ම.නි. මූල පරියාය වර්ගයෙ ප්‍රථම සූත්‍රය වන මූල පරියාය සූත්‍ර දේශනාව ඇසීමෙනි. එය නොවැටහුණ නිසා මානය අධික ඔවුනට අසතුටට පත්විය. බුදු හිමිද එය නොවැටහෙන්නට දේශනා කළේ ඔවුන්ගේ මානය බිඳීම සඳහාය.

අකාලික වූ එම උතුම් ශ්‍රී සද්ධර්මය ඇසීමෙන් මෙලොවදීම ධර්මාවබෝධය ලබන පුද්ගලයින් සිව්දෙනෙකු පිළිබඳ අ.නි. නකය සූත්‍රය තුළින් පැහැදිලි කොට ඇත. එනම්

1. උග්ඝටිතඤ්ඤූ (දේශනාව අසා සිටින විටදීම විවරණය සහිතව අවබෝධ වීමයි)

2. විපචි තඤ්ඤූ (මාතෘකාවක් විස්තර වශයෙන් දේශනා කිරීමේදී අවබෝධ වීමයි.)

3. නෙය්‍යෙ (උත්සාහයෙන් ඇසූ දේශනාව නැවත නැවත මෙනෙහි කිරීමෙන් අවබෝධ වීමයි)

අකාලික වූ ශ්‍රී සද්ධර්මය හැඳින්වෙන්නේ "සෝ ධම්මං දෙසෙති ආදි කල්‍යාණං, මජ්ජෙ කල්‍යාණං"

පරියොසාන කල්‍යාණං සත්ථං, සබ්‍යඤ්ජනං කේවල පරිසුද්ධං පරිපුණ්ණං " (මුල , මැද , අග යහපත් නිසා උපාලි වැනි ගෘහපතීන්ද, අංගුලිමාල වැනි මිනීමරුවන්ද, සච්චක වැනි වාදකරුවන්ද, නන්දෝපනන්ද වැනි නා රජුන්ද, ආලවක වැනි යක්ෂයන්ද, සභිය වැනි පරිබ්‍රාජකයන්ද පහසුවෙන් මාදු මොලොක් බවට පත්විය. අකාලික වූ ශ්‍රී සද්ධර්මය තුළින් පුද්ගලයාට නිරන්තරයෙන්ම මෙලොව පරලොව සුවදායක ජීවිත ගත කිරීමට මග පාදන ආකාරය වඩා දුරටත් පැහැදිලි කොට ඇත. ශ්‍රද්ධාවෙන් පිටත දහමට ලැදි වීමත්, ප්‍රඥාවෙන් තිලක්ෂණ අවබෝධයක් සැලසෙනු ඇත.

අකාලික වූ ශ්‍රී සද්ධර්මය ඇසීම තුළින් මෙලොවදීම ලැබෙන අනුසස් හැටියට,

1. අස්සුතං සුනාති (නොඇසූ දෙයක් ඇසීමට ලැබීම)

2. සුතං පරියොදපෙති (ඇසූ දෙය වඩාත් පිරිසිදු කොට ගත හැකිවීම)

3 කංඛං උජුං විහරති (සැකය දුරුකොට ගත හැකිවීම)

4 දිට්ඨිං උජුං කරොති (තම දෘෂ්ටිය සෘජුකොට ගත හැකිවීම)

5. චිත්ත මස්ස පසීදති (සිතේ පැහැදීම ඇතිවීම)

පෙන්වා දිය හැකිය.

යම් කිසි කෙනෙකු ධර්මය තම ජීවිතයට සම්බන්ධ කොටගෙන එය අනුගමනය කරන්නේ නම් එය තමාගේ ආරක්ෂාව පිණිස පවතිනු ඇත. ධර්මය යනු ස්වභාව ධර්මය හා බැඳී පවතින්නකි. එසේනම් ධර්මානුකූල වීමෙන් ස්වභාවධර්මයා විසින්ම ආරක්ෂා වීමක් සිදුවනු ඇත.

"ධම්මො හවේ රක්ඛති ධම්මචාරි

ධම්මො සුචිණ්ණො සුඛමාව හාති

එසානි සංසො ධම්මෙ සුචිණ්ණෙ

න දුග්ගතිං ගච්ඡති ධම්මචාරි"

ධර්මානුකූලව ජීවත් වන්නා ධර්මයෙන් ආරක්ෂා කරනු ඇත. මැනවින් පුරුදු කරන ලද දහම් කරුණු නිසා දෙලොවම සැප ලබයි. ධර්මයෙහි හැසිරෙන්නෝ දුගතියට නොයයි. එබැවින් අප සැම කෙනෙක්ම ධර්මයට අනුකූලව ජීවිත පවත්වාගෙන යාමට නිරන්තරයෙන්ම උත්සාහ කළ යුතුය. එයට හේතුව අප ජීවිතවලට නිරන්තරයෙන් ආරක්ෂාව අවශ්‍ය වන බැවිනි. අපට පෙනෙන හා නොපෙනෙන බලවේගවලට නිතර නිතර මුහුණ දීමට සිදුවේ. එවැනි අවස්ථාවලදී ජීවිතවලට කරදර සිදුවේ. ධර්මයට අනුකූලව ජීවත් වුවහොත් බොහෝ දුරට ඒවායෙන් මිදීමට පුළුවන.

ලෝකයේ ධර්මය තරම් උතුම් දෙයක් තවත් නොමැත. එයට හේතුව ධර්මයෙන් සිදුවන දෙය දෙමව්පියන්ගෙන්වත් ඉෂ්ටසිද්ධ නොවන බැවිනි. "ධම්මං තස්ච පිතාච මාතා" බුදුරජාණන් වහන්සේ නොයෙක් දානයන් පිළිබඳ දේශනා කොට ඇති වුවද ධර්ම දානයට ඒ කිසිවක් සම කළ නොහැකි බව දේශනා කළහ. "සබ්බ දානං ධම්ම දානං ජිනාති" යනුවෙන් ඒ බව පැහැදිලි වේ.

අකාලික වූ උතුම් ශ්‍රී සද්ධර්මය අපේ ජීවිතයට සම්බන්ධ කර ගත්තේ නම් අපේ ජීවිතවල වැරදි අඩුපාඩු සකසාගෙන දුර්ලභව ලද මිනිසත් බවෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අපහසු නොවේ.

"ධම්ම චරේ සුචරිතං

නතං දුච්චරිතං චරේ

ධම්මචාරී සුඛං සේති

අස්මිං ලෝකේ පරම්හි ච"

සුචරිතයෙහි හැසිරෙන්න, දුශ්චරිතයෙහි වළකින්න. ධර්මානුකූලව ජීවත් වන්නා සුවසේ ජීවත් වෙයි. එබැවින් එම උතුම් අකාලික වූ ශ්‍රී සද්ධර්මය සුනාථ (අසන්න) , ධාරෙථ (සිතේ ධාරණය කරගන්න), චරාථ (ඒ අනුව හැසිරෙන්න) අද සමහර හිමිවරුන් වහන්සේලාත් , ගිහි උගතුනුත් බුදු දහම විද්‍යාවට සම කිරීමට පුරුදු වී සිටිති. එය ඉතා වැරදි ක්‍රියාවකි. විද්‍යාවෙන් අද සොයා ගන්නා දෙය හෙට තව විද්‍යාඥයෙක් වෙනස් විදියට සොයාගනු ඇත. වෙනස් අර්ථ කථනයක් දෙනු ඇත. නමුදු බුදු දහම අතීත, වර්තමාන , අනාගත යන කාලත්‍රයටම සමානය. චතුරාර්ය සත්‍ය, ත්‍රිලක්ෂණය, කර්මය, පුනර්භවය , මධ්‍යම ප්‍රතිපදාව, හේතුඵලවාදය බුදු හිමි එදා දේශනා කළද එය අදද කිසිදු වෙනසක් නැත. හෙටද එලෙසමය. එබැවින් ශ්‍රී සද්ධර්මය අකාලික යන වචනයෙන් පෙන්වා දී ඇත. අපද එම උතුම් ශ්‍රී සද්ධර්මය අනුගමනය කොට මෙලෝ ජීවිත සාර්ථක කොට ගැනීමත් පරලොව දුගතියට පත් නොවීමටත් එයාකාරයෙන් නොනැවති නුවණින් සැලකීමටත් සිතට ගත යුතුය.

කොළඹ ... පූජ්‍ය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ
**ආචාර්ය ගලගෙදර රතනවංශ හිමි**



"විමසිලිමත්ව බෞද්ධයින් ..."